
**LEO TOLSTOY**

# FATHER SERGIUS



# විරාග සංග්‍රාම

පරිවර්තනය

**ඩබ්ලියු. ඒ. අබේසිංහ**

ලියෝ තොල්ස්තෝයි

# විරාග සංග්‍රාම

"මේ මිනිහාගේ මහිමය, ඔහුගේ අධ්‍යාත්ම ශක්තිය, විස්මයජනකය. තවත් එවැනි කෙනෙකු නම් සිටිය නොහැක්කේය."

- මක්සිම් ගෝර්කි

## ඩබ්ලියු. ඒ. අබේසිංහගේ සෙසු පරිවර්තන කෘති

### සිංහල - නවකතා

01. අනුරාගයේ මුල් පොත (1987), නැවත මුද්‍රණ 1997, 2003, 2005, 2007, 2011, 2014, 2016, 2018
02. වේලාසන කොක්කු ඇවිත් (1990), නැවත මුද්‍රණ 1997, 2006, 2011, 2013, 2017, 2021
03. ස්වාමි සහ යහළුවෝ (1995), නැවත මුද්‍රණ 1997, 1999, 2003, 2010, 2014, 2018
04. තේ දල්ලේ කඳුළ (1998), නැවත මුද්‍රණ 2003, 2015
05. යුද්ධය සහ ප්‍රේමය (2000) නැවත මුද්‍රණ 2012, 2017
06. ලැබීම - නොලැබීම (2008), නැවත මුද්‍රණය 2017, 2024
07. විරාග සංග්‍රාම (2012), නැවත මුද්‍රණ 2017
08. සිද්ධාර්ථ (2014), නැවත මුද්‍රණ 2019, 2020
09. මැඩම් මාවෝ - (2019)
10. මුල් කවය - ප්‍රථම භාගය - (2019)
11. මුල් කවය - ද්විතීය භාගය - (2019)

### සිංහල - කෙටිකතා

12. පුංචි සොල්දාදුවා (1977)
13. සඳ පහන සහ වෙනත් කතා (1987), නැවත මුද්‍රණ 1996, 2011
14. කාබුලිවාලා සහ වෙනත් කතා (1987), නැවත මුද්‍රණ 1996, 2003, 2012

### සිංහල - කාව්‍ය

15. තුන්වැනි ලෝකයේ කවි සහ වෙනත් කවි (1986), නැවත මුද්‍රණ 1998, 2015
16. ආසියාවේ කවි (1993) නැවත මුද්‍රණය 2015
17. අභිගුණ්ටිකයෝ සහ වෙනත් කවි (2006), නැවත මුද්‍රණය 2017

### සිංහල - ගීත

18. ධම්මපද ගීතය (1997), නැවත මුද්‍රණ 2008, 2018

### චරිත කතා

19. මහත්මා ගාන්ධි (2007), නැවත මුද්‍රණ 2011, 2016
20. Gautama Buddha (2018)
21. Buddha Gotama
- (ඉංග්‍රීසි පරිවර්තනයේ රුසියානු පරිවර්තනය - (**2023**)

### ඉංග්‍රීසි - යෞවන සාහිත්‍යය

22. Children of the Mother Earth (1982)

ලියෝ තොල්ස්තෝයි

# විරාග සංග්‍රාම

**(Father Sergius)** නමින් ඉංග්‍රීසියට නැඟුණු
කෙටි නවකතාවේ සම්පූර්ණ සිංහල පරිවර්තනය

ඩබ්ලියු. ඒ. අබේසිංහ

**රුසියාව**
**ප්‍රකාශකයෝ**

# විරාග සංග්‍රාම

පළමුවැනි මුද්‍රණය - 2011
දෙවැනි මුද්‍රණය - 2017
තුන්වැනි මුද්‍රණය - 2024

ISBN 978-624-5578-43-6

© ඩබ්ලියු. ජ්. අබේසිංහ

**ප්‍රකාශනය**
රුසියාව ප්‍රකාශකයෝ
34බී, කනගරත්න පෙදෙස,
ලක්ෂපතිය, මොරටුව.
දුරකථන : 071 488 1182

**බෙදාහැරීම**
දුයිෂේන්ගේ පොත්හල
169, හයිලෙවල් පාර, නුගේගොඩ

**පරිගණක පිටු සැකසුම සහ
කවර නිර්මාණය**
ප්‍රමුදිත ග්‍රැෆික්ස්
මොරටුව.
076 815 2567

**පරිගණක අක්ෂර සංයෝජනය**
සුරම්‍යා සඳමාලි
සෙව්වන්දි ප්‍රියංකා ජයරත්න

**මුද්‍රණය**
නියෝ ග්‍රැෆික්ස් (පුද්.) සමාගම
නො. 44, උඩහමුල්ල දුම්රියපොල පාර,
ගංගොඩවිල, නුගේගොඩ.


# තුන්වැනි මුද්‍රණයට පෙරවදන

රුසියානු මහා ලේඛක ලියෝ තොල්ස්තෝයිගේ Father Sergius නමින් ඉංගිරිසියට නැගී තිබුණු මෙම කෙටි නවකතාව පරිවර්තනය කිරීම මවිසින් අරඹන ලද්දේ, එක්දහස් නවසිය අනූ ගණන්වල මැද භාගය තරම් වන ඈත කාලයකදීය. මා අත ගසා සිටි අනෙක් නිර්මාණාත්මක සහ ශාස්ත්‍රීය කටයුතු හේතුවෙන්, මෙම පරිවර්තනය කිහිප වතාවක්ම නවතා දමන්නට සිදු විය. කෙසේ වෙතත්, දැන් ඒ පරිවර්තනය අවසන් කොට, තොල්ස්තෝයි ගැන දීර්ඝ හැඳින්වීමක්ද ලියා ඇත්තෙමි.

මෙම පොතේ තුන්වැනි මුද්‍රණය ප්‍රකාශයට පත් කරන්නට ඉදිරිපත් වූ රුසියාව ප්‍රකාශන ආයතනයේ අධිපති සරත් ලාල් කුමාර මහතාටත්, අත්පිටපත පරිගණක ලේඛනය කළ සුරම්‍යා සඳමාලිට සහ සෙව්වන්දි ප්‍රියංකා ජයරත්නටත්, මගේ නොමඳ කෘතවේදිත්වය සටහන් කර තබමි.

- ඩබ්ලියු. ඒ. අබේසිංහ

35 - පන්නල පාර, කුලියාපිටිය



ලියෝ තොල්ස්තෝයි

1828 - 1910

# ලියෝ තොල්ස්තෝයි

**"මේ මිහිතලය මත ඔහු ජීවත්ව සිටින තාක් කල් මම අනාථයෙක් නොවෙමි."**
**- මක්සිම් ගෝර්කි**

ස්වකීය නිර්මාණ කෞශල්‍යයෙන්ද, අසමසම ප්‍රතිභාවෙන්ද, තමා විසින් නිර්මාණය කරන ලද මනුෂ්‍යත්වයේ අපරිමාණ සෞන්දර්යයෙන්ද සාහිත්‍ය ලෝකය ඇලලූ, අනාගත මානව ප්‍රජාව වෙත මහාර්ඝ සාහිත්‍ය දායාදයක් ප්‍රදානය කළ, මනුෂ්‍ය වර්ගයා වෙත සාමය, ආත්ම තෘප්තිය හා සැනසීම උදා වන කෘත යුගයක් එළඹෙන බැව් ස්වකීය ඉසිවර නුවණින් දුටු රුසියානු මහා ලේඛකයා, ලියෝ තොල්ස්තෝයි බැව් විවාදරහිත කාරණයකි. තොල්ස්තෝයි ගැන අතිශය භාවපූර්ණ, විශිෂ්ට නිබන්ධනයක් කළ මක්සිම් ගෝර්කි, මෙසේද පැවසීය.

"ඔහුගේ දෑත පුදුමාකාරය. ඉදිමුණු නහර වැල්වලින් යුතු ඒ දෑත කැතය. එහෙත් එහි වූයේ, විස්මයජනක වූ නිර්මාණාත්මක ප්‍රවාහයකි. ඇතැම් විට, ලියනාඩෝ ඩාවින්චිටද එවැනි දෑතක් තිබෙන්නට ඇත. ඔහුගේ දෑත්වලින් නොකළ හැකි කිසිවක් මිහිපිට නොවූයේය. ඔහු දෙවියකු වැනිය..... මේපල් ලීයෙන් තැනූ සිංහාසනයක් මත, රන්වන් දෙහි ගසක් යට වාඩි වී සිටින, එක විදියක රුසියානු දෙවියකු වැනිය....."

මක්සිම් ගෝර්කිගේ ඒ වචන, ලියෝ තොල්ස්තෝයි ගැන කතා කරන විට, අදටත් වලංගු වූ ඒවාය. සහෘද ජනතාව විසින් ලියෝ තොල්ස්තෝයි මෙකල්හි සලකනු ලබන්නේ දෙවියකු හැටියට නොවුවද, දෙවියන්ගේ නිර්මාණ ශක්තිය ඉක්මවා ලූ අනුත්තර ගණයේ මනුෂ්‍යයකු හා අසමසම කලාකරුවකු හැටියටය.

1828 සැප්තැම්බර මස 9 වැනි දින, මොස්කව් සිට සැතපුම් දෙසීයක් පමණ දකුණු දෙසින් පිහිටි ටූලා ප්‍රාන්ත රාජ්‍යයේ යස්නායා පොල්යානා මහා වතුයාය හිමි, රුසියාවේ පැරණි සිටු පවුලක උපත ලැබූ ලියෝ නිකොලයේවිච් තොල්ස්තෝයි, පවුලේ හතරවැනි පිරිමි දරුවා විය. ඔහුගේ පියා සිටුවරයකු වූ අතර, මව රජ පෙළපතට අයත් කුමාරිකාවක වූවාය. තොල්ස්තෝයි පවසන අන්දමට, රුසියන් බස සමඟ ප්‍රංස, ජර්මන්, ඉංග්‍රීසි හා ඉතාලි යන භාෂාද දැන සිටි ඇය, පියානෝ වාදනයෙහිද සමත් වූවාය. කතා ගොතා කීමෙහි අපූරු ශක්තියක්ද ඇයට තිබිණි. තොල්ස්තෝයි දෙවැනි වියෙහිදී මව මියගිය අතර, හත් වසකට පසු පියාද මියගියේය.

පියාගේ මරණයෙන් ඉක්බිතිව, නිකොලායි, සර්ජි, දිමිත්‍රි, නමැති සොහොයුරන් තිදෙනා සමඟ, තොල්ස්තෝයි කසාන් පළාතේ ආණ්ඩුකාරයාගේ බිරිඳ වූ පියාගේ නැගෙණිය වෙත ගෙනයන ලද්දේය. එතැන් සිට මාපියන් නැති මේ දරුවන් සිව්දෙනා හදාවඩාගන්නා ලද්දේ, ඔවුන්ගේ ඒ නැන්දණිය විසිනි.

ගුරුවරයකු ගෙදර නවතාගෙන ඔහු ලවා දරුවන්ට මූලික අධ්‍යාපනය ලබාදීම, එකල සිටු පවුල්වල පැවති සිරිත විය. මෙසේ ලබාගත් මූලික අධ්‍යාපනයෙන් ඉක්බිතිව, තොල්ස්තෝයි රාජතාන්ත්‍රිකයකු වීමේ අපේක්ෂාවෙන් අරාබි හා තුර්කි භාෂා හදාරනු සඳහා කසාන් විශ්වවිද්‍යාලයට ඇතුළු විය. ග්‍රීක සම්භාව්‍ය සාහිත්‍ය කෘතීන් කියවීමට ප්‍රමාණවත් තරම් ග්‍රීක භාෂා දැනුමක් තුන් මසකින් ලබාගත් හෙතෙම, අනතුරුව ඉංග්‍රීසි හා ඉතාලි භාෂාවන්ද පහසුවෙන් ප්‍රගුණ කෙළේය. එහෙයින් දිගු කලක් ගත වන සාම්ප්‍රදායික විශ්වවිද්‍යාල අධ්‍යාපනයෙන් විඩාපත් හෙතෙම, විශ්වවිද්‍යාලයෙන් ඉවත් වී, නීතිය හැදෑරීමේ අදහසින් සාන්ත පීටර්ස්බර්ග් විශ්වවිද්‍යාලයට ඇතුළු විය. එහෙත් නීතියත් සදාචාර විනිශ්චයත් අතර කිසිදු සබඳකමක් නොමැති බැව් පසක් කළ තොල්ස්තෝයි, නීතිය හැදෑරීමද අත්හැර දැම්මේය.

තොල්ස්තෝයි කිසිවෙකුට කිසිදු ගරුසරුවක් නොදක්වූ ආවේගශීලී අහංකාර පුද්ගලයකු වූ බව, ඔහු සමීපව ඇසුරු කළවුන් පවසා ඇත. රදල අභිමානය හිසට ගත් ඔහු, විශ්වවිද්‍යාලයේදී

අනෙක් සිසුන්ගෙන් ඈත් වී සිටියේය. පටු දෙවුරකින් යුතු කුඩා මිනිසකු වූ තොල්ස්තෝයිට, එතරම් සිත් ගන්නා කායික ස්වරූපයක් නොවීය. මේ අඩුව සපුරාගනු සඳහා මෙන්, ඔහු අලුත් පන්නයේ ඇඳුම් පැළඳුම්වලට පුරුදුව සිටියේය.

විශ්වවිද්‍යාල අධ්‍යාපනයෙන් අනතුරුව මොස්කව් නුවර පදිංචි වූ තරුණ තොල්ස්තෝයි, කෙළිලොල් ජීවිතයකට ඇබ්බැහි වූයේය. එවක ඉහළ සමාජය, ඔහුගේ ජන්මයටත්, උගත්කමටත්, ධනවත්කමටත් ගරු කෙළේය. එතෙකුදු, ඔහු ඇලුම් කෙළේ, සූදුවට, සුරාවට හා ස්ත්‍රී සේවනයටය. මෙම අසම්මත ජීවිතයෙන් විඩාපත් හෙතෙම, ඉන් පළායාම පිණිස යුද සේවයට බැඳී, එකල රුසියන් හමුදාවන්, කොකේසස් ප්‍රදේශයේ තුර්කි ගරිල්ලන් සමඟ කළ සටනට සහභාගි විය. අනතුරුව, 1859දී ඉංග්‍රීසි හා ප්‍රංස සේනාවන්ට විරුද්ධව ගෙන ගිය සටනේදී, තොල්ස්තෝයි කාලතුවක්කු සේනාංකයේ භටයකු ලෙස සේවය කෙළේය. යුද බිමෙහිදී වුව, ඔහු ලේඛන කටයුතු අත්නොහළේය. යුද පුවත් හා යුද භටයන්ගේ අත්දැකීම් විස්තර කෙරෙන 'යුද්ධය හා සාමය' මහා නවකතාව රචනයෙහිදී, යුද බිමෙහිදී ලැබූ අත්දැකීම් ඔහුට ප්‍රයෝජනවත් වන්නට ඇත.

යුද්ධය අවසානයේදී හමුදා සේවයෙන් විශ්‍රාම ගත් තොල්ස්තෝයි, විසිහත් වියෙහිදී, ප්‍රංසය, ස්විස්ටර්ලන්තය හා ජර්මනිය යන රටවල සංචාරය කෙළේය. මේ රටවල පවත්නා දේශපාලන, ආර්ථික හා මානව නිදහස දුටු ඔහුට, තම රටෙහි පවත්නා අත්තනෝමතික පාලනයත්, එම පාලනය යටතෙහි සමාජයෙහි හැම අංශයකම ඇති වන පරිහානියත්, මානව අයිතීන් අහිමිව පොදු ජනතාව ගත කරන වහල් ජීවිතයත්, මේ සියල්ලටම අනුබල දෙන ආගමත් ගැන මනා අවබෝධයක් ලබාගත හැකි විය. යටකී දේශ සංචාරයෙන් අනතුරුව, යස්නායා පොල්යානා වත්තෙහි පදිංචි වූ තොල්ස්තෝයි, සිය වතුයාය දියුණු පවුණු කරන අතරවාරයේ, සාහිත්‍ය කටයුතුවලද නිරතව සිටියේය.

එකල රුසියාවේ ඉඩම් හිමි රදළයන්ට සම කරන විට, තොල්ස්තෝයි ඉඳුරා වෙනස් රදලයෙක් විය. වත්තෙහි වාසය කළ ප්‍රවේණි දාසයන් සමඟ කුඹුරට බැස වැඩ කළ හෙතෙම, ඔවුන්ගේ

ශුභසිද්ධිය උදෙසා සේවය කළා පමණක් නොව, ඔවුන්ට නිදහස දීමටද ඉදිරිපත් විය. තම ස්වාමියාගේ ත්‍යාගශීලය ගැන සැක පහළ කළ ප්‍රවේණිදාසයෝ, ඒ නිදහස ප්‍රතික්ෂේප කළහ. ප්‍රවේණි දාසයන්ට නිදහස දීම වනාහි, එකල රුසියාවේ පැවති දැවෙන ප්‍රශ්නයක් වූ වග ප්‍රකට කාරණයකි.

වත්තේ ගොවියන්ගේ දරුවන්ට අධ්‍යාපනය ලබාදීම උදෙසා ක්‍රියාරම්භ කළ තොල්ස්තෝයි, දරුවන්ට අවශ්‍ය පාඩම් පොත් තෙමේම ලියා සම්පාදනය කෙළේය. මෙම පාසලේ අපූරු ගුරු ගෝල සම්බන්ධයක් පැවත්තේය. තොල්ස්තෝයි සිය ශිෂ්‍යයන්ට දරුවන්ට මෙන් සැලකූ අතර, ශිෂ්‍යයෝ තමන්ගේ ගුරුතුමාට මිත්‍රයකු මෙන් සැලකූහ. ශිෂ්‍යයින් කැමති නම්, පාසලට පැමිණිය හැකිය. නොකැමති නම්, නොපැමිණ සිටිය හැකිය. ගුරුතුමාට නොදන්වා පාසලෙන් පිටව යා හැකිය. කිසිදු දඬුවම් කිරීමක් නොවීය. කිසිදු විනය පද්ධතියක් හෝ නොවීය. දවස පුරා ශිෂ්‍යයන්ට උගන්වන තොල්ස්තෝයි, සවස ඔවුන් සමඟ සෙල්ලම් කෙළේය. ගී ගායනා කෙළේය. ඔවුන්ට කතාන්තර කියා දුන්නේය. රෑ බෝ වූ පසුව, ඔවුන් ගෙවල්වලට ගොස් ඇරලුවේය. ඒ වූකලී, ඉඩම් හිමි රදලයකු විසින් ස්වකීය වත්තේ දාසයන්ගේ දරුවන්ට අධ්‍යාපනය ලබාදීම සඳහා ආරම්භ කරන ලද පළමුවැනි පාසල විය. පාසල ගැන සැක පහළ කළ සාර් රජය, එය රටේ පවත්නා සම්මත අධ්‍යාපනයට පටහැණි බැවින්, පාසල වහාම වසා දමන ලෙස තොල්ස්තෝයිට නියෝග කෙළේය. අනතුරුව ඔහු, වැඩිහිටියන්ට අධ්‍යාපනයක් ලබා දීමේ අදහසින් පුවත්පතක් ආරම්භ කෙළේය. එම පළාතේ විනිශ්චයකාර ධුරයට පත් කරන ලද ඔහු, නඩුහබ විසඳීමේ කාර්යයෙහිද නිරත විණි.

තොල්ස්තෝයි දෙවැනි වතාවටද ජර්මනිය, ස්විස්ටර්ලන්තය, ප්‍රංසය හා එංගලන්තය ආදී රටවල සංචාරය කෙළේය. ලන්ඩන් නුවරදී, රුසියාවෙන් පිට වී සිටි විප්ලවවාදී ලේඛකයකු ලෙස ප්‍රසිද්ධියක් දැරූ ඇලෙක්සැන්ඩර් හර්සාන් හමු වුණු තොල්ස්තෝයි, රුසියාවේ තහනම් කරන ලද පොත්පත් පළ කිරීම පිණිස 'නිදහස් රුසියන් මුද්‍රණාලයක්' ආරම්භ කෙළේය. ඔහු රාජ්‍යවිරෝධී කුමන්ත්‍රණකරුවන් සමඟ සබඳකම් පවත්වන්නේ යැයි සැක කළ සාර් රජුගේ රහස් පොලිසිය, තොල්ස්තෝයි ගෙදර නැති

අතරවාරයේදී රාජ්‍යවිරෝධී ලිපි ලේඛන ඇද්දැයි සොයා බැලීම පිණිස ඔහුගේ නිවස සෝදිසි කෙළේය.

තොල්ස්තෝයි කලබලකාරී නාගරික ජීවිතයෙන් ඈත් වී, ස්වකීය ඉඩකඩම් පාලනය කරන අතර, සාහිත්‍ය හා සමාජ සේවා කටයුතුවල නිරත වනු දක්නා ලදී. කොතරම් කාර්ය බහුල ජීවිතයක් ගත කළද, ඔහුට මහත් පාළුවක් සමඟ තනිකමක්ද දැනිණි. මේ කාන්සිය මඟහැරගැනීම පිණිස, සාර් රජුගේ පෞද්ගලික වෛද්‍යවරයා වූ, ඔහු කලින් දැන හඳුනාගෙන සිටි දොස්තර බෙහර්ස්ගේ නිවසට යාමට පුරුදු විය. වෛද්‍යවරයාගේ රූමත් දියණියන් තිදෙන, ධනවත් කීර්තිමත් තරුණ සිටුවරයා ආදරයෙන් පිළිගෙන සංග්‍රහ කළහ. නොබෝ දිනෙකින්, තොල්ස්තෝයි සොහොයුරියන් තිදෙනා අතරින් වඩාත් රූමත් සෝනියා (සොෆියා) නම් දෙවැනි තරුණියට විවාහ යෝජනාවක් ඉදිරිපත් කෙළේය. සෝනියාද මහත් සතුටින් යෝජනාව පිළිගත්තාය. ඇගේ දෙමව්පියෝද එයට කැමති වූහ.

තමා ස්ත්‍රීන් සමඟ කළ ඇසුර පිළිබඳ සියලු තොරතුරු තම අනාගත බිරිඳට හෙළි නොකොට, ඇය විවාහ කරගැනීමට තමාට කිසිදු අයිතියක් නැතැයි කල්පනා කළ තොල්ස්තෝයි, සිය දිනපොත ඇයට කියවන්නට දුන්නේය. තොල්ස්තෝයි හැම කටයුත්තකදීම අවංක වූ අතර, අන්‍යයන්ගෙන්ද එම අවංකභාවය අපේක්ෂා කෙළේය.

දිනපොත කියවූ ළාබාල අහිංසක තරුණිය කම්පා වූවාය. මෙවන් සල්ලාලයකු සමඟ තමාට සැපවත් විවාහ ජීවිතයක් ගත කළ හැකිද යන කාරණය ඇයට ගැටලුවක් විය. මුළු රැයක් නිඳි නොලබා කඳුළු සලමින් කල්පනා කළ තරුණිය, අන්තිමේදී තමා දුන් පොරොන්දුව ප්‍රකාර, සිටුපුත්‍රයා සමඟ විවාහ වීමට තීරණය කළාය.

අලංකාර නාගරික ජීවිතයකට පුරුදුව සිටි තරුණ බිරිඳට, ගම් පියසක පිහිටි විශාල වත්තක ගොවියන් අතර ගත කරන ජීවිතයට පුරුදු වීමට කලක් ගත වන්නට ඇත. සංවේදී පුද්ගලයින් වූ මේ අඹුසැමි දෙදෙනා, ඇතැම් අවස්ථාවලදී කලහ කරගත්හ. එතෙකුදු වුවත්, ඔවුහු දුක සැප, කීර්ති ප්‍රශංසා පොදුවේ බෙදා හදාගනිමින්, සාමකාමී සන්සුන් සැපවත් ජීවිතයක් ගත කළහ.

සැමියා මෙන්ම සෝනියාද, දින සටහන් තැබීමට පුරුදු වූවාය. එම සටහන් එකිනෙකා විසින් කියවිය යුතුය යන එකඟත්වයක්ද ඔවුන් අතර පැවැත්තේය. එහෙයින් දෙදෙනාටම තම සිතුම් පැතුම් හැඳිනගැනීමට හැකි වූවා පමණක් නොව, එකිනෙකාගෙන් සඟවාගත යුතු රහසක්ද නොවීය.

විවාහයෙන් අනතුරුව එළඹි පළමුවැනි එකොළොස් වස තුළ, ඔවුන්ට දරුවන් අටදෙනෙකු ලැබුණු අතර, දෙවැනි අවුරුදු පහළොව තුළදී, තවත් දරුවන් පස්දෙනෙකු ලැබිණි. දරුවන් හදා වඩාගැනීම, ගේදොර පාලනය, නිතර සැමියා හමු වීමට එන සම්භාවනීය අමුත්තන් පිළිගෙන ඔවුන්ට සංග්‍රහ කිරීම, ඉඩකඩම් පාලනය, ගොවියන්ගේ දුක සැප සොයා බැලීම ආදී කටයුතුවල නිරත වන අතර, සෝනියා සැමියාගේ ලේඛන කටයුතුවලටද සහාය වූවාය.

මහත් වේගයෙන් ලියන තොල්ස්තෝයි, බොහෝ විට වචනයක් සම්පූර්ණයෙන් නොලියයි. වාක්‍යයක් සම්පූර්ණයෙන් අවසන් නොකරයි. ඔහුගේ අසම්පූර්ණ මුල් පිටපතෙහි අඩුවැඩි පිටපත් කරන ලද්දේ සෝනියා විසිනි. ඉනික්බිතිව, සැමියා විසින් ලියා ඇති දේ වෙනස් කරමින්ද, අලුතින් කරුණු එකතු කරමින්ද යළි යළිත් වෙනස් කරන ලද අත්පිටපත, ඈ යළිත් පිටපත් කරයි. ඔහුගේ අත් අකුරු කියවීමට හැකියාව තිබුණේ ඇයට පමණි. මෙසේ ඇය විසින් 'යුද්ධය හා සාමය' පමණක් හය වරක් පිටපත් කරන ලද බැව් සුපතළ කාරණයකි.

විවාහයෙන් අවුරුද්දකට පමණ පසුව, 'යුද්ධය හා සාමය' මහා නවකතාවේ වැඩ ආරම්භ කළ තොල්ස්තෝයි, එය අවසන් කිරීමට සත් වසක් පමණ දීර්ඝ කාලයක් ගත කෙළේය. මෙම නවකතාව ප්‍රකාශයට පත්වීම, ලෝකයේ නවකතා ඉතිහාසයේ ඉතා වැදගත් සිද්ධියක් ලෙස සලකනු ලැබූ අතර, නොබෝ කලෙකින්ම, එය යුරෝපා භාෂා රාශියකට පරිවර්තනය කරනු ලැබීය. මෙම නවකතාවට රුසියාවේ පමණක් නොව, යුරෝපයේ ප්‍රධාන පෙළේ ලේඛකයින්ගේ හා විචාරකයින්ගේ නොමඳ පැසසුම හිමි විය. මෙවන් නවකතාවක් මෙතෙක් ලියවී නැති බවත්, අනාගතයේදී වුව නොලියවෙන බවත්, ඇතැම් විචාරකයෝ ප්‍රකාශ කරන්ට වන්හ.

ඇතැමෙක් එය රුසියන් ජනතාවගේ වීරකාව්‍යය ලෙසද සලකන්ට පෙළඹුණාහ. යුද්ධය හා සාමය ඓතිහාසික නවකතාවක් පමණක් නොව, ඉතිහාසය පිළිබඳ තොල්ස්තෝයිගේ දර්ශනය ප්‍රකාශ කෙරෙන සම්භාව්‍ය කෘතියක් හැටියටද සම්භාවනාවට පාත්‍ර වූයේය.

## II

ලියෝ තොල්ස්තෝයිගේ ක්‍රියාකාරී සාහිත්‍ය ජීවිතය ඇරඹුණේ, දහනවවැනි ශතවර්ෂයේ මැද භාගයේදීය. ඔහු විසින් ලියන ලද මුල්ම කෙටි නවකතාවල පවා දක්නා ලැබෙන්නේ, ශ්‍රේෂ්ඨ යථාර්ථවාදී සම්ප්‍රදාය දියුණු පවුණු කළ සැටියකි. ඔහු විසින් මුලක් මැදක් සහ අගක් ඇති කෘත්‍රිම බටහිරදිග නවකතා සම්ප්‍රදාය බැහැර කළ අයුරු, ඔහුගේ මුල්ම ප්‍රබන්ධ ප්‍රයත්නය වන "ළදරු විය, ළමා විය, තරුණ විය" නමැති ආත්මකථන නවකතා ත්‍රිත්වයෙන් වුව පෙනී යයි.

එමගින් විකසිතභාවයට පැමිණි ලේඛකයාගේ අපූර්ව ප්‍රතිභාව "ක්‍රොයිස්ට සොනාටා","ඉවාන් ඉලියිච්ගේ මරණය", "පොලි කෘෂ්කා", "සර්ජියස් පියතුමා" වැනි කෙටි නවකතාවලද නොමඳව දැකිය හැකිය.

ලියෝ තොල්ස්තෝයි නිර්මාණය කරන මනුෂ්‍යත්වයේ විශ්වව්‍යාපී ගුණය, ඔහු කියන පණිවිඩයේ විශ්ව සාධාරණ අගය, යට සඳහන් කළ කෘතීන්ගෙන් පමණක් නොව, ඔහුගේ සියලුම සාහිත්‍ය නිර්මාණයන්ගෙන්ද ප්‍රකට වන්නේය.

තොල්ස්තෝයිගේ ප්‍රධානතම සාහිත්‍ය කෘතීන් අතර, "යුද්ධය හා සාමය", "ඇනා කැරනිනා" සහ "පුනර්ජීවනය" නමැති විශාල නවකතා තුන සඳහන් කළ හැකිය. තොල්ස්තෝයිගේ කලාත්මක පරිසමාප්තිය, ඇනා කැරනිනාහි වඩාත් ඔපවත්ව පෙනුණද, ඔහුගේ ශ්‍රේෂ්ඨත්වය මේ කෘතීන් තුනෙහිම ඉස්මතුව පෙනෙයි.

"යුද්ධය හා සාමයට" පසුබිම් වනුයේ, 1805 සිට 1820 දක්වා වන අවුරුදු පහළොවක කාලසීමාව තුළ ප්‍රංස හා රුසියානු ප්‍රභූජන පන්තියේ ජීවිතයයි. යුද්ධය පසුබිම් කොටගෙන ප්‍රභූජන පවුල් පහක ජීවිතයත්, එම සමාජය මානුෂික ප්‍රශ්නවලට මැදිව කරන අරගලයත් ලේඛකයා විසින් විවරණය කොට ඇත්තේ, ලෝකයේ පහළ වූ අග්‍රතම කලාකාරයාගේ රීතියෙනි. "ඇනා කැරනිනා" නවකතාවේ කලාත්මක පරිසමාප්තිය මෙන්ම, එමඟින් විවරණය කෙරෙන ජීවිතයේ යථාර්ථවත් සෞන්දර්යය විසින්, මෙම කෘතිය ගුස්ටාව් ප්ලෝබාගේ "එමා බොවාරි" නවකතා සම්ප්‍රදායේ අග්‍රතම ඵලයක් බවට පත්ව ඇත්තේය. සැබැවින්ම, යථාර්ථවාදී කතා රීතිය වඩාත් පරිසමාප්තියට ගෙන ආ ලේඛකයා ලියෝ තොල්ස්තෝයි බැව් අවිවාදිත කාරණයකි.

කලාව වූකලී ජීවිතයටත් වඩා සත්‍යයැයි ඇරිස්ටෝටල් කළ සුප්‍රකට ප්‍රකාශය, "ඇනා කැරනිනා", "පුනර්ජීවනය", "යුද්ධය හා සාමය" වැනි තොල්ස්තෝයිගේ නවකතා සම්බන්ධයෙන් නම්, සත්‍යයකැයි කිව යුතුය.

තොල්ස්තෝයි, ස්වකීය "වොස් ක්‍රෙස්නියේ" හෙවත් "පුනර්ජීවනය" නමැති විශාල නවකතාව ලියා පළ කෙළේ, 1899 වසරේදීය. කතුවරයාගේ චරිතයේ කිසියම් පෙදෙසක්ද විවරණය වෙතැයි සාහිත්‍යවේදීන් විසින් සලකනු ලබන මෙම නවකතාවේ කතානායකයා වනුයේ, දිමිත්‍රි නෙක්ලියුඩෝෆ් නමැති වංසවත් තරුණයෙකි. නවකතාවේ එන මෙම විරල ගණයේ තරුණයා, විවිධ මාදිලියේ හිරකාරයන් පිළිබඳ කරුණු හදාරා, ඒ ඊනියා අපරාධකාරයින් කොටස් පහකට බෙදා දක්වීය.

පළමුවැනි පිරිස, අධිකරණයේ අත්වැරදීම් හෝ නොසැලකිල්ල නිසා හිරේට නියමවූවන්ය. දෙවැනි පිරිස, වැරදිකරුවන් බවට පත් කරනු ලැබ ඇත්තේ, රාගාධිකම, දරුණු කෝපය, ඊර්ෂ්‍යාව, බීමත්කම වැනි විශේෂ අවස්ථාවන් යටතේ කරන ලද වැරදි නිසාවෙනි. තුන්වැනි පිරිස දඬුවම් ලබා සිටින්නේ, ඔවුන්ගේ අදහසට අනුව ස්වභාවික යයිද, ඇතැම් විට යහපත් යයිද, පෙනී ගිය ක්‍රියාවන් හේතුවෙනි. සිව්වැනි පිරිස සිරභාරයේ තබාගෙන ඇත්තේ, ඔවුන් චරිතයෙන් - විද්වත්භාවයෙන් - සත්පුරුෂ හැඟීමෙන් - කුසලාකුසල විඥානයෙන් - සමාජයේ සාමාන්‍ය

මට්ටමට වඩා ඉහළින් සිටින නිසාය. පස්වැනි පිරිස වූයේ, තමන් සමාජයට කළැයි කියන වරදට වඩා, සමාජය විසින් තමන්ට වැරදි කරනු ලැබුවාවූ පිරිසකි.

තොල්ස්තෝයිගේ ශ්‍රේෂ්ඨත්වය, ඔහුගේ දිග හා කෙටි නවකතාවල පමණක් නොව, ඔහු විසින් රචිත විශාල ප්‍රමාණයක කෙටිකතාවලද දැක්ක හැකිය. "බාල් නැටුමෙන් පසු" වැනි ඇතැම් කෙටිකතාවක් යථාර්ථ රීතියේ පරිසමාප්ත ආදර්ශ කෘතියක් වන අතර, "මිනිසකුට කොතරම් ඉඩම් අවශ්‍යද?" වැනි කෙටිකතාවක්, පංචතන්ත්‍රය, හිතෝපදේශය වැනි ශ්‍රේෂ්ඨතම පෙරදිග උපමා කෘතීන්හි මෙන්ම, බෞද්ධ ජාතක කතාවේද අනෙක් ස්වරූපයක පුනර්ජීවනයක් යැයි කිව යුතු තරමය. මේ ලක්ෂණ දෙකම තොල්ස්තෝයිගේ කෙටිකතා කලාවේ දක්නා ලැබෙයි. පුරෝගාමී රුසියන් ප්‍රබන්ධකරු වූ ඇලෙක්සැන්දර් පුෂ්කින්ගේ කතා සම්ප්‍රදායෙහි මල්පල ගැන්වුණු අවස්ථාව, තොල්ස්තෝයි විසින් පරිසමාප්තියට පත් කරන ලද කෙටිකතාව වන්නේය.

තොල්ස්තෝයි විසින් නාට්‍ය කිහිපයක් මෙන්ම, බුද්ධිවිෂයක නිබන්ධන කිහිපයක්ද රචනා කරන ලද්දේය. ඇතැම් නිබන්ධයක්, එසමයෙහි රුසියානු ලේඛකයන් සහ විචාරකයන් අතර උග්‍ර මතභේදයකටද තුඩු දුන්නේය.

තොල්ස්තෝයි ලියූ සෙසු නිබන්ධ අතර වඩාත්ම විවාදාපන්න වූයේ, "මගේ පාපෝච්චාරණ" නමැති කෘතියයි.

විජිගීෂාව, බලකාමය, ධන තෘෂ්ණාව, සල්ලාලකම, මානාධිකත්වය, කෝපය, පළිගැනීමේ චේතනාව ආදී කාරණාවලට යටපත් වූ තමාගේ තරුණ විය ගැන සඳහන් කරමින්, එක්තරා උද්වේගකර අවස්ථාවකදී, තොල්ස්තෝයි මෙසේ ලියුවේය.

"මට ඒ කාලය මතක් වෙන විටත්, බිය දැනෙයි. පිළිකුලක් ඇති වෙයි.

"මම යුද්ධයේදී මිනිසුන් මරණයට පත් කෙළෙමි. ද්වන්ධ සටන්වලදී ප්‍රතිමල්ලවයන් මැරුවෙමි. දූ කෙළියේදී පැරදුණෙමි. දුප්පත් ගොවීන් සිය දහදියෙන් මට උපයා දුන් වස්තුව විනාශ කෙළෙමි. ඒ ප්‍රවේණි ගොවීන්ටම, කුරිරු ලෙස දඬුවම් කෙළෙමි.

පහත් චරිත ඇති ගැහැනුන් සමඟ දබර කරගත්තෙමි. මිනිසුන්ට වංචා කෙළෙමි. මුසාවාදය, මංකොල්ලය, පරස්ත්‍රී සේවනය, බේබදුකම, ප්‍රචණ්ඩත්වය, මිනීමරුම .... මා නොකළ අපරාධයක් ඇත්තේ නැත. ඒ වුණත්, සමානයින් විසින් මා සලකන ලද්දේ, යහපත් චරිතයක් ඇති මිනිහකු හැටියටය....."

තමන්ගේ ජීවිතය මුනිවරයකු සේම, මෙතරම් හෙළිදරව් කළ අනෙක් ලේඛකයෙක්, ලෝක සාහිත්‍යයෙහි හමු වන්නේ නොවෙයි.

## III

පල්ලියත්, සාර් පාලනයත්, කුලාක්වරුනුත් සමඟ ගැටුණු මහා ලේඛකයා, ඔවුන් සතු ඉඩම් ගොවීන්ට හා ප්‍රවේණිදාසයින්ට බෙදා දෙන්නැයි කියා සිටියේය. අන්තිමේදී ආගමෙන් පිටමං කෙරුණු තොල්ස්තෝයි, සාර් පාලනයේද උදහසයට ලක් වුණේය.

ලියෝ තොල්ස්තෝයි සාහිත්‍යකරණයට අමතරව තව බොහෝ දේවල් කෙළේය; බොහෝ දේවල් ලියා තැබුවේය.

මහා ලේඛකයා විසින් ස්වකීය අනුපම ප්‍රතිභා මහිමයෙන් නිර්මාණය කොට අප හමුවට ගෙනෙන ලද, පණ ගැහෙන චරිත සමුදාය අතර, පාඨකයාගේ ආදරයටත්, ඊටත් වඩා ගෞරවයටත් පාත්‍ර වන මිනිහෙක් සිටියි. හේ තෙමේ, කලින්ද සඳහන් කරන ලද "යුද්ධය හා සාමය" නමැති මහ විසාල නවකතාවෙහි එන ඇන්ඩ්‍රි බොල්කොන්ස්කි කුමරුය. ව්‍යාජ වූද, වංචාකාරී වූද, නොගැඹුරු වූද, සියලු දේවල් බැහැර කළ භද්‍ර යෞවනයෙහි සිටි ඇන්ඩ්‍රි, හමුදාවට බැඳෙන්නේත්, සටන් කරන්නේත්, සටනින් තුවාල ලබන්නේත්, අන්තිමේදී මිය යන්නේත්, උදාර චරිතයකින් හෙබි අභිමානවත් මිනිහකු හැටියටය. එකී උදාරත්වයත්, අභිමානයත් නිසාම, ඔහුට මහ බලැති නැපෝලියන් පෙනෙන්නේ, ඉතා අල්ප මිනිහකු හැටියටය; තමා ගැන වූ බලවත් මාන්නයකින් දූපුණු අකාර්යක්ෂම විගඩම්කාරයකු හැටියටය.

රුසියවේ ඉහළම වංශාධිපති රදල පවුලකට සම්බන්ධ මවකගේ කුසින් මෙලොවට බිහි වූ ලියෝ නිකොලයේවිච් කවුන්ට් තොල්ස්තෝයිට, සිය මවගෙන් උරුම වූ යස්නායා පොල්යානා නමැති රමණීය ගමෙහි අක්කර හත්සියයකින් යුතු ඉඩමක් තිබුණු බැව් කලින් කියන ලදී. තවත් වතු පිටි බොහෝ තිබුණේය. ඒ වස්තු සම්භාරය ඔහුට හිමි වූයේ උපතින් ලැබුණු උරුමයක් හැටියටය.

තමන්ගේ ඉඩම්වල ජීවත් වූ සිය ගණනක් වන ප්‍රවේණිදාස පවුල්වල ජීවන තත්වය උසස් කරලීමත්, විශේෂයෙන්ම, ප්‍රවේණිදාස දරුවන්ට අධ්‍යාපනය ලබාදීමත් තමන්ගේ යුතුකම බැව් තොල්ස්තෝයි කල්පනා කෙළේය. ඔහු ඒ දරුවන් උදෙසා පාසලක් හදා, ඔවුන්ට අධ්‍යාපනය ලබා දුන්නේ එහෙයිනි.

තොල්ස්තෝයි කියන්නේ, සාහිත්‍යකරණයට වඩා සමාජය උදෙසා - මනුෂ්‍ය වර්ගයා උදෙසා - තව බොහෝ දේවල් කළ මිනිහකු බව එකී කරුණුවලින් නොපෙනේද?

"මේ පොත් අයිති මට නොවේ; කියවන ජනතාවටය."

ඒ සිතිවිල්ලෙන් මෙහෙයවුණු හෙතෙම, තමාගේ පොත්වල අයිතිය අතහැර දැම්මේ, සිය බිරිඳ සෝනියාගෙන්ද දරුවන්ගෙන්ද මතු වුණු බලවත් විරෝධතා මධ්‍යයේය.

දුර්ලභ මාණික්‍ය දීප්තියෙන් බබළන මහා සාහිත්‍ය නිර්මාණයන් කළ ලියෝ තොල්ස්තෝයි, තමා ජීවත් වූ මහා රුසියානු සමාජයේ යහපත උදෙසා - අනාගත අභිවෘද්ධිය උදෙසා - ප්‍රබල මතවාදයක් ගෙන ගියේය. සාර්ද, රජ පවුලද, රදලයන්ද, කුලාක්වරුන් හෙවත් ධනවත් ගොවීන්ද, පල්ලියද සතු විශාල ඉඩම් ප්‍රමාණය දුප්පතුන්ට බෙදා දියයුතු යයි, ඔහු කියා සිටියේ එහෙයිනි.

මේ මහා ලේඛක වංශාධිපතියා, දුක් විඳින ජනතාව මධ්‍යයට බැස්සේ, ශාස්තෘවරයකු බඳු සමාජ සංස්කාරකවරයකු හැටියටය. 1891දී මුළු රුසියාවම දරුණු සාගතයක ග්‍රහණයෙන් වෙලී යද්දී, ඒ සාගතය දහස් ගණන් ගොවි ජීවිත බිලි ගනිද්දී, ඔහු ජනතාව අතරට බැස, සහන සේවයේ නියැලුණේය. ඔහුගේ ඉල්ලීම මත යුරෝපයේ නොයෙක් රටවලින් රුසියාවට ආධාර ගලා ආවේය.

ලියෝ තොල්ස්තෝයි නමැති "හෘදයසාක්ෂියේ සාන්තුවරයා" සමාජ ප්‍රශ්න ගැන බරපතළ ලෙස ගැඹුරට කල්පනා කරන්නට වූයේය. ආත්මගවේසී ලෙස තමා දෙසද ලොව දෙසද බැලූ මහා ලේඛකයා, සමාජයේ දුකට පීඩාවට හේතු යුක්තීන්ද ගවේෂණය කෙළේය. ඔහුගේ ආගමික සහ සමාජ මතවාදය ප්‍රකාශ වන්නේ මෙතැන්හිදීය.

කලින්ද සඳහන් කළ පරිදි, සාර් ආණ්ඩුවත්, පල්ලියත්, ධනපති පන්තියත් හා ගැටෙන්නට ඔහුට සිදු විය. හැම අපරාධයකටම, හැම අසහනයකටම, සමාජයේ හැම අසාධාරණයකටම හේතුව, වස්තුකාමය බව ඔහු කියා සිටියේය. රජයත්, පල්ලියත්, රදළ පන්තියත්, ඒ අසීමිත ධනතෘෂ්ණාව අතහැර, ජනතාවට සිය ඉඩම් බෙදා දිය යුතුය. කිසිදු පන්ති භේදයකින් තොරව, සියලු මිනිසුන්ගේ අවශ්‍යතාවන් සමානය. සියලුදෙනාම දෙවියන්වහන්සේගේ දරුවෝ වෙති. මේ හෙයින්, කිසිවකු වහල් සේවයේ යොදාගත යුතු නැත.

දිළින්දන්ගේ දුක නැති කිරීම රජයේ යුතුකම වෙයි. ඔවුනට සහන සැලසීමට රජය බැඳී සිටියි. රටේ සාගත ඇති වන්නේ, රජයේ වරදිනි. එවිට රජයට විරුද්ධව නැඟී සිටින්ට ජනතාවට අයිතියක් ඇත්තේය.

එහෙත් මේ නැඟී සිටීම කළ යුත්තේ, හිංසනයෙන් තොර වූ අහිංසා මාර්ගයකින් බව, ඔහු තරයේම කියා සිටියේය.

අධම, දූෂිත, කාලකණ්ණි, අකාර්යක්ෂම ජන පීඩක රජයකට විරුද්ධව, අහිංසාවාදීව ඉතා ප්‍රබල ලෙස නැඟී සිටින ආකාරය මුල්ම වරට ලොවටම කියා දුන් ලියෝ තොල්ස්තෝයි, ඒ සඳහා ජනතාව විසින් ගත යුතු ක්‍රියා මාර්ගයද ඉතා නිරවුල් ලෙසම පෙන්වා දුන්නේය.

රජයට අකීකරුවීම, රජයේ අණපනත් ප්‍රතික්ෂේප කිරීම, රජයට බදු නොගෙවීම, යුදහමුදා සේවය ප්‍රතික්ෂේප කිරීම යන මේ ක්‍රියාමාර්ග, අහිංසාවාදීව, ආණ්ඩුවකට විරුද්ධව නැඟී සිටීමේ සාර්ථක පිළිවෙල බැව්, ඔහු ලොව හමුවේ හෙළි කෙළේය.

ලියෝ තොල්ස්තෝයිගේ සාහිත්‍ය නිර්මාණාත්මක හා සමාජ සංස්කාරක කාර්යභාරය, මේ මිහිපිට මිනිස් දැතින් කළ නොහෙන

තරමේ විස්මයජනක අපූර්වතර කාර්යභාරයක් විය. එය කළ හැකි වූයේ, ගෝර්කි කියූ ආකාරයටම, "එක විදියක රුසියානු දෙවියකු" විසින්ම පමණි. එතෙකුදු වුවත්, සත්‍යයේ සාන්තුවරයා වූ මේ අරුම පුදුම මිනිහා, තමා ගැන දිනපොතේ ලියා තැබුවේ මෙයාකාරයෙනි.

"ලියෝ තොල්ස්තෝයි, නුඹ ජීවත් වන්නේ නුඹේ ධර්මයට අනුවද?"

එයට ලැබුණු කටුක උත්තරය මෙයයි.

"නැත. මට ලැජ්ජාව දරාගන්නට බැරිය. මම වැරදිකාරයෙක්මි. මම ගර්හාවට ලක් විය යුතු මිනිහෙක්මි...."

මනුෂ්‍ය වර්ගයාට යුද්ධය හා සාමය, ඇනා කැරනිනා, පුනර්ජීවනය වැනි මහ පොත් ඇතුළු මහරු සාහිත්‍ය ධනයක්, ප්‍රදානය කළ, හෙක්ටයාර් දහස් ගණනක ඉඩකඩම් තම දරුවන්ටවත් නොදී, ගොවි ජනතාවටත් ප්‍රවේණිදාසයින්ටත් බෙදා දුන්, ලෝක සාහිත්‍යයේ මහා ඉසිවරයා, තමා ගැනම කළ විනිශ්චය එබඳු වෙයි.

ජීවිතයේ අග්‍ර ඵලය ගැන ඔහු තුළ මොන තරම් බලාපොරොත්තු තිබෙන්නට ඇද්දැයි, ඒ දිනපොතේ සටහන් මොනවට ප්‍රකාශ කර සිටියි. සැබැවින්ම, ලියෝ තොල්ස්තෝයි වැනි විවාදයට භාජනය වූ අනෙක් රුසියානු ලේඛකයකු නැති තරම්ය.

එතෙකුදු වුවත්, තොල්ස්තෝයි විසින් නිර්මාණය කරන ලද මනුෂ්‍යත්වය අපූර්ව විය; සුන්දර විය. එසේම, ඔහු විසින් තත්කාලීන සමාජය පිළිබඳව කරන ලද විවරණ යථාර්ථවත් විය. සැබැවින්ම, විප්ලවපූර්ව සමාජයේ සියලු ප්‍රතිවිරෝධතා සියුම් ලෙස විවරණය කළ ශූර රුසියානු කලාකරුවා, ලියෝ තොල්ස්තෝයි වූයේය. තොල්ස්තෝයිගේ යුගය පිළිබඳ විවේචනයක් කළ ලෙනින්, "තොල්ස්තෝයිගේ කෘතීන්හි නිරූපිත ජීවිතයේ ප්‍රතිවිරෝධතා, තත්කාලීන සමාජය තුළම වූ ප්‍රතිවිරෝධතා වෙතැ"යි කියා සිටියේ එහෙයිනි.

එකී සමාජයේ ජීවිතය විවරණය කළ තොල්ස්තෝයි, ඒ තුළින් ඔක්තෝබර විප්ලවය දක්වාත්, එතැන් සිට ඉන් ඉදිරියටත්, බලසම්පන්න ප්‍රවාහයක් සේ ගලා යන මනුෂ්‍යත්වයේ අපරිමාණ

බලවේගය හෙවත් ධී ශක්තිය, ස්වකීය ඉසිවර නුවණින් දුටුවේය. ලෙනින් කියූ පරිදි, ලියෝ තොල්ස්තෝයි විප්ලවයේ කැඩපත වූයේ, ඒ අරුතිනි.

ලියෝ තොල්ස්තෝයිගේ ශ්‍රේෂ්ඨ සාහිත්‍ය කෘතීන් මෙන්ම, ඔහුගේ සාධුවර දර්ශනයත්, මනාව බන්ධුත්වය පිළිබඳව ඔහුගේ සනාතන පණිවිඩයත්, අනන්ත සාගරය මැද හමු වන නිල්වන් දිවයිනක් මෙන්ද, මහා වාලුකා කතරක් මැද හමු වන ක්ෂේමභූමියක් මෙන්ද, ඝනාන්ධකාරයේ නැඟි ප්‍රදීපයක් මෙන්ද, මානව ප්‍රජාවට ප්‍රසාදය එළවන කාරණයක් බවට පත්ව ඇත්තේය.

# IV

ලියෝ තොල්ස්තෝයිගේ ජීවිතය අළලා ප්‍රංස බසින් අතිවිශාල කෘතියක් ලියූ හෙන්රි ට්‍රෝෂාර්ට් නමැති රුසියානු ජාතික කතුවරයා පවසන ආකාරයට, ලියෝ තොල්ස්තෝයි, "සර්ජියස්" පියතුමා නමැති කෙටි නවකතාව ලියනු සඳහා, සටහන් ලියන්ට පටන්ගෙන ඇත්තේ, 1891 වසන්තයේදී හෝ ගිම්හානයේදීය. එසමය තොල්ස්තෝයි නිවස අමුත්තන්ගෙන් පිරී ගිය අවධියක් වූ බවද ට්‍රෝෂාර්ට් පවසයි. සර්ජියස් පියතුමා (Father Sergey) පිළිබඳ නවකතාව සිත්හි පිළිසිඳුණු එම අවධිය, තොල්ස්තෝයිගේ ජීවිතයේ විශේෂ කාලයක්ද විය. මන්ද යත්, ඔහු "දෙවියන්ගේ රාජධානිය ඔබ තුළම ඇත" වැනි ආගමික ලියවිලි ලියමින් සිටි අවධියද, එයම වූ බැවිනි.

කෙසේවතුදු, මෙම කුඩා නවකතාව ලියා අවසන් කර ඇත්තේ, 1897 හෝ 1898 වසරේදී බැව් පෙනී යයි. ඒ වන විට තොල්ස්තෝයි නිරතව සිටියේ, ස්වකීය දීර්ඝ නවකතාවක් වන "පුනර්ජීවනය" ලියමිනි. ඔහු එම කෘතිය ලිවීම මඳකට නවතා, "සර්ජි පියතුමා" නමැති නවකතාව ලියා අවසන් කෙළේය. එසේද වුව, මෙම නවකතාව ඔහු ධරමාන සමයේදී ප්‍රකාශයට පත් කෙරුණේ නැත. එය පළ වන්නේ, ඔහුගේ මරණයෙන් පසුවය.

පුනර්ජීවනයේ කටයුතු නවතා දමා, ඉක්මනින් ලියා අවසන් කළ මෙම නවකතාව පළ කිරීම ගැන තීරණයක් නොගැනීමට තොල්ස්තෝයි පෙලඹ වූ හේතු මොනවාද යන කරුණද, ට්‍රෝෂාර්ට් හෙළි කොට කියයි.

"ක්‍රොයිස්ට සොනාටා" නවකතාවේත්, "මා විශ්වාස කරන්නේ කුමක්ද?" යන ලේඛනයේත්, කරුණු ගළපමින් ලියන ලද මෙම නවකතාව, ප්‍රකාශයට පත් කරන්නට හිත හදාගැනීමට ඔහු සමත් වූයේ නැත. එයට හේතු දක්වමින් කරුණු හෙළි කරන ට්‍රෝෂාර්ට්ගේ වදන් අතිශයින්ම සිත්ගන්නාසුළුය. එසේම එකරුණ, තොල්ස්තෝයිගේ ජීවිතයේ පැතිකඩක් අනාවරණය කරන්නේද වෙයි.

"එය දරුණුය, අවුල් සහගතය, කුපිත කරවනසුලුය. එය මූඪ වෙතැයිද, උද්වේග බහුල වෙතැයිද කියන්නට ඉඩ ඇත. එහෙත්, එකරුණුම අතික්‍රමණය කෙරෙමින්, මෙම කතාව ශ්‍රේෂ්ඨත්වයට පත් වන්නේය. තමා තුළ වේගයෙන් වර්ධනය වන ආශාවන් මර්දනය කරනු උදෙසා, ඇඟිල්ලක් කපා දැමීමට තොල්ස්තෝයිම වුණත් පෙලඹුණු අවස්ථා කොතෙක් වීද? තමා කෙරෙහි ආරෝපණය කරන ලද, බර දැරිය නොහෙන, දේවධර්මදූතභාවයෙන් මිදෙනු උදෙසා, සියල්ල අතහැර නිවසින් පළා ගොස්, මුනික්වරයකු හැටියට ජීවත්වීමට ඔහු කොතෙක් නම් සිහින දක්කේද? සර්ජි පියතුමාත් ලියෝ පියතුමාත්* අතර ඇති පරතරය කඩදාසියක ගනකම පමණි.


"සර්ජි පියතුමා නවකතාව ලියා අවසන් කළ පසුව, තොල්ස්තෝයි දිගටම "පුනර්ජීවනය" ලියා අවසන් කෙළේය.

"පුනර්ජීවනයේත් සර්ජි පියතුමාගේත් අවසානය, පුදුමාකාර විලාසයෙන් එක සමානය. තමා බලාපොරොත්තු වන්නේ තමාගේ අවසානයද එපරිදිම විය යුතු බැව්, ඔහු සිය දින සටහන්වල ලියා තැබීය. ඒ කියන්නේ, සමාජ ජීවිතය අභිනිෂ්ක්‍රමණය කොට, පහළම තත්ත්වයේ ජනතාව සමඟ සම්මිශ්‍රණය වී, ඒ ජන සාගරය මැද අතරමංව මැකී යාමය."**

---

* ලියෝ තොල්ස්තෝයි

** Tolstoy - Henri Troyat (නැන්සි ඇම්ෆොක්ස්ගේ ඉංග්‍රීසි පරිවර්තනය) Grove Press - New York pp.493, 540, 549.



# විරාග සංග්‍රාම

## I

ස්වකීය අණදෙන නිල ධ්‍යානාන්තරයට පත්ව, අධිරාජයා යටතෙහි දීප්තිමත් අනාගතයක් හිමි කරගනිතැයි කවුරුත් බලාපොරොත්තුව සිටි, අධිරාජිනියගේ විශේෂ ප්‍රසාදයට ලක් වුණු ඇගේ පරිවාර සේවයේ කුලාංගනාවක වන රූමත් තරුණියක හා එළඹෙන මාසයේදී විවාහ වීමට කටයුතු සූදානම් කරගෙන සිටි, රාජ්‍ය හට කණ්ඩායමේ කුවිරේසියර් රෙජිමේන්තුවේ අණදෙන නිලධාරියෙකු වූ කඩවසම් කුමාරයකු, තමන් සතුව තිබුණු සැලකිය යුතු ප්‍රමාණයක ඉඩකඩම් සියල්ල සිය සහෝදරිය නමට පවරා දී, ප්‍රව්‍රජිතයකු වීම සඳහා ආශ්‍රමයකට ගියහයි කියන පුවතින්, හතළිස් ගණන්වලදී මුළු මහත් ශාන්ත පීටර්ස්බර්ග් නගරයම මවිතයට පත් විය. එයට තුඩුදුන් හේතු සාධක මොනවාදැයි නොදැන සිටි ජනතාවට, මෙය වටහාගත නොහෙන අසාමාන්‍ය සිද්ධියක් විය. එතෙකුදු, ස්තෙෆාන් කාසාත්ස්කි කුමාරයාට නම්, එය කොතරම් ස්වභාවික සාමාන්‍ය තීරණයක් වූයේද යත්, ගත හැකිව තිබුණු අනෙක් ක්‍රියාමාර්ගයක් ගැන ඔහු සිත්හි මඳ සාංකාවකුදු හටගත්තේ නැත.

ඔහුගේ පියා රාජකීය ආරක්ෂක සේවාවේ විශ්‍රාමලත් කර්නල්වරයකුව සිටියේය. පියා මිය යන විට, ස්තෙෆාන්ගේ වයස යාන්තම් අවුරුදු දොළහක් විය. සිය පුතණුවන් නිවසින් ඈත් කර තබන්ට මෑණියන් කොතෙක් අකමැතිව සිටියද, මියගිය සැමියාගේ විධානයට කීකරු වන්ට ඇයට සිදු වූයේය. ඔහු කියා තිබුණේ, යම් හෙයකින් තමා මියගියහොත්, තම පුතු නිවසේ රඳවාගන්නේ නැතිව, කැඩේට් භට හමුදාවට ඇතුළත් කළ යුතු බවය. එසේ හෙයින් ඕ, පුතු කැඩේට් බලකායට බැඳෙන්නට යවා, දියණිය වන වාර්වරාද කැටුව ශාන්ත පීටර්ස්බර්ග් නගරයේ පදිංචියට ගියාය. ඒ අන් කිසිවක් නිසා නොව, සිය පුතණුවන් සමීපයේ ජීවත් වනු සඳහාත්, නිවාඩු දිනවලදී ඔහු නිවසේ රඳවා තබාගනු සඳහාත්ය.

සුවිශේෂ වූ දක්ෂතාවන්ද අප්‍රමාණ වූ අභිමානයද හේතුවෙන් කැපී පෙනුණු තරුණයා, තමා තුළ විශේෂ කුසලතාවක් පැවති ගණිතයද ඇතුළු අධ්‍යාපන කටයුතුවලින් මෙන්ම, අශ්වයින් විහිදුවීම සහ සෙසු යුද්ධ ශිල්පයෙන්ද, පංතියේ ඉදිරියටම පැමිණ සිටියේය. මනාව වැඩුණු සිරුරකින් හෙබි හෙතෙම, අස්වාභාවික පරිද්දෙන් පාංශු දේහධාරී වුවද, ඉතා කඩවසම් වූයේය. හදිසි කෝපය නොවේ නම්, චර්යාව අතින් වඩාත්ම ආදර්ශමත් කැඩේට්වරයා විය හැකිව සිටියේ ඔහුය. මත්පැනට හෝ සල්ලාලකමට හෝ ලොල් නොවුණු හෙතෙම, පුදුම හිතෙන ආකාරයෙන් සත්‍යවාදීද වූයේය. ඔහුගේ එකම දුබලතාව වූයේ, හදිසි කෝපයයි. මේ හදිසි කෝපය හේතුකොටගෙන ආත්ම දමනය සිඳී යෙන ඇතැම් මොහොතක, ඔහු වියරුහුණු සතකු බවට පත් වෙයි. එක් අවස්ථාවකදී ස්වකීය බනිජ දියර සම්බන්ධයෙන් විහිළුවක් කළ කැඩේට් මිත්‍රයකු ජනේලයෙන් එළියට වීසි නොකළා පමණි. තවත් වතාවක ලජ්ජාවෙන් තොරව බොරු කී ස්ටුවර්ඩ්වරයකුට පහර දුන් හෙතෙම, කට්ලට් පිඟානකින් ඔහුගේ මුහුණට දමා ගැසුවේය. ඉතා බරපතළ ව්‍යසනයක් වැළකුණේ යාන්තමිනි. කණ්ඩායම් භාර අධ්‍යක්ෂවරයා සිද්ධිය ගසා වසා නොදමන්ට, කසාත්ස්කි නිලයෙන් පහළ දමන්නටද ඉඩ තිබුණි.

වයස අවුරුදු දහඅටේදී ඔහු කොමිෂන් ලැබුවේ, රදලයින්ට වෙන් වුණු ආරක්ෂක රෙජිමේන්තුවකදීය. කසාත්ස්කි භට කණ්ඩායමේ සිටියදී, මෙකී තරුණයාගේ ක්‍රියාශීලිත්වය දුටු

නිකොලායි පව්ලොවිච් අධිරාජයා, ඔහු ගැන තම සිත්හි එය සනිටුහන් කරගත්තේය. එසේ හෙයින්, හෙතෙම රාජකීය සේනාපති සහකාර නිලයකට පත් වෙතැයි සාමාන්‍ය පිළිගැනීමක් පැවැත්තේය. කසාත්ස්කි එයට ආශාද කෙළේය. ඒ, ඉහළ නැගෙන ආශාව නිසාම නොවෙයි. ප්‍රධාන වශයෙන්ම ඔහු සිත්හි බලපැවැත්තේ, මෙම කණ්ඩායම පරීක්ෂා කිරීමට නිතර පැමිණෙන නිකොලායි පව්ලොවිච් කෙරෙහි වූ බලවත් හැඟීමෙන් යුතු ආදරයකි. ප්‍රේමාන්විත ආදරයකි. ඔව්, සැබැවින්ම උචිත වචනය නම් එයමැයි. නිකොලායි පව්ලොවිච් නිතරම පාහේ සේනාංකය පරීක්ෂා කරන්ට පැමිණියේය. පාංශු දේහධාරී පෘථුල පපුවක් සහිත හෙතෙම, සේනා නිල ඇඳුමින් සැරසී සිටියේ වන. ගිරා හොටක් වැනි ඔහුගේ නැහැයත් උඩු රැවුළත් කම්මුලෙහි දෙපස වැවුණු රැවුළත් කඩිසර ගමනත් විශේෂයෙන් කැපී පෙනුණි. කැඩේට්වරුන්ට ආචාර කරමින් පැමිණි නිකොලායි පව්ලොවිච් දුටු හැම මොහොතකම කසාත්ස්කි කෙරෙහි වූ ප්‍රහර්ෂය, ප්‍රේමවන්තයකු ඉදිරියේ ඇති වන හැඟීමට සමාන එකක් විය. නිකොලායි පව්ලොවිච් විසින් තරුණ කැඩේට්වරයා තුළ ඇති කරන ලද ඉමහත් ප්‍රමෝදය, සැබැවින්ම උණුසුම්ද දැඩිද වූයේය. තරුණයා තුළ ඇති වූයේ ස්වකීය අනන්තාපරිමාණ භක්තිය ප්‍රකාශ කරන වුවමනාවකි. තමා ආදරය කරන මේ මිනිහා වෙනුවෙන්, කවර දෙයක් මුත් කැප කරන්ට ඔහු සූදානම්ය. තමා විසින් තරුණයා තුළ ඇති කරන ලද ප්‍රහර්ෂය ගැන නිකොලායි පව්ලොවිච් දැන සිටි අතර, හෙතෙම එයට අනුබලද දුන්නේය. කැඩේට්වරුන් සමඟ විහිළු තහළු කරමින්ද, වරෙක තමාගේ කොලු ගතියට හිමි සරලබව විදහාපාමින්ද, තවත් විටෙක වැඩිහිටි මිත්‍රයකු සේද, ඊළඟට රාජකීය තේජසින් යුතුවද, ඔහු ඔවුන් අතර හැසුරුණේය. ස්ටුවර්ඩ්වරයා සමඟ කසාත්ස්කි ඇති කරගත් ආරවුල ගැන නිකොලායි පව්ලොවිච් කිසිවක් කීවේ නැත. එහෙත් තරුණයා ඔහු ඉදිරියට පැමිණෙත්ම, රංග ලීලාවකින් මෙන් තරුණයා පිස දැමූ හෙතෙම, රවා බලා ඔහු දෙසට ඇඟිල්ලක් දිගු කොට පිටත්ව යන අතර මෙසේ තෙපලීය.

"නුඹ තේරුම්ගන්ඩ ඕනැ, මම දන්න බව. නමුත් සමහර දේවල් තියෙනවා, මම දැනගන්ඩ කැමති නැති. නමුත් ඒවා මෙතන රැඳිල තියෙනවා."

එසේ තෙපලූ හෙතෙම, තම සුරත හදවත මත තබා පෙන්වීය.

ඉන් අනතුරුව උපාධිධාරී කැඩේට්වරුන් තමා අභිමුඛයට පැමිණි අවස්ථාවේදීද, ඔහු සිද්ධිය පිළිබඳ කිසිවක් තෙපලූයේ නැත. එහෙත් අන් හැම වතාවකම කියන පරිද්දෙන් ඔහු කියා සිටියේ, ඕනෑම අවශ්‍යතාවක් උද්ගත වූ සැණින්, කෙළින්ම තමා වෙත පැමිණෙන ලෙසය; එහෙත් ඔවුන්ගේ යුතුකම නම්, තමාටත් මාතෘභූමියටත් භක්තිවන්ත ලෙස සේවය කිරීමය; ඒ අතර තමා හැම විටම, ඔවුන්ගේ හොඳම මිත්‍රයා වන බවය. අන් හැම අවස්ථාවකදීම මෙන්ම, කැඩේට්වරුන් හැඟීමෙන් මුසපත් වූහ. ඒ අතර කලින් සිදු වූ දේ ගැනද සිහි කළ කසාත්ස්කි, ඇත්තටම කඳුළු සලා හැඬුවේය. තමාගේ මුළු ශක්තියම තම ආදරණීය සාර්වරයාගේ සේවය උදෙසාම කැප කරන්නෙමැයි ඔහු තමාටම ශපථ කෙළේය.

කසාත්ස්කි කොමිෂන් ලැබුවායින් පසුව, ඔහුගේ මවත් සහෝදරියත් මොස්කව් නුවරට පැමිණියාහ. අනතුරුව ඔවුහු සිය ගම්බද නිවසේ පදිංචියට ගියහ. කසාත්ස්කි තම දේපලවලින් හරි අඩක්ම සොහොයුරිය නමට ලියුවේය. ඉතිරි කොටස් තබාගත්තේ, තමාගේ වියපැහැදම් සඳහාය. මන්ද යත්, ඔහු සේවය කෙළේ ස්වර්ණාලේපිත රෙජිමේන්තුවෙහි වූ හෙයිනි.

පිටතින් බැලූ බැල්මට නම්, කසාත්ස්කි වූකලී දීප්තිමත් වූද, ඉහළ නැඟෙන ආශාවෙන් පෙළෙන්නා වූද තරුණ ආරක්ෂකයෙක් විය. එවන් සෙසු හැම එකකු වගේමය. එතෙකුදු වුවත්, ඊට යටින් පෙනී ගියේ, ඔහු ඉතා පැටලිලි සහිත වෙහෙසකර ව්‍යායාමයෙක ගැලී සිටින බවය. මෙම දුෂ්කර ව්‍යායාමය, සිය ළමා කාලයේ සිටම පැවති දෙයකි. විවිධ හැඩතල ගනිමින් එය ඉදිරියට ගියද , පරමාර්ථ වශයෙන් බලන කල, එය එකක්ම විය. ස්වකීය ජීවිතයෙහි ඔහු හඹා ගිය එකම කාරණයක් වී නම්, ඒ තමා කෙරෙහි අවශේෂ ජනයා තුළ ප්‍රශංසාවත් විස්මයත් ඇති කිරීමේ වුවමනාවය. එහෙයින් ඉහළින්ම කැපී පෙනීමේ ආශාව ඔහු තුළ ඉස්මතු විණි. දැනීම ලබාගැනීම, පාඩම් කිරීම වැනි කටයුතුවලදී ඔහු පොතපතටම ඇලී ගැලී සිටියේය. ඒ, තමාට ප්‍රශංසාව ලැබෙන තුරුය; තමා ආදර්ශයක් සේ හුවා දැක්වෙන තුරුය. එක් විෂයයක් ප්‍රගුණ කළ පසුව, ඔහු අනෙකක් දෙසට හැරුණේය. කසාත්ස්කි පන්තියේදී ප්‍රථම ස්ථානය

දිනාගත්තේ එපරිද්දෙනි. හමුදා සේවයෙහි යෙදී සිටියදී, ප්‍රංස බස කතා කිරීමේ කිසියම් අසීරුතාවකට මුහුණ දෙන්ට ඔහුට සිදු විය. ඔහු කෙළේ, රුසියන් බසෙහි තරමටම, ප්‍රංස බසෙහිද ප්‍රවීණත්වය ලබාගැනීමය. ඒ අතර ඔහු තුළ චෙස් ක්‍රීඩාව පිළිබඳ ආකර්ෂණයක් හටගත්තේය. ඔහු නැවතුණේ, එම ක්‍රීඩාවෙහි ඉහළම මට්ටමේ ප්‍රවීණත්වයක් අත්පත් කරගැනීමෙන් පසුවය.


ඔහුගේ ජීවිතයෙහි ප්‍රධාන මෙහෙවර වූයේ, රටටත්, සාර්වරයාටත් සේවය කිරීමය. එතෙකුදු වුවත්, එයට අමතරව, ඉතා හදිසි වූ සමීප පරමාර්ථයක්ද, හැම විටම ඔහුට තිබිණි. මේ අරමුණ කොතරම් සුළු එකක් වුවද, එය දිනාගන්නා තෙක්ම, ඒ සඳහා තමාගේ මුළු ශක්තිය යෙදවීම ඔහුගේ සිරිත විය. එවිට කෙනෙකුට සිතෙන්නේ, ඔහු ඒ සඳහාම ජීවත් වන බවකි. එය ඉටු වූ සැණින්ම, කාසාත්ස්කි අබිමුව තවත් අරමුණක් නැඟී සිටියි. අනතුරුව, ඔහු එය හඹා යයි. මෙපරිදි විශිෂ්ටත්වය උදෙසා වෙරදැරීම, ඒ විශිෂ්ටත්වය ළඟා කරගැනීම, එක් අරමුණක් ඉටු වූ පසුව තවෙකක් හඹා යාම, ඔහුගේ ජීවිතයෙහි මූලික චරිත ස්වභාවය විය. එපරිදි කොමිෂන් ලැබීමෙන් පසුව, ස්වකීය සේවාව පිළිබඳ පරිසමාප්ත දැනීමක් ලබාගැනීමට, ඔහු අධිෂ්ඨාන කරගත්තේය. එහි ප්‍රතිඵලය වූයේ, මඳ කලෙකින්ම, ඔහු හමුදා නිලධරයකු පිළිබඳ ආදර්ශ පූංජයක් බවට පත් වීමය. එතෙකුදු, එක් විශේෂත්වයක් තිබිණි. ඒ, තමාට පාලනය කළ නොහැකි වූ කේන්තියයි. එය දැන් අන් කවරදාටත් වඩා, ඔහුගේ කාර්යභාරය සම්බන්ධයෙන් හානිකරද, අවැඩදායකද විය. දිනක් සිදු වූ කතාබහකදී ඔහුට පෙනී ගියේ, තමාගේ අධ්‍යාපන පසුබිම ප්‍රමාණවත් නොවන බවය. තමා වටා පොතපත ගොඩ ගසාගත් කසාත්ස්කි, අවශ්‍ය ප්‍රමාණයේ දැනීම ළඟාකරගැනීමෙන්, ඒ අඩුව මකාගත්තේය. ඒ අතර ඔහුට අවශ්‍ය වූයේ, සමාජ ජීවිතයෙහි කැපී පෙනීමය. බාල් නැටුමෙහි පරිසමාප්තිය ලබන තරමටම පුහුණුව ලැබූ හෙතෙම, නොබෝ කලෙකින්ම බාල් නටන සමාජයට අත්‍යවශ්‍යම පුද්ගලයකු බවට පත් වූයේය. ඉහළ සමාජයේ හැම බාල් නැටුමකටම පමණක් නොව, කිහිපදෙනකුගේ පුංචි කණ්ඩායම්වල අතිවිශේෂ වූ එවන් අවස්ථාවලට පවා ආරාධනය ලබන සුවිශේෂයකු බවටද, ඔහු පත් විය. එහෙත් එයිනුදු, ඔහු

තෘප්තියට පැමිණියේ නැත. ඔහු පුරුදුව සිටියේ, මුල්ම තැනටය. දැන් ඔහු සිටින්නේ, එයට බොහෝ මෑත දුරකිනි.

මට හිතෙන ආකාරයට නම්, ඒ අවධියේ ඉහළ සමාජය හැමදාම පැවතියාක් මෙන්ම, හැම තැනකම පවතින්නාක් මෙන්ම, සමන්විත වූයේ, වර්ග හතරක මිනිසුන්ගෙනි. (1) ධනවත්, ඒ වගේම රාජ සභාවට අයත් අය. (2) ධනවත් නොවුණත්, උපතින්ද අභ්‍යාසයෙන්ද රජ වාසලට අයත් වන අය. (3) රජවාසලෙහි හොඳ හිත දිනාගන්නට කැමති ධනය ඇති අය. (4) ධනයත් නැති, රජවාසල හා සම්බන්ධතාත් නැති, එතෙකුදු ධනවත් සෙසු පිරිසෙහිත්, රජවාසලෙහිත් හොඳ හිත දිනාගන්ට කැමති අය.

කසාත්ස්කි, මුල් ගණයටම අයත් වූයේ නැත. එහෙත් ඔහු යටකී දෙවැනි තුන්වැනි කණ්ඩායම් හා යසට පැහුණේය. සමාජ ජීවිතයට පිවිසීමේදී, ඔහු තුළ එක් විශේෂ අරමුණක් තිබිණි. එනම්, ඉහළ සමාජයේ කිසියම් කාන්තාවක හා සබඳකමක් ඇති කරගැනීමය. ඒ අරමුණ සිතුවාටත් වඩා ඉක්මණින් ඉටු කරගැනීමට හේ සමත් විය. වැඩි කලක් ගත වූයේ නැත. තමා සැරි සරන්නේ, ඒ තරම්ම ඉහළ සමාජ චක්‍රයක නොවන බැව්, ඔහුට පසක් විය. ඊටත් වඩා ඉහළ සමාජ තල ඇත්තේය. ඒ අන් කිසිවක් නොව, රජවාසලට සබඳකම් ඇති සමාජ චක්‍රයයි. එකී සමාජය තුළද ඔහු පිළිගැනුණි. එතෙකුදු වුවත්, ඔහු එතැන සිටියේ පිටත්තරයකු හැටියට පමණි. ඔහුට ආචාරසම්පන්න ලෙස සලකන ලද නමුදු, ඔවුන්ගේ හැම වදනකින්ම, හැම ක්‍රියාවකින්ම පෙනී ගියේ, ඔවුන් පමණක්ම එම සමාජයට අයත් බවය; තමා එයට අයත් නොවන බවය.

ඒ සමාජයට අයත් වන්නට ඔහුට වුවමනා කෙළේය. එය ඉටුකරගන්නා උපායද තිබිණි. එකක් නම්, රාජකීය සේනාධිපති සහකාරයකු වීමය. ඔහු එවැන්නක් බලාපොරොත්තුවද සිටියේය. අනෙක් ක්‍රමය වූයේ, මේ සමාජ චක්‍රයේ කාන්තාවක හා විවාහ වීමය. එවැනි විවාහයක් කරගන්නෙමැයි හෙතෙම තීරණය කෙළේය. කසාත්ස්කි රාජකීය සමාජයට අයත් රූමත් තරුණියක තෝරාගත්තේය. තමා පිළිගැනීමක් ලබන්ට බලාපොරොත්තුව සිටින සමාජ තලයට, ඇය අයත් වූවා පමණක්ම නොවෙයි. ඕ තොමෝ ඉහළ සමාජයේ ඉහළම තැන්වල වැජඹෙන බොහෝ



අයවලුන් විසින් පතන ලද, ලොබ බැඳගන්නා ලද, කොරොත්කෝවා ආදිපාදවරිය වූවාය. ඕ අතිශයින්ම රූමත් වූවා, ආකර්ෂණීයද වූවාය. නොබෝ දිනෙකින්ම, ඔහු ඇය හා ප්‍රේමයෙන් බැඳුණේය. මුලදී නම්, ඇය විසින් ඔහු පිළිගන්නා ලද්දේ, පැහැදිලිවම ප්‍රකාශිත කිසියම් ඇල්මැරුණු පියොවකිනි. එහෙත්, ඉතා ඉක්මණින්ම ඒ තත්වය පහව ගියේය. ඇය වඩාත් මෘදු වූවාය. ඇයගේ මෑණියෝද අතිශයින්ම හෘදයංගම වූවාය.

කසාත්ස්කි, විවාහ යෝජනාවක් කෙළේය. එය පිළිගැනුණි. තමාට ඒ භාග්‍යය, ඒ තරම්ම පහසුවෙන් ලැබුණේ කෙසේදැයි ඔහු මවිතයට පත් විය. අම්මාගේත් දුවගේත් සමාගමයෙහි කිසියම් අමුත්තක - අස්වාභාවික දෙයක - සේයාවක් ඔහුට දැනිණි. එතෙකුදු, ඔහු දැන් ප්‍රේමයෙනි. එහෙයින්ම අන්ධය. එසේ හෙයින්, නගරයේ හැම දෙනාම රහසින් කොඳුරා කියන කතාව - තමා විවාහ ගිවිසගත් තරුණිය මීට වසරකට පෙර, නිකොලායි පව්ලොවිච්ගේ අනියම් බිරිඳව සිටියේ විණැයි කියන කතාව - ඔහු දැන සිටියේ නැත.

# II

විවාහ මංගල්‍යයට දෙසතියකට පෙර, කසාත්ස්කි, තමා විවාහ ගිවිසගත් තරුණිය බැහැදකිනු සඳහා, ත්සාස්කෝයේ සෙලෝහි පිහිටි ඔවුන්ගේ ගිම්හාන නිවාඩු නිකේතනයට පැමිණියේය. එය මැයි මාසය වූ අතර, ඉතා උණුසුම්ද විය. මඳ වේලාවක් උද්‍යානයෙහි ඒ මේ අත සක්මන් කළ පෙම්වතුන් දෙදෙනා, අනතුරුව එහි පටුමගක් පසෙක වූ බංකුවක් මත හිඳගත්හ. උසට වැවී තිබුණු දෙහි ගස්වල තුරු පතරින්, එතැන හෙවණ විය. සිහින් සුමුදු කපු පිළියෙන් මසන ලද ඇඳුමකින් සැරසීගෙන සිටි මේරි ආදිපාදවරිය, එදින, අතිශයින්ම ප්‍රියජනක වූවාය. කසාත්ස්කි ඇය හා මුදු බසින් කතා කෙළේ ඉතා සෙමෙනි; තමාගේ කිසියම් වදනකින් හෝ චලන මාත්‍රයකින් හෝ ඇයගේ සිත රිදෙත බිඳෙත, ඇයගේ දිව්‍යමය රූ සපුව මැළවෙත කෙලෙසෙත යන බියකින් මෙනි. මේ කඩවසම් යෝධයා දෙස, වරින් වර නෙත් යොමා බලමින්, හිසද නවාගෙන එතැන හිඳගෙන සිටි ඕ, සැබැවින්ම ආදරයේත් අවිහිංසකත්වයේත් ප්‍රතිමූර්තියක් බඳු වූවාය. කසාත්ස්කි අයත් වුණේ, වයස හතළිස් ගණන්වල සිටි - මේ වන විට, එවැන්නන් කිසිවකු ඉතිරිව සිටියේද නැත - තමන්ගේ

ලිංගික අපරිශුද්ධභාවය පිළිගෙන සිටියා වූද, එහි කිසි වරදක් ඇතැයි නොදුටුවා වූද, එතෙකුදු තම බිරින්දෑවරුන්ගෙන් අතිශය පරමාදර්ශී දිව්‍යමය පාරිශුද්ධිය අපේක්ෂා කළා වූද මිනිසුන්ගේ ගණයටය. තමන්ගේ සමාජ කවයට අයත් වන හැම තරුණියක සතුවම, එවන් පාරිශුද්ධියක් ඇත්තේ වනැයිද, ඔවුහු සිතා සිටියහ. ඔවුන් විසින් එකී තරුණියන්ට සලකන ලද්දේද, ඒ හැඟීමෙන් යුතුවය. එකී අදහස්වල පැවැත්තේ බරපතළ සාවද්‍යභාවයකි. පිරිමි පක්ෂය තමන් වෙත පවරාගත් එකී අවසරය, අතිශයින් හානිදායකද විය. ඔවුන්ගේ ආකල්පය අද වෙසෙන තරුණයින්ගේ ආකල්පය හා කිසිසේත්ම ගැළපෙන්නේ නැති බව, අමුතුවෙන් කිව යුතු නොවෙයි. අද මානවකයින් කිසියම් තරුණියක දෙස බලන්නේ, තමාට සහකාරයකු සොයමින් සිටින ස්ත්‍රී ප්‍රාණියකු හැටියට පමණි. මා නම් හිතන්නේ, වඩාත්ම යහපත් ආකල්පයද එය බවය. තමන් එවන් පරමාදර්ශී තත්වයකට ඔසොවා තැබුණු බැව් පසක් කළ තරුණියෝද, තමන්ගේ ශක්ති පමණින් එවන් තත්වයකට පත් වන්නට වෑයම් කළාහුද වෙති. ගැහැනුන් කෙරෙහි කසාත්ස්කිගේ ආකල්පය වූයේද එයයි. තමා විවාහ ගිවිසගත් තැනැත්තියගෙන් හෙතෙම බලාපොරොත්තුව සිටියේද, එකී පරමාදර්ශී තත්වයමැයි.

එදින අන් කවරදාකවත් නොවූ තරම් ඇය කෙරේ ප්‍රේමයෙන් බැඳී සිටි ඔහු තුළ, මඳ වශයෙන් හෝ ඇය පිළිබඳ කාමුක ආශාවක් - පෙලඹවීමක් - හටගත්තේ නැත. ඒ වෙනුවට ඔහු තුළ උපන්නේ අනෙක් හැඟීමකි. ඇයට සමීප වීමේ අසීරුව ගැන, මුදු ලෙස සිතමින්, හේ ඉමහත් ආනන්දයක් ලැබීය.

ඇඳුමෙහි එල්ලාගෙන සිටි වකුටු කඩුව දෝතින්ම අල්ලාගත්වනම, ඔහු ඇය ඉදිරියෙහි සිටගත්තේය.

"ජීවිතය කෙනෙකුට ලබා දෙන ප්‍රීතිය මොකක්ද කියල, මම දැනගත්තෙ දැනුයි. මම, මං ගැන හිතාගෙන හිටියාට වඩා හොඳයි නේද කියල, දැනෙන්නෙත් දැනුයි."

"මම නම් ඒක දැනගෙන බොහොම කල්," ඕ පිළිවදන් දිණි. "මං ඔයාට ප්‍රේම කරන්ඩ පෙලඹුණේ ඒ නිසයි."

ළඟ පාත තුරු වදුලෙක සිටි කොවුලෙක් ගීයක් ගයන්නට විය. තුරු වදුලේ ළපලු පිසගෙන හදිසියෙන්ම වාගේ සුළං රළක් හමා ආවේය.

ඇගේ අත ගත් හෙතෙම, ඒ අත සිපගත්තේය. ඔහුගේ දෑසට කඳුළු නැගිණි. ඒ කඳුළු, තමාගේ ආදරය පිදීම කෙරෙහි ඔහු තමාට දක්වන කෘතඥතාවයේ කඳුළු බැව් ඇය වටහාගත්තාය. වදනකුදු කතා නැතිව, හේ මඳක් ඔබ මොබ පිය මැනීය. ඉනික්බිති ඇය වෙත පැමිණ, එතැන හිඳගත්තේය.

"මං ඔයාට කියන්ඩ හිටියෙ... නෑ කමක් නෑ.... මුලින්ම මං ඔයා සොයාගෙන ආවෙ, ආත්මාර්ථකාමී අරමුණකින් බවයි, මං දැනගත්තෙ," ඔහු තෙපලීය. "ඒ වගේම, මං ඔයාට තියෙන ණයගැතිබව තේරුම්ගත්තෙත් අදයි."

ඔහු ලජ්ජාශීලිව ඈ දෙස බලා සිනාසුණාය. "ඔයා" යනුවෙන් ඇය අමතන්ට තමාට කිසියම් නුහුරුබවක් ඇත්තේ නොවේදැයි, ඔහු තමාටම කියාගත්තේය. හෙතෙම හිස ඔසොවා, ඇගේ සුන්දර මුහුණ දෙස බැලීය. මෙවන් සුරදූතිකාවකට එවන් කුලුපග වදනකින් අමතන්නේ කෙසේද?

"මට, මාව හරිහැටි වටහාගන්ට ලැබුණෙ ඔයා නිසයි. මම හෙව්වෙ සමාජයේ තත්වයක්. නමුත් ඊට පස්සෙ - ඔයාව හඳුනාගත්තට පස්සෙ - ඔයාත් එක්ක ඒ අරමුණ සංසන්දනය කර බලද්දි, ඒක මොන තරම් නොවැදගත්ද කියල, දැන් හිතෙනව. ඔයා ඒ ගැන මාත් එක්ක අමනාපද?"

ඇය පිළිතුරු නොදුන්නාය. එතෙකුදු ඇය සියතින් ඔහුගේ අත ගත්තාය.

ඔහු තේරුම්ගත්තේය. ඇය තමා හා අමනාප නැත.

"දැන් ඔයා කියනව, මට ඇහෙනව..." තමා ඕනෑවට වඩා නිර්භයව ඇතැයි සිතූ හෙතෙම පසුබෑය. "ඔව්. මට ආදරය කරන්ඩ මං ඔයාව පොලඹවල තියෙනවා. නමුත්... මට සමාවෙන්ඩ. අවිස්වාසෙකට නෙමෙයි. නමුත් ඔයාගෙ හිත අවුල් කරන

කාරණයක් - හිතට වද දෙන කාරණයක් - තියෙනව කියල මට හිතෙනව. ඒ මොකක්ද?"

ඔව්. ඇය කල්පනාවට වැටුණාය. එක්කෝ දැන්, නැත්නම් කවදාවත්ම නෙමෙයි. කොහොම නමුත්, ඔහු කවදා හෝ එය දැනගන්නවාට සැක නැත්තේය. නමුත් දැන් - දැන් ඔහු තමා අතහැර යන්නේ නැත. අහෝ, ඔහු තමා අත හළොත්, එය ඇයට දරාගන්ට බැරි වනු ඇත්තේය.

ඔහුගේ චිත්තාකර්ෂණීය හැඩිදැඩි ධීර සිරුර දෙස, ඇය ඉමහත් ආදරයකින් සිය නෙත් රැඳවූවාය. ඇය දැන් ඔහුට ප්‍රේම කරන්නීය. දැඩි ලෙස ප්‍රේම කරන්නීය. රාජකීය විශේෂ අභිමතය නොවිණි නම්, තමා ප්‍රේම කරනු ඇත්තේ, අධිරාජයාට නොව මොහුටය.

"මට ඇහුන්කන් දෙන්න. ඔයාට බොරු කියන්ඩ මට බෑ. සම්පූර්ණ ඇත්ත මං දැන් ඔයාට කියන්ඩ ඕනෑ. ඒ මොකක්ද කියල, ඔයා අහනව. ඒ කාරණය මේකයි. මම මීට පෙර ප්‍රේම කරල තියෙනවා."

සිය අත, ඔහුගේ අත මත තබාගෙන, ඇය බැගෑපත් විලාසයකින්, බියෙන් මෙන් ඔහු දෙස බලා හුන්නාය.

ඔහු කතා කෙළේ නැත.

"ඒ කවුද කියල මම ඔයාට කියන්ඩද? ඒ ඔහු. ඔව්, අපේ රජ්ජුරුවන්වහන්සෙ."

"රජ්ජුරුවන්වහන්සෙට අපි කවුරුත් ආදරය කරනවා. ප්‍රේම කරනවා. ඔයා පාසල් යන කාලෙදි වෙන්න ඇති....... මං හිතන්නෙ."

"නෑ. මං ඒ කාල වෙන කොට, ඉස්කෝලෙන් පිට වෙලා. ඒක උමතු ප්‍රේමයක්. දැන් ඒ සේරම අවසන්. නමුත් මං ඔයාට කියන්ඩ ඕනැනෙ...."

"ඔව්. ඒ මොකටද?"

"ඒක නිකම්ම නිකං....." ඇගේ දෑත එසවිණි. ඕ සිය දෝතින් මුහුණ වසාගත්තීය.

"මොනවා? ඔයා කියන්නෙ, ඔයා එයාට, ඔයාව පාවල දුන්න කියලද?"

ඇගෙන් පිළිවදනක් නොවීය.

"ඒ කියන්නෙ, ඔයා එයාගෙ අනියම් භාර්යාව වෙලා හිටිය කියන එකද?"

ඇගෙන් පිළිවදනක් නොවීය. වහා නැඟී සිටි හෙතෙම, ඇයට මුහුණ දීගෙන සිටගත්තේය. හේ මරණය සේම මැලවී ගොසිනි. ඔහුගේ දෙතොල සැලෙන්නට වන. දිනක් නෙව්ස්කිහිදී හමු වුණු අවස්ථාවක, තමාගේ විවාහ ගිවිසගැනීම සම්බන්ධයෙන් නිකොලායි පව්ලොවිච් තමන්ට සුබ පැතුවේ, කොතරම් ආදරණීය ලෙසදැයි ඔහුට හදිස්සියේම සිහි විය.

"දෙයියනේ, මොකක්ද මේ මම කරගත්තෙ?" ඇය විලාප දෙන්ට වූවාය.

"මාව අල්ලන්ඩ එපා. මාව අල්ලන්ඩ එපා. අයියෝ, තී මට තුවාල කරපු හැටි."


ආපසු හැරුණු හෙතෙම, දිගු පියවර තබමින් නිවස දෙසට යන්ට වන්නේය. සාලයේදී ඔහුට ඇගේ මව මුණ ගැසුණාය.

"ඇයි කුමාරයාණෙනි, මොකක්ද වෙලා තියෙන්නෙ? මං කල්පනා කෙළේ....,"

එහෙත් ඔහුගේ මුහුණෙහි වූ බැල්ම දුටු ඕ නැතිගත්තාය. තවදුරටත් කතා කරන්ට තරම් සවියක් ඇය තුළ නැතුවාක් වැන්න. ඔහුගේ මුහුණ සාහසිකත්වයෙන් රතු වී ඇත්තේය.

"නුඹ දැනගෙන හිටියා."

ඔහු ඇය ඉදිරියේ වියරු ලෙස කෑගසන්ට වූයේය.



"එතකොට තුඹලාට ඕනෑ වුණේ, මාව පලිහක් හැටියට යොදාගන්ඩ. නුඹ පිරිමියෙක් වුණා නම් එහෙම......"

මිට මොළවාගත් ඔහුගේ විශාල අත එසවිණි. හදිසියේම ආපසු හැරුණු හෙතෙම, කඩිනමින් නිවසින් එළියට වන්නේය.

ඇගේ කලින් ප්‍රේමවන්තයා වෙනත් කවරකු හෝ විණි නම්, ඔහු විසින් ඒ තැනැත්තා මරා දමනු ඇත්තේය. එතෙකුදු වුවත්, ඒ තැනැත්තා අන් කවරකුවත් නොව, තමාගේම අපරිමාණ ආදරයට ගෞරවයට පාත්‍ර වූ අධිරාජයාය.

පසු දින නිවාඩු ඉල්ලා සිටි හෙතෙම, ඒ සමඟම සිය ඉල්ලා අස්වීමද භාර දුන්නේය. කිසිවකු මුණ නොගැහෙන්ට තීරණය කළ හේ, තමා අසනීපයෙන් සිටින බැව් දැනගන්ට හැරියේය. ඒ හාම, හෙතෙම පිටිසර බලා පිටත් වුණේය.

ඉදිරි කටයුතු සැලසුම් කරමින් ඔහු, ග්‍රීෂ්ම ඍතුව සිය වත්තේ ගත කෙළේය; ගිම් කල නිම වත්ම, ශාන්ත පීටර්ස්බර්ග් නුවරට ආපසු යනු වෙනුවට, පැවිද්දකු වන බලාපොරොත්තුවෙන් තාපසාරාමයක් වෙත ගියේය.

තම පුතු පිටිසරබද වත්තේ සිටියදී අම්මා ඔහුට ලියුමක් ලියුවාය. එවැනි අවසාන තීරණයක් නොගන්නැයි, ඈය ඔහුගෙන් අයැද සිටියාය. මෑණියන්ට පිළිතුරු යවමින් ඔහු කියා සිටියේ, අන් සියල්ලටම වඩා කෙනකු දෙවියන්වහන්සේගේ කැඳවීමට අවනත විය යුතු බවය. තමාට මේ කැඳවීම ලැබී ඇත්තේ, උන්වහන්සේ වෙතිනි. ඔහු සේම අභිමානවත්ද, විජිගීෂාවෙන් යුතු වූද, ඔහුගේ සොහොයුරිය - වාර්වරා - පමණක්, සිය සහෝදරයාගේ තත්වය වටහාගත්තී, ඔහු කෙරෙහි අනුකම්පාසහගතද වූවාය.

සිය සොහොයුරා ප්‍රවෘජ්ජාව තෝරාගෙන ඇත්තේ, ඔහුට ඉහළින් සිටි අයට ඉහළින් සිටින්නට ගත් තීරණයක් හැටියටය. ඈයට ඔහුගේ තීරණය පෙනුණේ, ඒ අයුරිනි. සැබැවින්ම, ඈය නිවැරදි වූවාය. පැවිදි බිමට ඇතුළු වීමෙන් පසුව, සෙසු අයවලුන්ටත් තමාටත් වැදගත් සේ පෙනුණු හැම දෙයක් දෙසම ඔහු බැලුවේ අවඥාවෙනි. තමා හමුදාවේ ගත කළ කාලයේදී වැදගත් සේ පෙනුණු සියල්ලක්ම

අවඥාවෙන් බැහැර කළ හෙතෙම, තම ආත්මය ඉහළ තලයකට ඔසවා තැබීය. ඒ ඉහළ තලයේ සිට තමා මෙතෙක් ඉරිසියා කළ අයවලුන් දෙස ඔහුට බැලිය හැකි විය. වාර්වරා කල්පනා කෙළේ ඒ අයුරින් වුවද, ඔහු මෙහෙයවුණේ, ඒ හැඟීමෙන් පමණක්ම නොවේ. ඔහුගේ අභිමානයත්, ප්‍රථමයා වන්නට ඇති ආශාවත් යන කරුණු හා මිශ්‍රිතව පැවති අනෙක් කාරණයක්ද විය. වාර්වරා නොදුටු එකරුණ වූයේ, සත්‍ය වශයෙන්ම ඔහු තුළ බලපැවත්තාවූ බලවත් ආගමික ආශාවයි. ඔහු සිතා සිටියේ, මේරි - තමා විවාහ ගිවිසගත් තරුණිය - සාන්තුවරියක කියාය. දැන් ඒ මුළාව පහව ගොස් ඇත්තේය. ඔහු තුළ හටගත් කෝපය කොතරම් කුරිරු වීද යත්, බලාපොරොත්තු සුන් වීමේ අසාධයටම ඔහු ඇද වැටුණේය. මෙම බලාපොරොත්තු සුන්වීම, ඔහු මෙහෙයවාලූයේ කොතැනටද? දෙවියන්වහන්සේ වෙතටය; සිය ළමා වියේදී ඔහු තුළ පැවති දෙවියන් කෙරෙහි වූ විශ්වාසය වෙතටය. දෙවියන්ගේ ඒ ග්‍රහණය, ඔහු වෙතින් කිසි විටෙකත් ලිහිල්ව ගිලිහී ගොස් නොතිබිණි.

# III

කසාත්ස්කි ආශ්‍රමයට පිවිසියේ පොක්රෝව් උත්සව දිනයේදීය.

ආශ්‍රමයේ නායක පූජකවරයා වූයේ වංශාධිපතියෙකි. හේ තෙමේ බෙහෝ දේ උගත් බහුශ්‍රැත පඬිවරයෙකි. ඔහු පැවත ආවේ, වලචියා නමැති විශිෂ්ටතම පූජක පරපුරෙනි. නායක පූජක වලචියා, සුප්‍රකට අම්ව්රෝසිගේ ශිෂ්‍යවරයෙක් විය. අම්ව්රෝසි, මකාරිගේද, මකාරි, ලියොනඩ්ගේද, ලියොනඩ්, පායිසි වෙලිච්කොව්ස්කිගේද ශිෂ්‍යයෝ වූහ. ආශ්‍රමයේ ප්‍රධාන පූජකයා තමාගේ ආචාර්යපාදයන් හැටියට, කසාත්ස්කි විසින් මුළු හිතින්ම පිළිගන්නා ලද්දේ විය.

මෙම ආශ්‍රමයට ඇතුළත් වීමෙන්, තමා අන් අයට වඩා උදාරත්වයට පත් වූයේ යැයි ඔහු තුළ හැඟීමක් ඇති විය. එයටද අමතරව, ඔහු අන් හැම විටෙකම කළාක් මෙන්, මෙම ආශ්‍රමය තුළ කරන කියන හැම දේකින්ම, උපරිම තෘප්තියක් ලැබීය. මෙම නව මාර්ගයට ප්‍රතිපන්න වීමේ හේතුවෙන්, හෙතෙම අභ්‍යන්තර බාහිර පාරිශුද්ධිය අකුරටම සොයා ගියේය. කසාත්ස්කි සිය රෙජිමේන්තුවේ ගත කළ ජීවිතයේදී කිසිවකුගෙන් දොසක් අහන්ට කටයුතු නොකළාක් මෙන්ම, නිලධාරියකු හැටියට තමාගෙන් බලාපොරොත්තු වූවාටත්

වැඩියෙන් කළ යුතු සියලු කිස ඉටු කෙළේය. පැවිදි ජීවිතයට ඇතුළත් වීමෙන් පසුවද, ඔහු ගත්තේ එම මාර්ගයමැයි. ඔහු මේ පැවිදි ජීවිතය තුළ මිතාහාරවද මිතාචාරවද අප්‍රමාදීවද පවිත්‍රවද සිය පැවැත්ම සකස් කරගත්තේය; ක්‍රියාවෙන් මතු නොව, මනසින්ද අතිශය සුවච වූයේය. අවසනට දැක්වුණු සුවචභාවය නමැති ගුණාංගය හේතුකොටගෙන, තමාගේ ජීවිතය වඩාත් පහසු විණැයි ඔහුට දැනෙන්නට විය. බොහෝ දායකයින් පැමිණෙන ආශ්‍රමයකදී පැවිද්දකු විසින් ඉටු කළ යුතු යැයි අපේක්ෂා කෙරෙන කුදු මහත් කිස අප්‍රමාණය. ඒවායින් බොහොමයක් අප්‍රසන්නය. සිත පාරනසුලුය. එතෙකුදු වුවත්, මෙම සුවචභාවයත්, ඒ නිසාම ලැබුණු අවබෝධ ඥානයත් හේතුකොටගෙන, ඒ සියල්ල ඉවසා දරා සිටිනු, ඔහුට පහසු විය. හේතු යුක්ති සෙවීම මගේ කාර්යය නොවෙයි. කළයුතු වන්නේ, කවරක් වුවත්, ඒ සියල්ල ඉටු කිරීමය. පූජනීය වූ ධාතු රැකබලාගැනීම, ගීතිකා කණ්ඩායම්වලදී ගායනා කිරීම, ආශ්‍රමයේ නේවාසිකාගාරයේ ගිණුම් පිළිවෙලකට තබාගැනීම යන මේ කටයුතු කුමක් වුවත්, ඒ පිළිබඳ හේතු යුක්තීන් නොසොයා නොබලා ඉටු කිරීම තම කාරිය බැව්, හෙතෙම සිතන්නට වන්නේය. ආශ්‍රමයේ නායක පැවිද්දනට කීකරුවීමේ මෙම ගුණය හේතුවෙන්, කිසිම කාරණයක් සම්බන්ධයෙන් සැක පහළ වීමට ඇති අවකාශයන්ද පහ විණි. මෙම සුවචබව නොවුණි නම්, ආශ්‍රමයෙහි දේවස්ථානයේ පැවති ඒකාකාරී දිග යාතිකාවන්ද, යන එන අමුත්තන්ගේ කලබලකාරී පිළිවෙලද, ආශ්‍රමයේ සහෝදර පැවිද්දන්ගේ අප්‍රසන්න ගතිපැවතුම්ද විඳ දරාගෙන සිටීම, ඔහුට අපහසු වන්නට තිබුණි. සුවච වීම නිසාම, ඔහු ඒ සියල්ල කැමැත්තෙන් පිළිගත්තේය. එමතු නොවෙයි. එය ඔහුගේ සිතට සහනයක්ද, ජීවිතයට පිටිවහලක්ද විය. දවසේ කිහිප වරක් එකම යාඥාවට සවන් දිය යුත්තේ ඇයිදැයි මා දන්නේ නැත. නමුත් එය අවශ්‍ය බව මම දනිමි. අවශ්‍ය යැයි දන්නා නිසා, මට එයින් ලැබෙන්නේ ලොකු සතුටකි. ඔහු සිතන්නට වන්නේය. කෙනකුගේ ජීවිතයේ පැවැත්මට ආහාර අවශ්‍ය වන්නේ යම් සේද, ඔහුගේ ආධ්‍යාත්මික ජීවිතයට ආධ්‍යාත්මික ආහාර වන යාච්ඤාව අවශ්‍ය වන බැව්, නායක පූජකවරු ඔහුට කියා දුන්හ. ඔහු එය විශ්වාස කෙළේය. උදය යාච්ඤාව සඳහා අවදි වීම ඉතාම දුෂ්කර කටයුත්තක්ව තිබුණද, ඔහුට ඒ යාච්ඤා සේවය මගින් සිතට ඉමහත් සතුටක්ද සැනසීමක්ද ලැබුණි. නායක පැවිද්දන් විසින්

තමන් වෙත පවරනු ලබන හැම කාර්යයකදීම යටහත් පහත් වීමද, හැම දෙයක්ම ප්‍රශ්න කිරීමකින් තොරව පිළිගැනීමද, ඔහුට අතිශය සැනසිලිදායක හැඟීමක් ගෙන දුන්නේය. වඩ වඩාත් යටහත් වීම සහ නිහතමානීබව පමණක් නොව, ක්‍රිස්තියානි ගුණ ධර්ම සියල්ලම සාධනය කිරීම, ජීවිතයේ අග්‍රතම කාර්යය වන්නේය. මුලදී නම් ඔහුට සිතුණේ, ඒ සියල්ලම ඉතා පහසුවෙන් තමාට ලැබී ඇති බවය. ඔහු තමන් සතු සියලු දේපළ සහෝදරිය නමට ලියා ඇත්තේය. ඒ ගැන ඔහු තුළ කිසිදු තැකීමක්ද නැත්තේය. තමා අලසබවෙහි ගැලී සිටින්නේද නොවෙයි. තමාට පහළින් සිටින අයවලුන් කෙරෙහි දක්වන නිහතමානය ඉතා පහසු කටයුත්තක් පමණක් නොව, එය ඔහුට ප්‍රීතිය ගලා එන උල්පතක්ද වූයේය. ශරීර මාංශයෙන් හටගන්නා පාපයන් වන - වස්තු තෘෂ්ණාවත් - කාමාශාවත් යන දෙකම, ඔහු විසින් ඉතා පහසුවෙන් පරාජය කරන ලද්දේ විය. නායක පැවිද්දන් විසින් ඔහුට විශේෂයෙන් අවවාද කර තිබුණේ, එකී පාප කර්මවලින් මිදී සිටිය යුතු බවය. එහෙත් කසාත්ස්කි ඒවායෙන් නිදහස්ව සිටියේය. ඒ නිදහස නිසාම අපමණ සතුටටද පත් විය.

ඔහුගේ සිතට පීඩා ගෙන දුන්නේ තමා විවාහ ගිවිසගත් කාන්තාව පිළිබඳ ස්මරණය පමණි. ස්මරණය පමණක්ම නොවෙයි. විය හැකිව තිබුණු දෙය පිළිබඳව සිහි කළ හෙතෙම, ඒ නිසා වඩාත් පීඩාවට පත් විය. ඒ අතර තවත් කරුණක්ද, නිරුත්සාහීවම ඔහුගේ සිතට ගලා ආවේය. රජතුමාට සිටි තවත් පැරණි පෙම්වතියක්, විවාහයෙන් පසුව ආදර්ශමත් බිරිඳකද මවකද වූ අයුරු ඔහුට සිහි විය. ඇයගේ සැමියා ඉහළ නිලයකට පත් කරනු ලැබීය. එමගින් ඔහුට බලයත් තත්වයත් ලැබුණි. එසේම තමාගේ වැරදි ගැන අවංකව පසුතැවිලි වන, ඉතා හොඳ බිරිඳක්ද ඔහුට ලැබුණි.

කසාත්ස්කිගේ දෛනික පැවැත්මේ හොඳ අවස්ථාවන්හිදී, අර හැඟීම් ඔහුට වද දුන්නේ නැත. එවන් මොහොතක ඔහුට දැනුණේ බලවත් සතුටකි. මන්ද යත්, තමා පෙලඹවීම්වලින් මිදී ඇත්තේය යන කාරණය, ඔහුට පසක් වූ හෙයිනි. එහෙත් ඒ සතුට තමා තුළ දුර්මුඛ වී දිය වී වියැකී ගිය සැණෙහිදීම, මෙම අලුත් ජීවිතය කෙරෙහි තමා තුළ ඇති භක්තියද හදිසියෙන්ම කඩා වැටෙයි. තමාගේ පැරණි ස්මරණවලින් සිත යටපත් වන එවන් මොහොතක, ඔහු තුළ විශාල

භීතියක් ඇති වෙයි; තමා විසින් තෝරාගෙන ඇති මෙම ආගමික ජීවිතය ගැන පසුතැවිල්ලක්ද හටගනියි.

ඉන් ගැලවීමක් ඇත්තේ, තව තවත් සුවචව මෙම ජීවිතයටම නැඹුරු වීමෙනි. දවසේ හැම පැයක්ම යාච්ඤාවෙන් පිරී යන්නට ඉඩ දෙමින්, මුනින්තලා වී නමස්කාරයෙන් දිගා වෙන හෙතෙම, යාච්ඤා කරන්නට වෙයි; අන් කිසිදු වතාවක නොකළ තරම් වඩාත් හොඳින් ලැදිව යාච්ඤා කරන්නට වෙයි. එතෙකුදු, තමාගේ මෙම යාච්ඤාව හුදෙක්ම ශාරීරික එකක් බැව්, ඔහු මොහොතකින් පසක් කරයි. එහි ආත්මයක් පැවැත්තේ නැත. මෙසේ දවසක් හෝ දෙකක් ගත වෙයි. අනතුරුව එය පහව යයි. එහෙත් ඒ දවස හෝ දෙදවස භීතියෙන් ඇලලුණු කාලයකි. එසඳ තමා වෙන කාගේ දෝ බලයකට නතුව සිටිතැයි, ඔහුට දැනෙන්ට වෙයි. ඒ බලය තමාගේත් නොවේය. දෙවියන්වහන්සේගේත් නොවේය. වෙනත් කෙනෙකුගේය. එවන් අවස්ථාවකදී ඔහුට කළ හැකි වූයේත්, ඇත්ත වශයෙන්ම ඔහු කෙළේත්, සිය නායක පැවිද්දන්ගේ අනුශාසනයට සවන් දී ඒ අනුව පැවතීමය. ඒ අනුව කටයුතු කිරීමය. එසේ කොට, තවත් බලා සිටීමය. එකී මුළු කාලය පුරාම ඔහුගේ ජීවිතය මෙහෙයවුණේ, ස්වකීය චිත්ත ධෛර්යයෙන් නොව, නායක පූජකවරුන්ගේ චිත්ත ධෛර්යයෙනි. එකී පූර්ණ යටත් වීම, ඔහුගේ අධ්‍යාත්ම සංහිඳියාවේ උල්පත වූයේය.

කසාත්ස්කි ඒ ආකාරයෙන් සිය මුල්ම ආශ්‍රමයෙහි අවුරුදු හතක කාලයක් ගත කෙළේය. තුන්වැනි වසර අවසානයේදී, ඔහුට පැවිදි වරයද දේශක වරයද ලැබුණි. එතැන් සිට, ඔහු සර්ජියස් යනුවෙන් හැඳින්වෙන්නට විය. ඒ වූකලී ඔහුගේ ආත්මීය අභ්‍යන්තර ජීවිතයෙහි ඉතා විශිෂ්ට මොහොතක් විය. සත්ප්‍රසාදයට සහභාගි වීම හේතුකොටගෙන, ඔහුට විශාල සහනයක් දැනුණි. එය ආධ්‍යාත්මික වශයෙන් තමා ඉහළට ඔසවා තැබීමකැයි ඔහුට දැනෙන්ට විය. තමාම දේව මෙහෙය පවත්වන එවන් අවස්ථාවක, සිය පූජාව හේතුකොටගෙන, ඔහුගේ චිත්ත සන්තානය අසීමිත ආනන්දයෙන් පිරී ගියේය. එහෙත් කල් යාමේදී එහි උත්කර්ෂයේ මහිමය, කෙමෙන් වියැකෙන්නට වන්නේය. එක් දිනක් එපරිදි තම චිත්ත ධෛර්යය හා ප්‍රමෝදය පිරිහී තිබුණ අවස්ථාවක, ඔහුට විශේෂ දේව මෙහෙයක් පවත්වන්නට සිදු විය. ඒ ප්‍රහර්ෂයද දිගටම

නොපවතින බැව්, ඔහුට පසක් වුණි. සැබැවින්ම, ආනන්දය පහව ගොස්, හුදු පුරුද්ද පමණක් ඉතිරි වුණි.

ආශ්‍රමයේ ගත කළ හත්වැනි අවුරුද්දේදී ඔහු තුළ හටගත්තේ, නියත වශයෙන්ම නීරස වෙහෙසකරබවකි. මෙහිදී ඉගෙනගත යුතු, හැදෑරිය යුතු, හදාරා අවසන් කළ යුතු, සියල්ල ඔහු විසින් අවසන් කර තිබුණි. කළ යුතු වූ අනෙක් කිසක්, ඉතිරිව තිබුණේ නැත.

එහෙත් අනෙක් අතට, සිය කාර්යයන් කෙරෙහි පැවතියා වූ මෙම උනන්දු හීනතාව, අතිශයින් ගැඹුරු වන්නට පටන්ගත්තේය. තම මෑණියන්ගේ මරණය පිළිබඳ පුවතින් හෝ මේරි ආදිපාදවරිය අන් අයකු හා විවාහ වීමේ පුවතින් හෝ ඔහු සැලුණේ නැත. ඔහුගේ මුළු අවධානයත් ශක්ති කදම්බයත් යොමුව තිබුණේ, අභ්‍යන්තර ජීවිතය කෙරෙහිය.

පැවිදිවරයෙන් පසුව එළඹුණු හතරවැනි අවුරුද්ද වන විට, බිෂොප්වරයා ඔහු කෙරෙහි අතිශයින් හෘදයංගමව සිටියේය. සිය සසුන තුළ උසස් ධානාන්තරයකට ඔහුගේ නම යෝජනා කෙරුණහොත්, එය ප්‍රතික්ෂේප නොකරන්නැයි නායක පැවිද්දෝ සර්ජියස්ගෙන් ඉල්ලා සිටියහ. ඒ හාම ආශ්‍රමික ජීවිතය තුළ ඉහළට නැගීමේ ආශාවක් තමා තුළ ඇති වුණු වගක්, ඔහුට දැනෙන්නට විය. ඒ වූකලී, මේ වන තෙක්ම තමා සෙසු පැවිද්දන් කෙරෙහි දැක තිබුණු, තමාගේ පිළිකුලට ලක්ව තිබුණු කාරණයක්ද විය. අගනුවර ආසන්නයෙහි පිහිටා තිබුණු ආශ්‍රමයකට ඔහු පත් කරන ලද්දේය. එය ප්‍රතික්ෂේප කරන්නට කැමැත්තේ වී නමුදු, එය භාරගන්නැයි නායක පූජකවරු ඔහුගෙන් උදක්ම ඉල්ලා සිටියහ. එසේ හෙයින් ඔහු නව තනතුර භාරගත්තේය. අනතුරුව, ඔහු ආශ්‍රමයේ නායක පැවිද්දන්ගෙන් සමුගෙන නව ආශ්‍රමය වෙත සම්ප්‍රාප්ත වූයේය. අගනුවර ආසන්නයෙහි වූ ආශ්‍රමය වෙත මාරු වී යාම, සර්ජියස්ගේ ජීවිතයෙහි වැදගත් සිද්ධියක් විය. නන්විධ පෙලඹවීම් විසින් ඔහු වට කරගනු ලැබීය. ඔහුගේ මුළු ශක්තියම යෙදුණේ ඒ පෙලඹවීම් මැඩගන්නටය.

මුල් ආශ්‍රමයේ ගත කළ කාලය තුළ සර්ජියස් ස්වකීය ලිංගික පෙලඹවීම්වලින් පීඩා වින්දේ මඳ වශයෙනි. එහෙත් මෙහිදී එකී පෙලඹවීම බිහිසුණු ආවේගයකින් නැගී සිටියේය. එය නියත

හැඩයක් ගන්නටද විය. ඒ තරම් ප්‍රසන්න නොවන ප්‍රසිද්ධියක් ඇති, කිසියම් කාන්තාවක කෙරෙහි, සර්ජියස්ගේ අවධානය යොමු වන්නට වූයේය. ඔහුට කතා කළ ඇය, තමා හමු වන්නට එන්නැයි ඔහුගෙන් අයැද සිටියාය. ඔහු එය දැඩි සේ ප්‍රතික්ෂේප කෙළේය. එතෙකුදු තමා තුළ වූ ආශාවේ හැඩතලය දුටු හෙතෙම, එයින් තැතිගත්තේය. තැතිගෙන, කොතරම් භීතියට පත් වූයේද යත්, ඔහු ඒ පිළිබඳව නායක පූජකවරුන්ට ලියා දැන්වීය. එපමණකින්ද නොනැවතී, තමා තවදුරටත් දමනය කරගත යුතු වන හෙයින්, ඔහු කෙළේ, තමාගේ ආවතේව කරන ගිහි සහෝදරවරයා තමා වෙත කැඳවා ඔහුට ඒ පුවත දැන්වීමය. තම අභිමතය සම්පූර්ණයෙන්ම පාවා දෙමින් පාපොච්චාරණය කළ සර්ජියස්, ආශ්‍රමයේ කටයුතු තමා අතින් සිදු කෙරෙනු හැරෙන්නට, තමාට කොහේවත් යන්නට ඉඩ නොදී බලාගන්නා මෙන්ද, ඔහු සිය ගිහි සහෝදරවරයාගෙන් ඉල්ලා සිටියේය.

මෙම ආශ්‍රමයෙහි අධිපති පූජකවරයා ලෞකික සම්පත් කෙරෙහි ගිජු, ඉහළ නැඟෙන ආශාවක් ඇති තැනැත්තෙක් විය. මේ අධිපති පූජකවරයා කෙරෙහි තමා තුළ පැවති නොපහන්බව පාලනය කරන්ටද සර්ජියස් අසමත් විය. ඒ පිළිබඳ කොතරම් වෑයම් කළද, පාලනය කළ නොහෙන විරෝධී හැඟීමක් ඔහු තුළ ඉතිරි විය. කොතරම් දුරට මේ හැඟීම හද තුළ දරාගෙන විඳගෙන සිටියද, එය ඔහුගේ හදෙහි ගැඹුරේම තැන්පත්ව තිබුණි. මෙම පාපී හැඟීම පාලනයකින් තොරවම පුපුරා ගියේ වන.

එය සිදු වූයේ, ඔහු නව ආශ්‍රමයෙහි ගත කළ දෙවැනි අවුරුද්දේදීය. එය සිදු වූයේ මෙසේය: ඒ පොක්රෝව් උත්සව සමයයි. ආශ්‍රමයේ ලොකු පල්ලියේ සන්ධ්‍යා පූජාවේ ගීතිකා ගැයෙන්නට විය. බැතිමත්හු බොහෝ දෙනෙක් පැමිණ සිටියහ. දේව මෙහෙය පවත්වන ලද්දේ, නායක පූජකවරයා විසිනි. තමාට හිමි තැන සිටගෙන සිටි සර්ජියස්, යාච්ඤාවෙහි ගැලී ඉන්නට වෑයම් කෙළේය. එහෙත් සැබැවින්ම සිදු වූයේ, තමා පූජාව නොපවත්වන අන් අවස්ථාවලදී හටගත් අභ්‍යන්තර කැලඹීමය. මෙම අභ්‍යන්තර කැලඹීමට හේතුව අමුත්තන් විසින්, කුලීන දායකයින් විසින්, විශේෂයෙන්ම කුලීන කාන්තාවන් විසින්, ඔහු තුළ ඇති කරන ලද

නොරිස්සීමය. ඔවුන් හඳුනාගත් බවක් නොඅඟවා සිටින්ට, පල්ලියේ සිදු වන දේවල් නොදැක්කා වගේ සිටින්ට, ඔහු වෑයම් කෙළේය. හරියට සොල්දාදුවකු ජන සමූහයා තල්ලු කොට ඉවත් කරමින් ඉහළ පෙළේ උදවියට ඉඩ සලසන අයුරින්, ඔහු පිරිස අතර සිටි කිසිවකු ගැන තැකීමක් නැතිව හැසිරුණේය. කාන්තාවෝ පූජකවරුන් එකිනෙකා දෙසට ඇඟිලි දිගු කරමින් සිටිති. ඔවුන් පෙන්වන්නේ, එක්කෝ ඔහුය. නැතිනම් වෙනත් හැඩකාර මුහුණක් ඇති කඩවසම් පූජකවරයෙකි. තමාගේ අවධානය ඉබාගාතයේ යනු වළක්වනු සඳහා, ඇස් වැසුමක් තනාගන්ටද ඔහු වෑයම් කෙළේය. එවිට ඔහුට පෙනෙනු ඇත්තේ, ප්‍රතිමා ආසනය ඉදිරියේ ඇති ඉටිපන්දම්, ප්‍රතිමා සහ දේව මෙහෙයෙහි යෙදී සිටින පැවිද්දන් පමණි. ඔහුට ඇසෙනු ඇත්තේ, ගයන හෝ කියන යාච්ඤාව පමණි. ඔහුට හැඟෙනු ඇත්තේ, යාච්ඤාවක් පුනරුච්චාරණය කරන හැම වතාවකදීම තමාට දැනෙන්නා වූ කාර්ය සිද්ධිය පිළිබඳ සංතෘප්තිමත් හැඟීමය. ඒ හැඟීම මීට පෙර බොහෝ වතාවලදී ඔහුට දැනී ඇත්තේද වෙයි.

ඔහු නැමීගෙන හෝ කුරුසය ලකුණු කිරීමෙන් හෝ යාච්ඤාව පැවැත්වෙන ස්ථානයෙහි සිටින්නට ඇත. ඔහු එහි සිටියේද, තමා තුළ වන නොපහත් හැඟීමද, එය පළවා හරින්නට ගත් වෑයමද අතර දෙපසට තල්ලු වෙමිනි. එවිටම, පල්ලියේ මූප්පුරාලද වන නිකෝඩින් පියතුමා ඔහු වෙත පැමිණියේය. මේ නිකෝඩින්ද, සර්ජියස් පියතුමා තුළ වේදනාකාරී පෙලඹවීමක් ඇති කළ තවත් පුද්ගලයෙක් විය. මන්ද යත්, අධිපති පූජකවරයා කෙරෙහි ඔහු තුළ පැවති බයාදුකමත්, හිත දිනාගන්නට කළ නිවටකමුත් සර්ජියස් තුළ ජනිත කෙළේ නොරිස්සුමකි. එසේම මේ පුද්ගලයා තමාට චාටු බස් තෙපලීමද සර්ජියස් රිස්සුවේ නැත. නිකෝඩින් පියතුමා හරියටම දෙකට නැමී අධිපති පූජකවරයාගේ පණිවිඩය දන්වා සිටියේය. අධිපති පූජකතුමා සර්ජියස් පියතුමා දේවස්ථානයේදී හමු වන බලාපොරොත්තුවෙන් සිටියි. සර්ජියස් තම ඇඳුම සකසාගෙන, හිසද ආවරණය කරගෙන, පිරිසටද හිරිහැරයක් නොවන පරිද්දෙන් ඔවුන් අතරින් හෙමින් සීරුවේ ඉදිරියට ගියේය.

"අර බලන්න ලිසා. අර දකුණු පැත්තෙ. ඒ, එයා තමයි." ගැහැනියකගේ කට හඬ නැගී ආයේය.*

* "Lise, regardez a droite, c'est lui"

"කොහෙද? එයා එච්චර ලස්සන නැහැනෙ."**

ඔවුන් කතා කරන්නේ තමා ගැන බැව් ඔහු දැන සිටියේය. මේ කතාබහ ඇසෙත්ම, ඊට පෙර තම ආත්ම ශක්තිය පිරිහුණු කෙනෙකුත් වතාවල කර ඇත්තාක් මෙන්, ඔහු තමාටම මෙසේ කියාගත්තේය.

"අප පෙලඹවීම්වලට යොමු නොකළ මැනව පියාණනි." නමාගත් හිසින්ද පහත් කළ නෙතින්ද යුතුව, දේශනා කුඩුවද පසු කොට පිළිම තැන්පත් කර ඇති පූජාසනය වෙතින් පෙළ ගැසී ඉදිරියට ඇදෙන සුදු වතින් සැරසුණු ගීතිකා කියන්නවුන්ද පසු කරමින්, ඔහු උතුරුදිග ද්වාරයෙන් ඇතුළු වුණේය. පූජා ස්ථානයට ඇතුළු වූ ඔහු, සාමාන්‍ය පැවැත්ම සේම, දේව ප්‍රතිමාව පසු කොට ගියේ නමාගත් හිසින් යුතුවය. ඉනික්බිතිව හිස කෙළින් කර අධිපති පූජකවරයා දෙසත්, ඔහු ළඟ දිලිසෙමින් සිටි රුව දෙසත්, ඔහු සිය නෙත් යොමු කෙළේය. එතැනට ඇතුළු වන මොහොතේදීම සිය නෙත් කොනින් ඒ දෙස බැලූ ඔහුට, කල් තියාම දෙදෙනාම දැකගත හැකි විය.

අධිපති පූජකයා බිත්තිය අද්දර හිටගෙනය. ඔහු තම මහත උදරය දෙසට දිගුව ඇති සිය පුෂ්ටිමත් බාහු යුගලයෙන් සිය පොරෝනයේ වූ රතින් වැඩ දැමූ කොටස පිරිමදිමින් සිටියි. ඔහු වෙත සිටි මිනිහා, හමුදාවේ කාර්ය මණ්ඩල ජනරාල්වරයකුගේ නිල ඇඳුමකින් සැරසීගෙනය. ඒ මිනිහා කවරකුදැයි, සර්ජියස් පියතුමා හමුදා ජීවිතයට හුරු පුරුදු වූ තම දෑසින් හඳුනාගත්තේය. අධිපති පූජකයා සිනාසෙන දෑසින් යුතුව කතා කරමින් සිටියේ හමුදා නිලධාරියා සමඟය. මේ ජනරාල්වරයා, කසාත්ස්කි කුමාරයාගේ රෙජිමේන්තු කොමාන්ඩර්වරයා විය. බැලූ බැල්මට මේ තැනැත්තා වැදගත් පුද්ගලයකු බැව් පෙනී ගියේය. එබැව් දත් අධිපති පූජකයා, ඒ ගැන සතුටට පත්ව සිටිනුද, සර්ජියස් පියතුමා වටහාගත්තේය. අධිපති පූජකයාගේ තට්ට හිසට යටින් ඇති රක්තවර්ණ මුහුණ, හුදු ප්‍රීතියෙන්ම ඔකඳ වී තිබුණි. මෙම දර්ශනයෙන් සර්ජියස් පියතුමාගේ සිත පෑරුණා පමණක් නොව, හෙතෙම කෝපයටද පත් විය. මන්ද

** "Ou, ou? Il n'est pas tellement beau"

යත්, අධිපති පූජකවරයා තමාට එන්නැයි කැඳවා ඇත්තේ, මෙකී හමුදා නිලධාරියාගේ කුතුහලය සංසිඳුවන්නට බැව්, ඔහු තේරුම්ගත් බැවිනි; එහිදී කියවුණු පරිදි, එක් කලෙක සිටි හමුදා සගයකු බලන්ට මේ හමුදා නිලධරයාට තිබුණු හිතේ පිපාසාව තේරුම්ගත් හෙයිනි.

"බොහෝම සන්තෝසයි. ඔබ මේ වාගෙ දේවදූත වේශයෙන් ඉන්නවා දකින්ඩ ලැබීම ගැන," සිය අත සර්ජියස් දෙසට දිගු කරමින් ජනරාල්වරයා පැවසීය. "මං හිතන්නෙ, ඔබට පැරණි සගයකු අමතක වෙලා නැතිව ඇති කියල."

ජනරාල්වරයාගේ වචනවලට අනුමැතිය පළ කරන අධිපති පූජකයාගේ අළු පැහැගත් රැවුලෙන් යුතු රතු මුහුණ සිනාවෙන් බැබළුණි. තෘප්තිමත් ප්‍රසන්නභාවයෙන් ජනරාල්වරයාගේ මුහුණද බැබළුණි. ඔහුගේ මුවින් වයින් සුවඳද, කොපුල් තල වසා තිබුණ රැවුලෙන් සුරුට්ටු සුවඳද වහනය විය. මේ සියල්ල සර්ජියස් පියතුමාගේ ආත්ම දමනයට අභියෝගයක්ම වූයේය. අධිපති පූජකවරයා ඉදිරියේ යළිත් හිස නැමූ හෙතෙම මෙසේ කීවේය.

"ඔබවහන්සෙ මට එන්න කිව්වෙ?"

සිය වචනවල විරාමයත් සමඟම, ඔහුගේ මුහුණින්ද මුළු ස්වරූපයෙන්මද අසන ලද්දේ, "කුමක් සඳහාද?" යන ප්‍රශ්නයයි.

"ඇයි, මේ ජනරාල්තුමා දකින්ට තමයි," අධිපති පූජකයා කියා සිටියේය.

සර්ජියස් පියතුමා සුදුමැලිව ගියේය.

"ස්වාමිනි," ඔහුගේ තොල් පෙති සැලෙන්නට වන්නේය. "ලෝකයෙන් අභිනිෂ්ක්‍රමණය කෙළේ පෙලඹවීම්වලින් මිදෙන්න. එහෙනම්, ඇයි ඔබවහන්සෙ මා ආයෙත් පෙලඹවීම්වලට ගොදුරු කරන්නෙ. මේ දෙවියන්ගෙ දේවස්ථානයෙදිම. යාච්ඤා කරන හෝරාවෙදිම.

"යන්ඩ. එහෙනම් යන්ඩ," මුහුණ රතු වුණු අධිපති පූජකයා රවාගෙන කෑගසන්ට වන්නේය.

තමා අහංකාර පරවශ වීම සම්බන්ධයෙන්, පසු දින සර්ජියස් පියතුමා, අධිපති පූජකවරයාගෙන් සහ සෙසු සහෝදර පූජක සමූහයාගෙන් සමාව අයැද සිටියේය. ඔහු එදින මුළු රාත්‍රියම යාච්ඤාවෙහි ගැලී සිටියේය. ඉන් පසුව, මෙම ආශ්‍රමයෙන් ඉවත්ව යාම මැනවැයි හෙතෙම තීරණය කෙළේය. මේ සම්බන්ධයෙන් මහානායක පූජකතුමන්ට ලියා දැන්වූ හෙතෙම, එතුමන්ගේ නායකත්වයෙහි පවතින ආශ්‍රමයටම ආපසු පැමිණීමේ අවසරය අයැද සිටියේය. තමා, තමාගේ දුර්වලකම දන්නා බැවිද, එකී පෙලඹවීම් මැඩගැනීමට නම්, නායක පූජකතුමාගේ අනුශාසනයත් ආධාරයත් අවශ්‍ය බැව්ද දන්වා සිටි හෙතෙම, තමාගේ පාපහරිත උඩඟුකම ගැන පාපෝච්චාරණයක්ද කෙළේය. ඊළඟ තැපෑලෙන් නාහිමි පූජකතුමන්ගෙන් පිළිතුරක් ලැබුණි. උන්වහන්සේ කියා සිටියේ, මේ සියල්ලට හේතුව ඔහුගේ අභිමානය බවය. එතුමන් කියා සිටියේ, සර්ජියස්ගේ එකී කෝපහරිත පුපුරාහැලීමට හේතුව, ඔහු දෙවියන් උදෙසා යටහත් පහත් වනු වෙනුවට, ඔහු පල්ලියේ ගරු බුහුමන්ද ධ්‍යානාන්තරද ප්‍රතික්ෂේප කර ඇත්තේ දෙවියන් උදෙසා කැප වීමකින් නොව, තමාගේ මානයද උඩඟුකමද තෘප්තියට පත් කරනු සඳහාම බවය; තමා, තමා වෙනුවෙන් කිසිවක්ම අපේක්ෂා නොකරන ගුණවත් තැනැත්තෙකැයි, තමාටම කියාගනු පිණිස බවය. ආශ්‍රමයේ අධිපති පූජකවරයා හැසිරුණු ආකාරය ඉවසා දරාගෙන සිටින්ට අපොහොසත් වූයේ ඒ නිසාය. දෙවියන් උදෙසා සියල්ල අතහළ තමා, දැන් අමුතු සත්වයකු සේ මහජන ප්‍රදර්ශනයට තබා ඇත්තේය වැනි හැඟීමක් තමන්ට දැනෙන්ට වූයේ ඒ නිසාය.

"ඔබ සියල්ල අතහැර ඇත්තේ දෙවියන් උදෙසා නම්, එය නොසලකා හරින්ට තිබුණා. ලෝකායත අභිමානය ඔබ තුළ තවමත් ජීවමානව පවතිනවා. පුතණුවනි, මම ඔබ ගැන මෙනෙහි කළා. දෙවියන්ට යාච්ඤා කළා. උන්වහන්සේ ඔබ වෙනුවෙන් මගේ සිතට ඇතුළු කෙළේ ඒ සිතිවිල්ලයි. කලින් හිටියා වගේම ඉන්න. යටහත් පහත්ව ඉන්න. ඔබ ගැන කල්පනා කරමින් ඉන්නැද්දී තමයි, මට ශුද්ධ වූ ඉලේරියන් තාපසතුමා, එතුමාගේ තාපසාරාමය තුළ මියගොස් සිටින බව දැනගන්න ලැබුණේ. ඔහු ඒ තාපසාරාමයේ අවුරුදු දහඅටක්ම හිටියා. අධිපති තම්බිනෝ විමසලා කියනවා, එහේ නවතින්න කැමති සහෝදරවරයකු ඉන්නවද කියලා.

ඒ අතර, ඔබේ ලියුමත් මට ලැබුණා. ගිහිල්ලා, තම්බිනෝගේ ආශ්‍රමයේ ෆායිසි පියතුමා හම්බ වෙන්ඩ. මමත් එයාට ලියන්නම්. ඉලේරියන්ගෙ කුටියෙ පදිංචි වෙන්න ඉල්ලා හිටින්ඩ. ඉලේරියන්ගෙ අඩුව පුරවන්න ඔබට පුළුවන් නිසා නොවෙයි. නමුත් ඔබට, ඔබේ මානය මර්දනය කරගැනීම සඳහා හුදකලා තැනක් අවශ්‍යයි. ඔබට දෙවියන්වහන්සේගේ ආශිර්වාදය ලැබේවා!"

සර්ජියස්, නාහිමි පූජකවරයාට කීකරු වූයේය. අධිපති පූජකතුමාට ලියුම පෙන්වූ හෙතෙම, ඔහුගෙන් අවසර ලබාගෙන තම කුටියත් ආශ්‍රමයේදී තමා සතුව තිබූ සියල්ලත් අතහැර දමා, තම්බිනෝ තාපසාරාමය බලා ගමන්ගත්තේය.

වාණිජ කුලයට අයත් අතිදක්ෂ කළමනාකාරයකුද වූ අධිපති පූජකවරයා, ගෞරවාන්විත නිහඬ පියොවින් යුතුව සර්ජියස් පිළිගත්තේය. ඇප උපස්ථාන කරනු සඳහා සහෝදරවරයකුද සමඟ, ඉලේරියන්ගේ කුටිය සර්ජියස්ට බාර කරන ලද්දේය. පසුව සර්ජියස්ගේ කැමැත්ත අනුව, ඔහුට එහි පූර්ණ හුදකලාවෙන් හිඳින්ට අවසර ලැබුණි.

මෙම කුටිය වූකලී, ගල් පර්වතයක් ඇතුළට හාරා සාදන ලද්දකි. ඉලේරියන් භූමදාන කරන ලද ඇතුළු ගැබක්ද එහි විය. පිටත වූ ගැබක කුඩා මේසයක්ද පොත් තබාගැනීමට රාක්කයක්ද ප්‍රතිමා කිහිපයක්ද තිබුණේය. බිත්තියේ මුල්ලක වූ කුහරයක පිදුරු මෙට්ටයක්ද විය. මෙම ගුහාවේ දොර අගුළු දැමිය හැකිය. එයට පිටින් තබා තිබුණු රාක්කයකි. දිනකට වතාවක් එම ආශ්‍රමයට පැවිද්දකු අත එවනු ලබන ආහාර වේල තැන්පත් කෙරුණේ එහිය.

සර්ජියස් පියතුමා, තාපසවරයකු බවට පත් වූයේය.

# IV

ඒවූකලී, සර්ජියස්, ශ්‍රෝවෙට්ඩ්හි හුදකලාවෙන් ගත කළ හයවැනි අවුරුද්ද විය.

ශීත නිවාඩු සමයේදී රස කැවිලි කමින් වයින් බොමින් ගත කරන විනෝද සවාරියක් සඳහා, අසල වූ නගරයට ධනවත් ගැහැනු පිරිමින්ගෙන් යුතු කණ්ඩායමක් පැමිණියේය. පැමිණ, ප්‍රදේශය නරඹනු සඳහා හිමයානා ගෙන්වාගත්තේය. පිරිසෙහි වූ දෙදෙනෙක් නීතිඥයෝ වූහ. තවෙකෙක් ධනවත් ඉඩම් හිමියෙකි. අනෙකා නිලධාරියෙකි. සෙසු සිවුදෙනා කාන්තාවෝ වූහ. නිලධාරියාගේ බිරිඳ, ඉඩම් හිමියාගේ බිරිඳ, ඇගේ අවිවාහක සොහොයුරිය සහ තවත් කාන්තාවකි. හතරවැන්නිය වූ ඇය දික්කසාද වූ ධනවත් රූමත් කාන්තාවකි. ඇයගේ අමුතු තාලයේ ගතිගුණද, අනියම් අනාචාර පැවතුම්ද, මුළු නගරයේම අවධානයටත් කතාබහටත් ලක්ව තිබුණි.

එය ඉතා කදිම සැන්දෑවක් විය. පාර සිනිඳුය. එතෙකුදු, දැඩිය. වර්ස්ට් දහයක් පමණ ගමන් කිරීමෙන් පසුව, ඔවුහු නැවතී සාකච්ඡා කරන්ට වන්හ. ඉදිරියට යනවාද? ආපසු හැරෙනවාද?



"මේ පාර යන්නෙ කොහාටද?" මැකෝව්කිනා නමැති රූබර දික්කසාද කාන්තාව ඇසුවාය.

"තම්බිනෝවලට", ඇගේ අනුග්‍රහය පතා සිටි නීතිඥයා පිළිවදන් දුණි. "ඒ කියන්නෙ, තවත් වර්ස්ට් දොළහක ගමනක්."

"එතකොට, තම්බිනෝවල ඉඳල කොහාටද?"

"එල්... නගරයට, තාපසාරාමය පහු කරල ගියාම."

"ඒ කියන්නෙ, සර්ජියස් පියතුමා ඉන්න තාපසාරාමය?"

"හරියට හරි."

"කසාත්ස්කි? ඔය කියන්නෙ, අර ලස්සන තාපසයා නේද?"

"හරියට හරි."

"නෝනාවරුනි, මහත්වරුනි, අපි තාපසාරාමය බලන්ඩ යමු. අපට විවේක ගන්ඩත්, ආහාර ගන්ඩත් හොඳම තැන තමයි, තම්බිනෝ."

"නමුත් අපට එහේ ගිහිල්ල, රෑ වෙන්ඩ ඉස්සර වෙලා නම් ආපහු එන්ඩ ලැබෙන එකක් නෑ."

"කමක් නෑ. අපි කසාත්ස්කිත් එක්කල රාත්‍රිය ගත කරමු."

"හොඳයි. ආශ්‍රමයේ නේවාසිකාගාරයකුත් තියෙනවා. කොහොමටත් නරක නෑ. මම මබින් නඩුවෙ වැඩ කරද්දි, එහේ නැවතිලා තියෙනව."

"හැබැයි, මට නම් ඒකෙ ඉන්ඩ බෑ. මම රාත්‍රිය ගත කරන්නෙ කසාත්ස්කිත් එක්ක."

"හ්ම්.... ඔයා වාගෙ අතිදක්ෂ කෙනෙකුට වුණත්, ඒක නම් කොහොමටවත් බැරි වේවි."

"කොහොමටවත් බෑ? හොඳයි, මොනවද ඔට්ටු?"

"හරි. බොහොම හොඳයි. ඔයාට එයත් එක්ක රාත්‍රිය ගත කරන්ඩ පුළුවන් වුණොත්, ඔයාට මගෙන් ඕනෑ කරන්නෙ, මොනවද කියල කියන්ඩ."

"මං ඉල්ලන ඕනෑම දෙයක්?"*

"එතකොට, ඒකම මටත් ඔට්ටුද?"

"සත්තකින්ම. එහෙම නම් අපි යමු."

ඔවුහු රියැදුරන්ට වයින් බොන්ට දුන්හ. තමන් උදෙසා පේස්ට්‍රිද, රසකැවිලිද, වයින්ද පිරුණු පැසක් එළියට ගත්හ. කාන්තාවෝ ඔවුන්ගේ සුදු පැහැති ලොම් කබා තුළ ගැලී ගැහි ගැහී සිටියාහ. මුලින් යන්නේ කවුදැයි, රියැදුරෝ මඳක් වාද කරන්ට වන්හ. ඔවුනතරින් තරුණ හාදයෙක් ඉස්සරහට පැන, සිය දිග කසය වනමින් අශ්වයින්ට කෑගැසීය. ගමනාරම්භ විය. මිණි ගෙඩි හඬවමින්ද, ධාවක අශ්වයින්ගේ හැගුම්බර කෙඳිරියෙන්ද යුතුව ගමන ඇරඹුණි.

හිමයානය පැද්දෙන්ටත් දෙදරන්ටත් විය. කීකරු අශ්වයෝ කඩිසර ලෙසද, සුව පහසුවෙන්ද දිව යන්නට වන්හ. සමතල පාර වේගයෙන් පස්සට, තව තවත් පස්සට, ඇදී ගියේය. වේගයෙන් කරත්තය පදවන රියැදුරා තෝන අතැතිව සිටියේ, කෙළිබරව මෙනි. ඉදිරි අසුනෙහි වාඩි වී සිටි නීතිඥයාත් නිලධාරියාත් තොරතෝංචියක් නැතිව, මැකෝව්කිනා සහ ඇය අසල වූ තැනැත්තිය සමඟ පලක් නැති දේ දොඩවන්ට වූහ. එතෙකුදු, මැකෝව්කිනා නිසලව සිටියාය. සිය සුදු පැහැති කබාය කිටි කිටියේ හැඳගෙන සිටි ඇය, තමාටම සීමා වූ සිතිවිලි දමක වෙලීගත්වනමය. හැම තිස්සේම එක වගේමයි. හැම තිස්සෙම පිළිකුල්සහගතයි. වයින් සහ දුම්කොළ ගඳ ගහන දිලිසෙන මුහුණු. හැම තිස්සෙම එකම කතාව. හැම තිස්සෙම එකම එක සිතිවිලි. හැම තිස්සෙම ඒ පිටිපස්සෙ තියෙන්නෙ එකම කුණුහරුපෙ තමයි. ඒ වුණාට, හැම දෙනාම බොහොම සතුටිනුයි ඉන්නෙ. හරියට ජීවත් වෙන්ඩ තියෙන එකම පිළිවෙළ ඒකයි කියල. ඒ ගොල්ලන්ට ඒ විදියටම මැරෙන දවස වෙනකම්ම යන්ඩ පුළුවනි.

* "A discretion ?"

නමුත් මට බෑ. මට නම් බෑ. මට මේ හැම දේම තිත්ත වෙලා. මට ඕනෑ කරන්නෙ ඒ හැම දෙයක්ම අනිත් පැත්ත පෙරළන්ඩ පුළුවන් දෙයක්. දෙදරල දාන්ඩ පුළුවන් දෙයක්. අර සරටෝව්වල ඉන්න කට්ටිය වගේ. සියල්ල අමුතු කරන්ඩ පුළුවන් දෙයක්. මරණ බය ඇති කරන්ඩ තරම් අමුතු දෙයක්. ඒ ගොල්ලො මොනවද කරන්නෙ? මොන ආකාරයටද හැසිරෙන්නෙ? මං හිතන්නෙ, වැදගැම්මකට නැති විදියට. හැම කෙනාම තමන්ටම සීමා වෙලා ඉන්නව ඇත්තෙ. ඉතින් මං වුණත් මොකද? මං ඉන්නෙත් වැදගැම්මකට නැති විදියට. නමුත් අඩුම තරමින් මගේ පෙනුම හොඳයි. මං ලස්සනයි. ඒ ගොල්ලො ඒක දන්නව. අර තාපසයා කොහොමද? මට නම් තේරෙන්නෙ නෑ. එයා ඇත්තටම ඒකට ආස නැතුවද? නෑ. එහෙම වෙන්ඩ බෑ. ඒක තමයි. ඒ ගොල්ලන්ට ඕනෑ කරන එකම දේ. පසුගිය ගිම්හාන කාලෙදි, අර කැඩෙට්වරයාට වාගෙ. ඒ මිනිහා අමුම අමු පල් මෝඩයෙක් නෙමෙයිද?

"ඉවාන් නිකොලයේවිච්," ඇය හඬ නගා කීවාය.

"මං ඔයාගෙ සේවයට සූදානම් වෙලයි ඉන්නෙ."

"එයාට වයස කීයද?"

"කාටද?"

"කසාත්ස්කිට"

"මගෙ හිතේ, හතළිහ පැනල ඇති."

"එයා එන හැම දෙනාම පිළිගන්නවලු නේද? මං අහල තියෙන්නෙ නම්, එහෙමයි."

"හැම දෙනාම. නමුත් මං හිතන්නෙ, හැම වෙලාවෙම නෙමෙයි."

"ඔය රෙද්ද මගෙ කකුල වටේ ඔතන්ඩ. එහෙම නෙමෙයි. ඔයාට ඒකවත් බැනෙ. තව... තව තදට. ඉතින් මගෙ කකුල් මිරිකන්ඩ ඕනැ නෑනෙ."

අන්තිමේදී ඔවුහු, කුටිය පිහිටා ඇති වනරොද සමීපයට පැමිණියහ.

හිමයානයෙන් බිමට බැසගත් ඕ, අනෙක් අයට යන්නැයි කියා සිටියාය. ඇගේ හිත වෙනස් කරන්ට සෙසු අය වෑයම් කළද, ඉන් සිදු වූයේ ඇය කේන්ති ගැස්වීම පමණි. ඔවුන්ට යන අතක යන්නැයි ඇය යළිත් ඉල්ලා සිටියාය. පිරිස පිටත්ව ගිය පසුව, ඇය සිය සුදු පැහැ කබායද හැඳගෙන පටුමග දිගේ ගමන් කරන්ට වූවාය. යානයෙන් බිමට බැස සිටි නීතිඥයා පමණක් එහි නැවතුණි. ඔහු නැවතුණේ සිදු වන්නේ කුමක්දැයි දැනගනු රිසිවය.

# V

ඒ වූකලී, සර්ජියස් පියතුමාගේ හුදකලා ජීවිතයේ සයවැනි අවුරුද්ද විය. දැන් ඔහුගේ වයස හතළිස්නවයකි. ජීවිතය ඉතා දුෂ්කරය. කටුකය. එය, ඔහු කිසි විටෙක අත්නොදුටු ආකාරයේ අභ්‍යන්තර අරගලයක් වූයේය. මේ අභ්‍යන්තර අරගලයට - කැලඹිල්ලට - හේතු දෙකක් තිබුණි. එකක්, සැකයයි. සංශයයි. අනෙක, කාමරාගයයි. ඒ දෙකම පැමිණියේ එකටමය. ඒ දෙක වෙන වෙනම බලවේග හැටියට ඔහු දුටුවේය. නමුදු, සැබැවින්ම ඒ හේතු දෙක එකක්ම වූයේය. සංශය හෙවත් සැකමුසුබව මැඩ පැවැත්වූ සැණින්ම, ඒ හිදැසට කාමරාගය ආවේය. එහෙත් ඔහු කල්පනා කෙළේ, ඒ දෙක එකිනෙකට වෙනස් යක්ෂයින් කියාය. එහෙයින් ඔහු සටන් කෙළේ, එකිනෙක වෙන් වෙන්ව ගෙනය.

"අනේ දෙවියනේ, මගේ ස්වාමිදරුවනේ," ඔහුගේ සිතිවිලි ගලා යන්ට විය. "ඇයි ඔබවහන්සෙ මට භක්තිය ලබා දෙන්නෙ නැත්තෙ? කාමරාගය - මට ඒක තේරුම්ගත හැකියි. කාමරාගය තමයි, ශාන්ත අන්තෝනිට පීඩාගෙන දුන්නෙ. ඒ වගේම තවත් අයට වද වේදනා ගෙන දුන්නෙ. නමුත් භක්තිය! ඔවුන්ට භක්තිය තිබුණා. නමුත් මට. ඇතැම් මොහොතක භක්තිය නැතිව යනව. සමහරවිට පැය ගණන් දවස් ගණන් සිත භක්තියෙන් තොර වෙනව. ලෝකය පවතින්නෙ ඇයි? ලෝකයේ සුන්දරත්වය ස්පර්ශ කිරීම පාපයක්



නම් - එය අත්හළ යුතු දෙයක් නම් - ලෝකය පවතින්නෙ ඇයි? ඔබවහන්සෙ පෙලඹවීම් කියල දෙයක් නිර්මාණය කෙළේ මොන එහෙකටද? පෙලඹවීම, ආශාව? මේ ලෝකයේ තියෙන ප්‍රීතිය ගෙන දෙන හැම දෙයක්ම අතහැර දමන්ට මා මෙහෙයවන්නේ, ඒ කාම තෘෂ්ණාවම නෙමෙයිද? මේ ලෝකයේ මම කියල වෙනම තැනක් නිර්මාණය වන්නෙ, එවිට නෙමෙයිද? ඇතැම් විට එහෙම දෙයක් නොවෙන්නමත් පුළුවනි."

එහෙත් මෙම සිතිවිල්ල ඔහුගේ සිතෙහි ජනිත වුණු සැණින්ම, ඔහු භීතියෙන් හැකිළුණි. ඔහු තුළ තමා කෙරෙහිම දැඩි පිළිකුලක් හටගැනිණි.

"මෘගයා, මෘගයා," හෙතෙම තමාටම කියාගත්තේය. "හොඳයි, සාන්තුවරයෙක් වෙන්ඩ හදන හැටි!"

ඔහු නැවත යාච්ඤා කරන්ට වන්නේය. එහෙත් ඔහු යාච්ඤා කරන්ට පටන්ගත් කෙණෙහි, හදිසියෙන්ම වාගේ ඔහු තුළ මතුව ආයේ විචිත්‍ර රුවකි. ඒ, ආශ්‍රමය තුළ පුද පූජා පිළිවෙත් කරන තමගේම ගරුගාම්භීරාකාර රූපයයි. ඔහු හිස සැලීය. "නෑ. ඒක සැබෑව නොවෙයි. ඒක බොරුවක්. නමුත් මට එයින් අනිත් අය

මුළා කරන්නට පුළුවනි. හැබැයි, මාව නෙමෙයි. දෙවියන්වහන්සෙත් නෙමෙයි. නෑ. මම ගරුගාම්භීර නෑ. මගේ ඇත්තේ හාස්‍යජනක දුක්ඛදායක ස්වරූපයක්." එසේ සිතමින් හෙතෙම, ලෝගුවේ වාටිය ඉවත් කොට, තමාගේ දෙකකුල් දෙස බැලීය. ඔහු තුළ මන්දස්මිතයක් නැගිණි.

ඉනික්බිතිව හෙතෙම සිය ලෝගුව සකසාගෙන, ඇඳිලි බැඳගෙන, බිම බලාගෙන යළිත් යාච්ඤා කරන්ට වන්නේය. ඔහුගේ යාච්ඤාවේදී මෙම වදන් පෙළද කියවුණි. "මේ මංචකය මගේ රන්සිවිගෙය වේවා." එය හරියට කිසියම් යක්ෂයකු විසින් කියන ලද මෙවන් වැකියක් මෙන් විය. "හුදකලා මංචකය, රන්සිවිගෙයක් - මිනී ගෙනියන දෙණක්ම - නේන්නම්. මුසාවාද. අමු මුසාවාද. තමා කම්සුවෙහි ගැලී පාපයෙහි යෙදුණු වැන්දඹු ස්ත්‍රියගේ දෙවුර, ඔහුගේ ස්මර්ණයෙහි ඡායාවක් මෙන් නැඟී ආයේය. මේ සිතිවිලි පළවා හැරි හෙතෙම, යාච්ඤාවෙහිම නිමග්න වූයේය. විනය නීති පද ගායනයෙන් පසුව, තෙස්තමේන්තුව අතින් ගත් හෙතෙම, නිකමට මෙන් එය දිග හැරියේය. දිග හැරුණේ, ඔහුට කට පාඩමෙන් කිව හැකි ඡේදයකි. මන්ද යත්, ඒ පාපය, ඔහු විසින් නිතර නිතර කියවන ලද්දක් වූ හෙයිනි.

"දෙව් සමිඳාණනි. මම ඔබවහන්සේ විශ්වාසය කරමි. මගේ අවිශ්වාසය දුරලන්නට, මට උපකාර කළ මැනව..." කිසියම් කෙනකු සිය සිරුර අස්ථාවර තැනක හොවන්නක් මෙන්, ඔහුද තමාගේ භක්තිය චංචල පදනමක් මත හොවාලීය. එසේ කොට, ආපසු හිටි තැනටම පැමිණියේය. මන්ද යත්, එය වැටෙතැයි ඔහුට සිතුණු හෙයිනි.

යළිත් ඔහු ප්‍රකෘති තත්වයට පැමිණියේය. ඔහුගේ සිතට සහනයක් දැනුණි. ළමා වියේදී කළ යාච්ඤාව ඔහු කියවන්නට වූයේය. "සමිඳාණනි, මා බාරගත මැනව. බාරගත මැනව." ඔහුට සහනයක් දැනුණා මතු නොවෙයි. ප්‍රමුදිත හැඟීමකින් සිත පිරී ගියේය. කුරුසය ඇන්ද හෙතෙම, තුනී පිදුරු මෙට්ටයක් අතුරා තිබුණු මිටි බංකුව මත වැතිරුණේය. ග්‍රීෂ්ම ඍතුවේදී අඳින සැහැල්ලු ලෝගුවක්, කොට්ටය වෙනුවට හිස යටින් තබාගත්තේය. ඔහු නින්දට වැටුණේය. එය සැහැල්ලු නින්දකි. ඔහුට ඒ නින්දේදීම

හිම යානයක ගෙජ්ජිවල කිංකිණි නාදය ඇසෙන්නට වන්නේය. එය සිහිනයක්ද, සැබෑවක්දැයි ඔහු නොදත්තේය. ඒ සමගම, දොරට තට්ටු කරන හඬකි. ඔහු එක පැහැර ඇහැරුණි. තමාගේම දෙසවන සැක කරමින් ඔහු නැගිට හිඳගත්තේය. යළි යළිත් දොරට තට්ටු කරනු ඇසෙයි. ඔව්. ඒ හඬ එතැනය. ඔහුගේ දොර ළඟය. ගැහැනියකගේ කටහඬ නැඟී ආයේය.

අහෝ දෙවියනි, එය ඇත්තක් විය හැකිද? තමා සාන්තුවරුන්ගේ ජීවිත ගැන කියවා ඇති කාරණය - ඇතැම්විට යක්ෂයා - සාතන් - ගැහැනියකගේ වේශයෙන් පැමිණෙතැයි කියන කාරණය - ඇත්තක් විය හැක්කේද? එසේය. එය ගැහැනියකගේ කටහඬය. ඒ තරම් මෘදු, ඒ තරම් බයාදු, ඒ තරම්ම සිත් වසඟ කරවන කටහඬකි. පළා යව, පළා යව.

ඔහු බිමට කෙළ ගැසීය.

නැත. එය ඔහුගේම මවාගැනීමක් විය හැක්කේය; සංකල්පනා මාත්‍රයක් විය හැක්කේය.

කොනක වූ පුංචි මේසයක් වෙත ගිය හෙතෙම, ඉතා පහසු සුමුදු පියොවින්, එතැන දණින් වැටුණේය. ඒ ශාරීරික ඉරියව්ව ඔහුට ඉතා හුරුය. ඔහු නිතර නිතර හිතේ සැහැල්ලුවත්, සුවයත් ලබාගන්නේ එමගිනි. සිය හිසකෙස් මුහුණ මතට වැටෙන සේ, හිස නමාගත් ඔහු, වයසට යාදී තට්ටය පෑදීමේ හේතුවෙන් දිගු වෙමින් තිබුණු නළල් තලය, තෙත බරිත සීතල කලාලය මත ඔබාගත්තේය. (ඒ කලාලය මුළු ගෙබිම පුරාම එලා තිබුණේද විය.)

මහත් වූ චිත්ත පීඩාවක් ඇති වුණු අවස්ථාවකදී, එය මැඩ ලනු සඳහා මහලු පයිමන් පියතුමා තමාට කියාදුන් දේව ස්තෝත්‍ර ගීතිකාවය, ඔහු ගායනා කරමින් සිටියේ. ඔහු නැඟී සිටියේය. ඔහුගේ නහර පෑදී ඇති, පහසුවෙන් වැනෙන කකුල් දෙක, වෑරුණු සිරුරු රාමුව දරා සිටියේය. යළිත් වරක් ගීතිකාව ගයන්නට සූදානම් වත්ම, ඔහුගේ සිත නිතැතින්ම ඇදී ගියේ, අර කටහඬ වෙතය. ඒ කටහඬට සවන් දෙන්නට ඔහුට ඕනෑ විය. සියල්ල නිශ්චලය. දිය වන හිම වතුර බිඳු වහලයෙන් පෙරී අවුත් බාල්දියට වැටෙන හඬ හැරෙන්නට, කිසිවක් ඇසෙන්ට නැත්තේය. නිවසෙන්

එපිට ලෝකය, තෙත බරිත සීතල මිහිදුම් ලෝගුව පොරවාගෙනය. සියල්ල නිශ්චලය. හොඳටම නිශ්චලය. ඉනික්බිතිව, හදිසියෙන්ම කවුළුව ළඟම සර සරස් හඬකි. පැහැදිලි නිරාකුල කටහඬකි. මුදු සුමුදු බයාදු ඒ කටහඬ, අන් කිසිවකුගේ නොව, වශීකර සුන්දර කතකගේ කටහඬකි.

"මට ඇතුළට එන්ඩ දෙන්න," කටහඬ කීය. "ක්‍රිස්තුස්ගේ නාමයෙන් මට ඇතුළට එන්ඩ ඉඩ දෙන්න."

හදවත තුළට රුධිරය ගලාවිත්, සැණෙකින් නවතිනු ඔහුට දැනුණි. ඔහුට හුස්ම අල්ලා සිටින්ට බැරි තරම්ය.

"සමිඳාණෝ නැඟී සිටින සේක්වා! සතුරන් වික්ෂේපයට පත් කරන සේක්වා!

"මං නපුරු භූතයෙක් නෙමෙයි," ඒ කටහඬ නිකුත් වුණු දොතොල මත සිනාවක් රැඳී ඇතැයි ඔහුට හැඟුණි. "මං නරක භූතයෙක් නෙමෙයි. මං අතරමං වුණු පවුකාර ගෑනියක් විතරයි. ඒ කියන්නෙ, ඇත්තටම පාර වැරදිලා. වෙන අදහසකින් කිව්වා නෙමෙයි." ඈය සිනාසුණාය. "මං ගල් වෙලා. මං අයැද සිටින්නෙ, මට ටිකකට නවතින්ඩ තැනක් දෙන්ඩ කියලා."

ඔහු, සිය මුහුණ කවුළු පියන්පත මත හොවාලීය. ඔහුට පෙනෙන එකම දෙය නම්, වීදුරුව මත වැටී ඇති ප්‍රතිමාව අසල පහනේ පිළිබිඹුව පමණි. ඉක්බිතිව, ඔහු නලල මත දෑත රුවාගෙන ඈතට එබී බැලීය. මිහිදුමෙහි ගැලී සිටින අන්ධකාරය පමණි. ගසක ඡායාවක් යාන්තමට පෙනෙයි. ඉන් දකුණට වන්නට - අතන - ගැහැනියකි. එල්ලා වැටෙන සුදු ලොම් කබායක්ද හැඳ සිටින, පුංචි හිස්වැසුමක් පැළඳගත් ගැහැනියකි. සිත් වසඟ කරන ඉතා රුසිරු ඒ මුහුණ කාරුණිකය. බියපත්ය. ඕ ඔහු දෙසට නැඹුරුව, ඔහුට අඟලක් හෝ දෙකක් දුරින් කවුළු වීදුරුවෙන් එහා සිටින්නීය. ඔවුන්ගේ දෑස් හමු වුණි. ඔවුහු එකිනෙකා හඳුනාගත්හ. ඔවුන් මීට කලින් හමුව සිටියා නොවෙයි. නැත. ඔවුන් කිසිවිටෙක හමු වී නැත. හුවමාරු වුණු ඒ බැල්ම තුළ තමන් - විශේෂයෙන්ම ඔහු - එකිනෙකා හඳුනතැයිද, එකිනෙකා වටහාගෙන ඇතැයිද, ඔවුන්ට දැනුණි. ඒ බැල්මෙන් ඉක්බිතිව, දුෂ්ට භූතයකු පිළිබඳ හැඟීමක්

පැවතිය නොහැක්කේය. නැත. ඕ ගැහැනියකි. චාම්, කාරුණික, සුන්දර, බයාදු ගැහැනියකි.

"ඔබ කවුද? ඔබට මොනවද ඕනැ," ඔහු ඇසීය.

"අනේ දොර අරින්ඩ." මුරණ්ඩු ලෙසද, උදාරම් ලෙසද ඇය පිළිවදන් දුන්නීය. "මම බාගෙට ගල් වෙලා, ඔබට කිව්වනෙ. මට පාර හොයාගන්ඩ බෑ."

"නමුත් මම මහණෙක්. තාපසයෙක්."

"ඉතින් දොර අරින්ඩකො. එහෙම නැත්නම්, ඔබට උවමනා කරල තියෙන්නෙ, ඔබ යාච්ඤා කර කර ඉන්නැද්දි, මං ඔබේ කවුළුව ගාව මැරිල වැටෙනව දකින්ඩද?"

"නමුත්, ඒක කරන්නෙ කොහොමද.....?"

"මම ඔබව කන්නෙ නෑ. දෙයියන්ගෙ නාමෙන්, මට ඇතුළට එන්ඩ දෙන්ඩ. මට ඒ තරම්ම සීතලයි."

මේ අතරවාරයේදී, ඇය තුළ තැතිගැන්මක්ද හටගති. ඇගේ කටහඬෙහි කඳුළුවල ඉඟියක්ද වී.

කවුළුවෙන් මෑත් වුණු ඔහු, කටු ඔටුනු පැළඳ සිටින ක්‍රිස්තු පිළිමයක් දෙස බැල්මක් හෙළීය. "සමිඳාණනි, මට උදව් කරන සේක්වා! අනේ සමිඳාණනි!" කුරුසය අඳිමින් බිම හෙව, ඔහු තොල් මතුරන්ට වූයේය. ඉන් අනතුරුව ආලින්දය වෙත පිය නැගූ ඔහු, අඳුරෙහිම පිටත දොරටුවේ අගුළ අල්ලාගන්ට වෑයම් කෙළේය. ඔහුට පිටත අඩි සද්දය ඇසුණි. ඇය කවුළුව වෙතින් ඉවත්ව දොර දෙසට එමින් සිටියාය.

"අනේ," හදිසියේම ඇය කෑගසන්නට වූවාය. එළිපත්ත ළඟ එකතු වී තිබුණු මඩ කඩිත්ත මතට, ඇය පැමිණියා විය හැක. ඔහුගේ දෑත් වෙවුලයි. අගුළ තදය. ඔහුට අගුළ අරින්ට බැරිය.

"දොර අරින්ඩ. අනේ. ඇයි, මාව මේ විදියට තියන්නෙ? මම සීතලට ගල් වෙලා. ඔබ හිතන්නෙ ඔබේ ආත්මය ගැන විතරයි. මං මෙතන සීතලේ ගල් ගැහිලා."

ඔහු දොර තදින් ඇද්දේය. අගුළ බුරුල් විණි. දොර ඇරුණි. පිටතට ඇරෙන දොර පියන් ඔහු තල්ලු කෙළේ, මඳක් තදිනි. දොර පියන ඇගේ සිරුරෙහි වැදුණි.

"අනේ මට සමා වෙන්ඩ," යයි ඔහු පැවසුවේ, හදිසියෙන් මෙන් තමාට සුපුරුදු පැරණි ආචාරශීලිබව පළ කරමිනි.

ඒ "සමාවේ" හඬට ඇය සිනාසුණාය. නැත. ඒ තරම්ම බැරෑරුම් නැත.

"නෑ. නෑ. ඒකට කමක් නෑ," යි කියන අතරම, ඇය දොරකඩෙන් ඇතුළු වූවාය. "මමයි සමාව ඉල්ලන්ඩ ඕනැ එක්කෙනා. මා අතින් කවදාවත්ම එහෙම දඩබ්බරකමක් සිදු වන්නේ නැහැ, නරකම භයානක තත්වයකට මං වැටුණෙ නැත්නම්."

"ඇතුළට එන්න"යි, ඇයට ඇතුළු වන්ට ඉඩ දෙමින්, ඔහු පැවසීය.

බොහෝ කලක් අමතකව ගොස් තිබුණු සුවඳ විලවුන්වල සියුම් සුවඳ තම නැහැ පුඩු මත තදින් වැදෙනු ඔහුට දැනුණි. දොරකඩ පසු කළ ඇය, ඇතුළු ගැබට පිවිසුණාය. ඔහු පිට දොර වැසූ නමුත්, අගුළ දැම්මේ නැත. උළුවස්ස පසු කළ ඔහු, කාමරය තුළට වැදුණේය.

"ජේසු සමිඳාණනි, දේව පුත්‍රයාණනි, පවුකාරයාට අනුකම්පා කළ මැනව. සමිඳාණන් වහන්ස, පවුකාරයකු වූ මට අනුකම්පා කරන සේක්වා!" ඔහු යාච්ඤා කරන්ට වන්නේය; තම හදවතින් පමණක් නොව, අයත්නයෙන්ම, දෙතොල්වල චලනයෙන්ද කියන්නට වන්නේය.

"ඔබ පහසු ආකාරයට ඉන්න," ඔහු කීය.

ඔහු දෙස කුතුහලයෙන් බලාගත්වනම, ඇය කාමරය මැද සිටගෙනය. ඇගේ සිරුරින් දිය බේරෙමින් තිබුණි. ඇගේ දෑස් සිනාසෙනු වැනිය.

"ඔබතුමන්ගේ හුදකලාව බිඳ දැමීම ගැන මට සමාවෙන්ඩ ඕනෑ. නමුත් මා ඉන්න තත්වය, ඔබතුමාට ජේනව ඇති. මේ සේරම

සිද්ද වුණේ..... අපි අශ්ව කරත්තවල ආවෙ. මම ඔට්ටුවක් ඇල්លුවා, වොරෝබියොව්කා ඉඳල තනියෝම ආපහු නගරයට එනවා කියල. නමුත් මට පාර වැරදුණා. මට ඔබේ කුටිය අහම්බෙන් හම්බ නොවුණා නම්...."

ඇය හඬන්නට වූවාය. ඔහුගේ මුහුණෙහි දිස් වූ ව්‍යාකූලතාව දුටු ඇයට, තවදුරටත් බොරු කියනු නොහැකි විය. ඇය බලාපොරොත්තුව සිටියේ, එයට වඩා හාත්පසින්ම වෙනස් දෙයකි. ඇය තම සිත්හි මවාගෙන සිටි පමණටම, ඔහු කඩවසම් නොවීය. එතෙකුදු, පැහෙන්නට වී ඇති ඔහුගේ බොකුටු රැළි සහිත හිසකෙස් හා රැවුළ, මොනවට කැපී පෙනෙන ඍජු නාසය, තමා දෙස කෙළින් බලන විට දැවී දිලිහෙන ගල් අඟුරු කැට වන් ඔහුගේ කළු දෙනෙත - යන මේ සියල්ල හේතුවෙන්, ඔහු ඉතා සුන්දර යයි ඇයට සිතුණි.

ඇය කියන්නේ මුසාවක් බව ඔහුට වැටහෙයි.

"ඔව්. මට පේනවා," ඔහු කීය. ඇය දෙස බැලූ ඔහු, යළිත් තම දෑස පහත් කරගති. "මම දැන් යන්නම්. ඔබ පහසුවෙන් ඉන්න."

ලාම්පුව අතට ගත් හෙතෙම, එහි ඉටිපන්දමක් දල්වා, ඇයට හිස නමා, පසු පස පිහිටි කුඩා කාමරය තුළට පිවිසියේය. එසැණින්ම වාගේ, කාමරය වෙන් කෙරෙන බෙදුම අතරින්, බරැති කිසියම් දෙයක් එහා මෙහා කරනු ඇයට ඇසුණි.

"බාගෙවිට, මං ඇතුල් වෙයි කියල, දොර අවුරනවා වෙන්න ඇති." එසේ සිතන්නට වූ ඇය, තමා සමඟම සිනාසුණාය.

ඇඳ සිටි දළ ලොම් කබාය ගලවා ඉවත විසී කළ ඕ, හිස්වැස්මද ඉවත් කළාය. හිස් වැස්ම කෙස්වල ඇලී තිබුණු අතර, ගොතන ලද සාළුවේද පැටලී තිබුණි. කවුළුව ළඟ සිට ඔහුට කතා කරන විට, ඇයට බිඳකුදු සීතල දැනුණේ නැත. ඇය එසේ කීවේ, ඇතුළට එන්ට ඔහු පොළඹවාගැනීම උදෙසා පමණි. එහෙත් දොරටුව වෙත පැමිණෙන විට, මඩකඩිත්ත තුළ ඇගේ දෙපා ගිලුණි. දන් ඇගේ වම් පාදයේ වළලුකර දක්වාම තෙත බරිත වූයෙන්, සපත්තුවෙහිද පිට පාවහනෙහිද වතුර පිරුණි. ඉතා පටු බංකුවක් වූ ඔහුගේ ඇඳ මත හිඳගත් ඇය, සපත්තු ගලවන්ට වූවාය. ඇඳ මත වූයේ, ඉතාම තුනී පිදුරු ඇතිරිල්ලක් පමණි. තමා දූන් සිටින මේ

කුටිය, අපූරු නොවේදැයි ඇය සිතන්නට වූවාය. එය, පවිත්‍රතාවෙන් බබළන, ආර්ශින්* තුනේ හතරේ ප්‍රමාණයේ පටු කුඩා කාමරයකි. ඇය හිඳගෙන සිටින බංකුවත්, එයට උඩින් බිත්තියේ සවි කර ඇති පොත් රාක්කයත් හැරෙන්නට, අන් කිසිදු ගෘහභාණ්ඩයක් එහි නොවීය. ඔව්, අමතර දෙයකට තිබුණේ, බිත්ති කොනක වූ ධර්ම ග්‍රන්ථ තබන පුංචි මේසයකි. දොරට සමීපව බිත්තියේ ගසා තිබුණු ඇණ දෙකක, ඔහුගේ ලෝගුවත්, ලොම් කබායත් එල්ලා තිබුණි. පොත් මේසයට ඉහළින්, කටු ඔටුනු පැළඳි ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රතිමාවකි. එය ඉදිරියේ ගලින් නෙලන ලද පහනක් දැල්වෙමින් තිබුණි. මුළු කාමරය පුරාම ලාම්පු තෙල්ද, දහදියද, පස්ද මුසු වීමෙන් නැගුණු අමුතුම සුවඳක් වහනය වෙමින් පැවැත්තේය. ඒ සියල්ල ඉතා ප්‍රසන්නයැයි ඇයට සිතුණි. ඒ සුවඳ පවා ඇයට දැනුණේ ප්‍රසන්න ලෙසිනි.

තමාගේ තෙත් වුණු දෙපා - විශේෂයෙන්ම, වම් පාදය - හේතුකොටගෙන, ඇයට අසීරුවක් දැනුණි. එසැණින්ම, ඒ අසීරුවෙන් මිදෙන්ට වෑයම් කළ ඕ, මුළු කාලය පුරාම සතුටු සිතින් තමා සමගම සිනාසුණාය. ඔට්ටුව දිනූ නිසාම නොවෙයි; තියුණු පෞරුෂයකින් හෙබි, අතිප්‍රභාමත්, ඉතා කඩවසම් මේ පිරිමි ප්‍රාණියාගේ ආත්මය තුළ තමා විසින් ඇති කරන ලද කැලඹීම නිසාය. ඇය ඒ බව දැන සිටියාය. ඇත්ත. ඔහු එයට ප්‍රතිචාර නොදැක්වූ බව ඇත්තය. ඒ වුණත් මොකද?

"සර්ජියස් පියතුමනි, සර්ජියස් පියතුමනි, ඒ ඔබේ නම නෙමෙයිද?"

"ඔබේ බලාපොරොත්තුව කුමක්ද?" පිළිතුරක් හැටියට, ඔහුගේ සිහින් කටහඬ ඇසුණි.

"ඔබේ හුදකලාව බිඳ දැමීම ගැන, අනේ මට සමාවෙන්ඩ. මට වෙන කරන්ඩ දෙයක් තිබුණෙ නෑ. ඇත්තටම නෑ. මට සනීප නෑ. මේ දැනුත් මගෙ මුළු සරීරෙන්ම වතුර බේරෙනව. කකුල් දෙක හිම වගේ හීතල වෙලා."

---

* අඟල් විසිඅටක් (28) දිගැති රුසියානු මිනුමක්.
Arshin or Arshine or Archin or Archine - Russian unit of length equal to 28 inches (Webster's Third New International Dictionary)

"මට කණගාටුයි," ඒ දුර්වල හඬින්ම පිළිතුරු ලැබුණි. "නමුත් මට කරන්ඩ පුළුවන් කිසිම දෙයක් ඇත්තෙ නෑ."

"එහෙම නොකර ඉන්ඩ තිබුණ නම්, මම කොහෙත්ම ඔබට බාධා කරන්නෙ නෑ. මම නවතින්නෙ, එළි වෙන තුරු විතරයි."

ඔහු පිළිතුරු දුන්නේ නැත. ඔහු කොඳුරනු ඇයට ඇසුණි. ඔහු යාච්ඤා කරනවා ඇතැයි ඇයට සිතුණි.


"ඔබ එළියට එන්නෙ නෑ නේද?" සිනාසෙමින් ඕ විචාලාය. "මොකද, මං ඇඳුම් ගලවන්ඩ ඕනෑ, ඒවා වේලගන්ඩ."

ඔහු පිළිතුරු දුන්නේ නැත. කොඳුරමින් යාච්ඤා කරන ඔහුගේ ඒකතානමය කටහඬ ඇයට ඇසුණි.

"මිනිහෙක් ඉන්නව. නියම මිනිහෙක්," වතුර පිරී ඇති පාවහන් ගලවන්ට තැත් කරමින්, ඇය සිතන්නට වූවාය.

කොතරම් ඇද්දත්, පිට පාවහන් ගලවන්ට අමාරුය. මෙසේ පිට පාවහන් දෙක එළියට ඇදීම, ඇයට විනෝදයක් ගෙන දුන්නේය. ඇසෙන තරමට, ඇය සිනාවක් නැගුවාය. තමාගේ සිනා හඬ ඔහුට ඇසෙන්ට ඇති බවත්, එයින් තමා බලාපොරොත්තු වුණු ප්‍රතික්‍රියාව ඔහු තුළ සිදු වන්ට ඇති බවත් හොඳින්ම දැන සිටි ඇය, වඩාත් හඬ නගා තවත් සිනාසෙන්ට වූවාය. සැබැවින්ම, ඇගේ සිනාව - එය සොම්නස්සහගත අනායාස කාරුණික සිනාවකි - ඔහු තුළ කැලඹීමක් ඇති කෙළේ, ඇය ආශා කළ ආකාරයටමය.

"ඔව්," ඇය සිතන්නට වූවාය. "කාට වුණත්, ඒ වාගෙ මිනිහෙකුට ආදරය කරන්ඩ පුළුවන්. ඒ ඇස්. එයාගෙ මුහුණ. සරල තමයි, ඒත් උදාරයි. කොඳුරමින් යාච්ඤා කරනවා. මොන බොරුද? ඔය යාච්ඤාවලින් ඒ රාගාධිකකම යටපත් වෙනවද? ඒවයින් මේ ගෑනුන්ව රවට්ටන්ඩත් පුළුවනිද? එයා, මූණ ජනේලයට තද කරගත්ත වෙලාවෙම, මාව දැක්කා. අඳුනගත්තා. එයාට ඒක තේරුණා. අඳුනගත්තු බව, එයාගේ ඇස්වල දීප්තියෙන්ම පෙනී ගියා. මගේ රූපය එයාගෙ ඇස්වල ඇඳිල ගියා. මට ප්‍රේම කරන බව - මට ආශා කරන බව - එයා හොඳටම තේරුම්ගත්තා. ඔව්, ඒ ආශාව."



අන්තිමේදී ඇය පාවහන් සහ පිට පාවහන් ගලවා දැම්මාය. තවමත් දෙකකුල්වල පැළඳ සිටින දිග මේස් යුවළ ගලවා දමන්ට ඇත. ඒ සඳහා සාය උඩට එසවිය යුතුය. ඇයට විළියක් දැනුණි. ඇය හඬගෑවාය.

"එළියට එහෙම එන්ඩ එපා."

එහෙත් අනිත් කාමරයෙන් පිළිතුරක් ලැබුණේ නැත. ඒ ඒකතානමය කෙඳිරිල්ල, දිගටම පැවතුණි. කිසියම් චලනයක හඬක්ද ඇයට ඇසුණි.

"බිම දිගා වෙලා, යාච්ඤා කරනව වෙන්ඩ ඇති," ඇය තමාටම කියාගත්තාය. "නමුත් ඒකෙන් එයාට හොඳක් වෙන්නෙ නෑ. එයා හිතන්නෙ මං ගැන. මම එයා ගැන හිතනව වගේම. මගේ මේ කකුල් දෙක ගැන, මට හිතෙනව වගේම එයත් හිතනව....." දිග මේස් යුගලය ගලවා ඉවත දැමූ ඇය, සිය නිරුවත් දෙපා පිදුරු මෙට්ටය මත රැඳවූවාය. ඇය සිය දෙපා මෙට්ටය යටට ඔබාගත්තේ එමගින් ලැබෙන උණුසුම පතාය. එපරිදි දෙපා මෙට්ටයෙන් යට කරගෙන මොහොතකට හිඳගත් ඕ, සිය දණ යුවළ දෑතින් වැළඳගෙන, සිහිනයකින් මෙන් බිත්තිය දෙසම බලාගෙන සිටියාය. ඈ තුළ එකිනෙක සිතිවිලි පහළ වන්නට විය. "ඉතින් මොකද? අපි ඉන්නෙ වෙනත් මනුෂ්‍ය වාසයක් නැති වනාන්තරයක. ශ්..

කියලවත් සද්දයක් නෑ. කිසිම කෙනෙකුට, කවදාවත්ම දැනගන්ට ලැබෙන එකක් නෑ."

නැගී සිටි ඕ මේස් යුගලය අතට ගෙන, එය උඳුන ළඟ ඇති තෙත මාත්තු කරන තැන එල්ලුවාය. ඇය ආපසු කාමරය තුළට පැමිණ පැදුර මතින් පියවර තබමින්, යළිත් බංකුව උඩ හිඳගත්තාය. දූත් අනෙක් කාමරයෙන් කිසිම සද්දයක් ඇහෙන්නේ නැත. තමාගේ ගෙල වටා බැඳි නූලකින් එල්ලෙන පුංචි ඔරලෝසුව දෙස බැලූ ඇය, ඒ වන විට වෙලාව පාන්දර දෙක බැව් වටහාගත්තාය. හිම යානා ආපසු එන්නේ පාන්දර තුනටය. තව ඉතිරිව ඇත්තේ එකම එක හෝරාවක් පමණි.

ඒ පැයත් ගත වන්නේ හුදකලාවමද? විකාර. එහෙම වෙන්ඩ දෙන්ඩ බෑ. මේ මොහොතේම වහාම ඔහුට අඬගසන්ට ඕනෑය.

"සර්ජියස් පියතුමනි ! සර්ජියස් පියතුමනි ! සර්ජි දිමිත්‍රියේවිච්! කසාත්ස්කි කුමාරයාණනි !"

අනෙක් කාමරයෙන් කිසිම හඬක් නැත.

"ඔබතුමා ඔය තරම් නපුරු වෙන්නෙ කොහොමද? මම කොහොමටවත් කතා කරන්නෙ නැහැ, එහෙම නොකර ඉන්ඩ පුළුවන් උණා නම්. අවශ්‍යතාවයක් නොතිබුණා නම්. මට සනීප නෑ. මට මොනව වෙලාද කියල, මං දන්නෙ නෑ." ඇය හඬන්නට වූවාය; දුකෙන් වේදනාවෙන් පිරුණු හඬින් හඬන්නට වූවාය. "අනේ රත්තරන්, අනේ රත්තරන්...." එසේ කියමින් ඇය බංකුව මත වැතිරගත්තීය. එවිට, තමාට ඇත්ත වශයෙන්ම සනීප නැතැයි ඇයට දැනුණි. තමාට හොඳටෝම සනීප නැතැයි ඇයට සිතුණි. ඇගේ මුළු සිරුරම කකියන්ට විණි. උණ ගැනුණු කලෙක මෙන්, ඕ වෙවුලන්ට වූවාය.

"අනේ එළියට ඇවිල්ල, මට උදව් කරන්ඩ. මං දන්නෙ නෑ, මට මක් වෙලාද කියල. අනේ රත්තරන්, අනේ රත්තරන්."

ඇය සිය ඇඳුමේ ගාංචු ගලවා දැම්මාය. ඇගේ ළය මඬල සපුරාම නිරාවරණය විය. දෑත දෙපසට විදහාගත් කල, වැලමිට දක්වාම ඇය නිරුවතිනි.

"අනේ රත්තරන්, අනේ රත්තරන්."

මේ වන තුරුම ඔහු, පසුපස කාමරයේ සිටගෙන සිටියේ යාච්ඤා කරමිනි. සැන්දෑවේ ගායනා කරන සියලුම යාච්ඤා පාඨ, මේ වන විට කියා අවසන්ය. සිය නාසයේ කෙළවර මත දෑස රඳවාගෙන, ඔහු නිසලවම සිටගෙනය. ඔහු ඇතුළතින් - සිය ආත්මයෙන් - යාච්ඤා කරමින් සිටින්නේ වෙයි.

"ජේසු සමිඳාණනි, දේව පුත්‍රයාණනි, මට අනුකම්පා කළ මැනව."

නමුදු, ඔහුට ඒ සියල්ල ඇසී තිබුණි. ඇය ඇඳුම ඔසවන කල, ඒ සේද ඇඳුමින් නැගුණු සරසරය, ඇගේ නිරුවත් දෙපා පැදුර ස්පර්ශ කරන හඬ. තෙත දෙපා පිරිමදින සීරුව - මේ සියල්ල ඔහුට ඇසුණි. දැනුණි. තමාගේ දුර්වලකම ඔහුට දැනුණි. කවර මොහොතක හෝ තමා පරදින වග, අනාථ වන වග, ඔහුට හැගුණි. එහෙයින් ඔහු නොනවත්වාම යාච්ඤා කරන්නට වන්නේය. දෑස ඉදිරියෙහිම රඳවාගෙන, කිසි විටෙක ආපසු නොබලමින් ජය කණුව වෙත ගිය සුරංගනා කතාවේ සිටි වීරයා ගැන ඔහුට සිහි විය. තමාට කරන්ට ඇත්තේද එපමණි. එකී වීරයා වගේම, තමා වටා ඇති අන්තරාය - විනාශය - මඟ හැර යා යුත්තේය. කිසි විටෙක එදෙස ඇහැක් ඇර බැලිය යුත්තේවත් නැත. තමාද ඒ සියල්ලෙන් වැළකී සිටිය යුතුය. එහෙත්, එමොහොත, ඒ දෙස හැරී බලන ආශාව විසින් ඔහු වෙලාගනු ලැබීය. ඇය කතා කෙළේ ඒ මොහොතේදීමය.

"ඔබ හරිම අමානුෂිකයි. මං මැරෙන්ඩ පුළුවනි."


එසේය. ඔහු ඇය වෙත යා යුත්තේය. මෛථුනය අපේක්ෂාවෙන් පැමිණි තැනැත්තිය මත එක අතක්ද, අනෙක් අත ගිනි කබල තුළද රුවාගත් ඒ ශුද්ධවන්ත පූජකවරයා කළාක් මෙන්, ඔහුද ඇය වෙත යා යුත්තේය. එහෙත් ඔහු වෙත ගිනි කබලක් නොවීය. ඔහු සිය කාමරය සිසාරා නෙත් යොමා බැලීය. එහි වූයේ ලාම්පුව පමණි. ඔහු ගිනි දැල්ල මත ඇඟිල්ලක් තබාගත්තේය. වේදනාව විඳිමින්ම, ඔහු බැම හකුළාගෙන ගිනි දැල්ල දෙස බලාගෙන සිටියේය. සෑහෙන වෙලාවක් යන තුරුම කිසිවක් නොහැගුණි. නමුත් හදිසියේම, ඔහුට කිසිවක් දැනෙන්ට විය. එය වේදනාවක්ද? කොතරම් වේදනා දෙන්නේද? ඒ කිසිවක් ගැන, ඔහු තුළ නිනව්වක්

නොවීය. කලකිරීමෙන් යුතුව මුහුණ පුලුටු කරගත් හෙතෙම, වහා ඇඟිල්ල ඉවතට ඇදගත්තේය. නැත. ඔහුට එය කළ නොහැක.

"දෙවියන්ගෙ නාමෙට, අනේ ඇවිදිල්ලා, මට උදව් කරන්ඩකො. අනේ මං මැරෙන්ඩ එනවා."

ඔහු එය කළ යුතුද? ඉන් පසුව විනාශ විය යුතුද? නැත. ඔහු එසේ කළ යුතු නැත.

"මම මොහොතකින් එනවා," දොර විවෘත කරමින්ම ඔහු කීය. ඇය දෙස නොබලා කාමරය තුළින් ගමන් කළ ඔහු පිටත කුටියට පිවිසුණි. හැම දිනෙකම ඔහු දර කැපුවේ එහිදීය. අඳුරේම අත පත ගෑ ඔහුට දර කපන පුවරුව හසු විය. ඒ මත බිත්තියට හේත්තු කර තිබුණු කෙටේරියද ඔහුට සොයාගත හැකි විය.



"එක මොහොතක්," ඔහු යළිත් කීය. ඔහු සිය දකුණු අතෙහි කෙටේරිය රඳවාගෙන, වම් අතේ දබරැඟිල්ල පුවරුව මත තැබීය. කෙටේරිය ඉහළට එසවූ ඔහු, සැණෙකින් ඇඟිල්ලේ දෙවන පුරුකට පහළින් වදින සේ කෙටේරි තලය වේගයෙන් පහළට පාත් කෙළේය. ඒ තරමට ගනකම ඇති දර කැබැල්ලක් කැපී වෙන් වෙනවාටද වඩා පහසුවෙන්, ඇඟිල්ල කැපී වෙන් වුණි. උඩට වීසි වුණු ඇඟිලි කොටය, පළමුව පුවරු කොනෙහි හැපී, පසුව බිමට වැටුණි.

කැපී වෙන් වුණු ඇඟිලි කොටය බිම වදින හඬද ඔහුට ඇසුණේය. තවමත් ඔහුට වේදනාවක් දැනුණේ නැත. වේදනාවක් නැතැයි සිතුණු ඒ මොහොතේම, වේදනාව ආවේය. තියුණු, දැවෙන වේදනාවකින් ඔහු සැලී ගියේ වන. සිය අතේ ඇඟිලි මතට ලේ විදිනු ඔහුට දැනෙන්ට විය. ඔහු සැණෙකින් ලේ ගලන ඇඟිලි කොටය ලෝගුවේ රැළි අතර රුවාගනිමින්, සිය අත සිරුරට තද කරගති. ඉනික්බිතිව ඇය සිටි කාමරයට ගිය ඔහු ඇය ඉදිරියේ සිටගත්තේය. දෑස පහත් කරගෙන ඔහු සෙමෙන් මෙසේ ඇසීය.

"ඔබට අවශ්‍ය මොකක්ද?"

ඔහුගේ සුදුමැලි වූ මුහුණත්, වම් කොපුලෙහි ගැස්මත් ඇගේ නෙත ගැටුණි. හදිසියේම ඇයට දැනුණේ ලජ්ජාවකි. වහා නැඟී සිටි ඇය, කබායද සියතින් ගෙන එය ඇඟ ලාගත්තාය.

"මම වේදනාවෙනුයි හිටියෙ..... මගෙ ඇඟ සීතල වෙලා සන්නියක් හැදෙන්ඩ ආවා. මම.. මම.. සර්ජියස් පියතුමනි........ මම...."

ඔහු හිස ඔසවා බැලීය. කිසියම් සොම්නස් හැඟුමකින් ඔහුගේ දෑස් දිලිසුණි. ඔහු මෙසේ කීය.

"දයාවන්ත නැගණිය, ඔබේ සනාතන ආත්මය අඳුරු කරගන්ඩ හදන්නෙ මොන එහෙකටද? පෙලඹවීම, මේ ලෝකයේ තියෙනව තමයි. නමුත් පෙලඹවීමට වසඟ වුණු අයට හිමි වන්නෙ, ඛේදය විතරයි.... දෙවියන්වහන්සේට යාච්ඤා කරන්ඩ. උන්වහන්සේ සමාව දෙනවා ඇති."

ඔහුගේ කතාවට සවන්දීගෙනම, ඕ ඔහුගේ මුහුණ දෙස බලාගෙන, ඔහු ඉදිරියේ සිටගෙනය. හදිසියේම බින්දු බින්දු කිසිවක් බිම වැටෙනු ඇයට ඇසුණි. ඇය බිමට නෙත් යොමා බැලුවාය. ලෝගුවේ රැළි අතර රුවාගෙන සිටි ඔහුගේ අතින් රුධිරය වැගිරෙනු ඇය දුටුවේ එමොහොතෙහිදීය.

"ඔබතුමා, ඔබතුමාගෙ අතට කරගත්තෙ මොකක්ද?"

ඇය තමාට ඇසුණු සද්දය ගැන සිහි කළාය. ලාම්පුව දෑඩිව අල්ලා අතට ගෙන, ඇය පිට දොරටුව ළඟට දිව්වාය. එතැන, ලේ වැකුණු ඇඟිලි කොටය, බිම වැටී තිබෙන අයුරු ඇය දුටුවාය. ඔහුටත් වඩා සුදුමැලි වුණු ඕ, ආපසු පැමිණියාය. ඔහුට කතා කරන්ට, ඇයට වුවමනා විය. එහෙත් ඔහු හෙමින් සැරේ පිටුපස කාමරය තුළට වැදී දොර වසාගත්තේය.

"මට සමා වෙන්ඩ," ඇය කීවාය. "මගේ පව් සමා කරගන්ඩ, මං මොනවද කරන්ඩ ඕනැ."

"යන්ඩ."

"ඇඟිල්ල වෙලන්ඩ, මට ඉඩ දෙන්ඩ."

"යන්ඩ."

නිහඬතාවෙහි ගැලුණු ඕ, හදිසියේම ඇඳුම් හැඳගත්තාය. හැඳ පැළඳගෙන කබායද ලාගෙන, හිඳගත්වනම බලා සිටියාය. එමොහොත, හිම යානයේ සීනු හඬ ඇසුණි.

"සර්ජියස් පියතුමනි, මට සමාවෙන්ඩ."

"යන්ඩ. දෙවියන්වහන්සේ සමාව දේවි."

"සර්ජියස් පියතුමනි, මං මගේ පිළිවෙල වෙනස් කරගන්නවා. මාව අතහැරල දාන්ඩ එපා."

"යන්ඩ."

"මට සමා වෙන්ඩ. සමා වෙලා, මට ඔබේ ආශිර්වාදය ලබාදෙන්ඩ."

"පියාගේත්, පුත්‍රයාගේත්, පිතෘ සාන්තුගේත් නාමයෙන් යන්ඩ." කුටිය තුළින් ඒ කටහඬ නැගී ආයේය.

ඈය ඉකි ගසමින් කුටියෙන් පිට වූවාය. ඈය මුණ ගැසෙනු සඳහා නීතිඥයා ඉදිරියට පැමිණෙමින් සිටියේය.

"හොඳයි. මං පරාද වුණා. මට වාසනාවක් නෑ. ඔයා ඉඳගන්නෙ මොන ආසනේද?"

"කොයික වුණත් කමක් නෑ."

ඈය හිම යානය තුළට ඇතුළුව වාඩි වූවාය. නගරයට පැමිණෙන තෙක්ම, ඈය වචනයකුදු නොතෙපලාය.

ඊට වසරකට පසුව, තමාටම ප්‍රතිඥාවක් දුන් ඕ, තාපසිකාරාමයකට ඇතුළුව, දැඩිතර ආගමික ජීවිතයක් ඇරඹුවාය. ඒ, ආර්සේනි නම් තාපසිකාවක හෙවත් මෙහෙණියකගේ මඟපෙන්වීම යටතේය. ඉඳහිට, ඇයගේ ලියුම් කියුම් ලියන කියන ලද්දේද, ඒ මෙහෙණිය විසිනි.

# VI

සර්ජියස් පියතුමා තව අවුරුදු හතක් සිය ආරණ්‍ය සේනාසනයේ ජීවත් වූයේය.

පටන්ගැන්මේදී ඔහු පරිභෝජනයට ගත්තේ, තමා වෙත ගෙනෙනු ලැබූ කිරි, සීනි, තේකොළ, සුදු පාන්, රෙදි පෙරෙදි සහ දරය. එහෙත් කල් ගතව යාදී, ඔහුගේ ජීවිතය වඩ වඩාත් අල්පේච්ඡ වන්ට වූයේය. සුව පහසු ජීවනයට අයත් සියලු චර්යාවන් අත්හළ ඔහු, අන්තිමේදී රළු වූ කළු පාන් පමණක් ආහාරයට ගන්ට පුරුදු වූයේය. එද ඔහු පිළිගත්තේ, සතියකට වරක් පමණි. තමා වෙත ගෙනෙනු ලැබූ අන් සියලුම දේ, ඔහු දුගී ජනයාට පිරිනැමීය.

ඔහු කාලය ගත කෙළේ කුටිය තුළට වී යාච්ඤා කිරීමෙන් සහ තමා වෙත පැමිණෙන ආගන්තුකයින් පිළිගැනීමෙනි. මේ ආගන්තුකයන්ගේ සංඛ්‍යාවද එන්ට එන්ටම වැඩි වූයේය. ඔහු කුටිය හැර ගියේ පල්ලියට යාම සඳහාත්, දර හෝ ජලය ලබාගැනීම සඳහාත් පමණි. ඔහු පල්ලියට ගියේ, වසරකට දෙවරක් හෝ තුන් වරක් හෝ පමණි.

දික්කසාද වුණු තැනැත්තියගේ රාත්‍රිගත ආගමනය සිදු වූයේ, ඔහුගේ පැවිදි ජීවිතයෙන් පස් අවුරුද්දක් ගත වූවායින් පසුවය. එදින ඇය තුළ සිදු වුණු චිත්ත විපර්යාසයත්, අන්තිමේදී ඇය තාපසිකාරාමයකට ඇතුළුවීමත් යන මේ කාරණා, දනන් අතර පතළව ගියේ වන. ඒ හේතුවෙන් සර්ජියස් පියතුමා වඩාත් ප්‍රසිද්ධියට පත් වූයේය. අමුත්තෝ විශාල සංඛ්‍යාවක් පැමිණෙන්ට වන්හ. ඔහුගේ කුටිය අසල පැවිද්දෝ පදිංචියට පැමිණියාහ. පල්ලියක් මෙන්ම ලැගුම්ගෙයක්ද එහි ඉදි විණි. සර්ජියස් පියතුමා පිළිබඳ ප්‍රසිද්ධිය - බොහෝ විට එය අතිශයෝක්තියට නඟන ලද්දක් විය - තව තවත් පැතිර ගියේය. දුර ඈත පළාත්වල සිට පවා බැතිමත්තු මහ පිරිසක් ඇදී එන්ට වූහ. රෝගාතුර වූවාහුද, වේදනාවෙන් පරිපීඩිත වූවාහුද, ඔහු වෙත ගෙනෙන ලද්දාහ. මේ හැමදෙන සුවපත් කිරීමේ හැකියාවක්, ඔහු වෙත වී යැයිද කියවිණි.

සර්ජියස් පියතුමන් විසින් මුලින්ම රෝගියකු සුව කරන ලද්දේ, ඔහුගේ තාපස ජීවිතයේ අටවැනි අවුරුද්දේදීය. දිනෙක කිසියම් මවක්, තම තුදුස් වියැති පිරිමි දරුවා තාපසාරාමය වෙත ගෙන ආවාය. දරුවාගේ සිරුර මත පියතුමාගේ අත තබන මෙන්, ඇය ඔහුගෙන් බලවත් සේ ඉල්ලා සිටියාය. තමාට රෝගීන් සුවපත් කළ හැකි යයි, ඊට පෙර කිසිම දිනෙක සර්ජියස් පියතුමාට සිතුණේ නැත. එවැනි හැඟීමක් ඇති කරගැනීම පාපකාරී වෙතැයි ඔහුට සිතුණේය. එහෙත් දරුවාගේ අම්මා බිම වැතිර, ඔහු වෙත වැඳ වැටී, යළි යළිත් එම ආයාචනයම කළාය. පියතුමා අනෙක් අයට නම්, බොහොම උපකාරී වී ඇත. ඇය කීවාය. ඉතින් තමාගේ දරුවා සුවපත් නොකරන්නේ මන්ද? කිතු සමිඳුන්ගේ නාමයෙන්, ඇය බැගෑපත්ව ඉල්ලා සිටියාය. රෝගීන් සුවපත් කළ හැක්කේ දෙවියන්වහන්සේට පමණකැයි, ඔහු මේ කාන්තාවට පැවසුවද, ඇය එය පිළිගත්තේ නැත. තමා ඉල්ලා සිටින්නේ, දරුවාගේ සරීරය මත අත තබා යාච්ඤා කරන ලෙස පමණි. ඇගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කළ සර්ජියස් පියතුමා, සිය කුටිය තුළට වැදගති.

පසු දින ඔහු වතුර ගෙනෙන්ට යාම සඳහා පිටතට පැමිණි කල, ඒ කාන්තාව සුදුමැලිව ගිය කෙට්ටු තුදුස් වියැති දරුවා සමඟ බලා සිටිනු ඔහු දුටුවේය. ඒ සිසිර සමයේ රාත්‍රි කාලය ඉතා සීතලය.

එනමුදු දරුවාත් කැටුව පැමිණි කාන්තාව, පියතුමා ඉදිරියෙහි යළි යළිත් කන්නලව් කරන්ට වන්නීය. දුෂ්ට නඩුකාරයා පිළිබඳ උපහැරණ කතාව, සර්ජියස් පියතුමාට සිහිපත් විය. එමොහොත වන තුරුම ඔහු සිතා සිටියේ, කාන්තාවගේ ආයාචනය ප්‍රතික්ෂේප කිරීම මැනවැයි කියාය. එහෙත් දැන්, ඒ අධිෂ්ඨානයෙහි පිහිටා සිටීම ගැන ඔහු තුළ සැක සාංකා ඇති වන්ට විය.



මෙම අතීරණයෙන් පරිපීඩිත ඔහු, කුටිය තුළට වැදී යාච්ඤා කරන්ට වන්නේය. නිසි තීරණයකට පැමිණිය හැකි වන පමණට සිත සන්සුන් වන තෙක්ම, ඔහු යාච්ඤා කෙළේය. ඔහුගේ තීරණය වූයේ කාන්තාවගේ ඉල්ලීම අනුව ක්‍රියා කළ යුතු බවය. ඇයගේ භක්තියෙන්, දරුවාගේ දිවි ගැලවෙනු ඇත්තේය. මේ කාරණයේදී තමා - සර්ජියස් පියතුමා - යනු, දෙවියන්වහන්සේගේම නොවටිනා මෙවලමක් පමණි.

යළිත් වරක් තම කුටියෙන් පිටතට පැමිණි සර්ජියස් පියතුමා, කාන්තාව වෙත ගොස් ඇගේ ඉල්ලීම ඉටු කෙළේය. ඔහු දරුවාගේ හිස මත සිය අත තබාගෙන යාච්ඤා කරන්ට වන්නේය.

ඔවුහු පිටත්ව ගියාහ. මසකට පසුව දරුවා සුවපත්ව සිටිනු දක්නා ලදී. රෝගීන් සුව කිරීම පිළිබඳ සර්ජියස් පියතුමාගේ මේ ආශ්චර්යමත් ශක්තිය ගැන හැම දෙසම පතළව ගියේය. ජනතාව විසින් දූන් ඔහු හඳුන්වනු ලබන්නේ, සර්ජියස් ඍෂිවරයා යනුවෙනි. එතැන් සිට ඔහු වෙත රෝගීන් නොගෙනෙනු ලැබූ එකද සතියක්වත් නොවීය. එක් තැනැත්තකුගේ ආයාචනයට නැමුණු පසුව, සෙසු අයවලුන්ගේ ඉල්ලීම් ඉවත දැමිය නොහැකි විය. ඔහු ඔවුන් මත සිය අත තබා යාච්ඤා කෙළේය. බොහෝ දෙන සුවපත් වූහ. ඔහුගේ යසෝරාවය නන් දෙස පැතිරුණි.

වසරින් වසර ගෙවී ගියේ එපරිද්දෙනි. ආශ්‍රමයේ අවුරුදු නවයක්ද, තාපසාරාමය තුළ අවුරුදු දහතුනක්ද එසේ ගෙවී ගියේය. දූන් වනාහි, සර්ජියස් පියතුමන් වන්දනීය චරිතයකි. ඔහුගේ රැවුළ දිගය. එය අළු පැහැ ගැන්වී ඇත. ඔහුගේ හිසකෙස් තුනී වී ඇති නමුදු, තවමත් බොකුටුද කළු පැහැද විය.

# VII

සති කිහිපයක් ගත වන තුරුම, සර්ජියස් පියතුමාගේ සිත පිරී තිබුණේ එක් මුරණ්ඩු සිතිවිල්ලකිනි. තමා දැන් සිටින තත්වය ගැන බලන විට, තමා කරන්නේ නිවැරදි දෙයද? එය තමාගේ කැමැත්ත අනුවම - අභිප්‍රාය අනුවම - කරන දෙයක්ද? මේ සියල්ල පටන්ගත්තේ, අර තුදුස් වියැති ළමයා සුවපත් කිරීමත් සමඟය. එතැන් සිට ගත වුණු හැම මාසයක්ම, සතියක්ම, දවසක්ම කියා පෑවේ, තමාගේ අභ්‍යන්තර ජීවිතය ක්‍රම ක්‍රමයෙන් කඩා වැටෙමින් පවතින බවය; එතැන ඇති වන හිදැස පිරවෙන්නේ සම්පූර්ණයෙන්ම බාහිර වූ ජීවිතයකින් බවය. එක විදියකට බැලුවාම, ඒ වනාහි තමාගේ ජීවිතය කණපිට හැරවීමකි.

තමාගේ එකම කාර්යභාරය වී ඇත්තේ, ආශ්‍රමයට පැමිණෙන අමුත්තන් ආකර්ෂණය කිරීමත්, ඔවුන්ගෙන් ආශ්‍රමයට ලැබෙන පරිත්‍යාග භාරගැනීමත් පමණක් නොවේදැයි ඔහු පසක් කෙළේය. ඒ අතර, ආශ්‍රමයේ බලධාරීන්ට අවශ්‍ය වූයේ, ඔහුගෙන් උපරිම ඵල ප්‍රයෝජනය ලබාගැනීමය. ඔවුන් විසින් ඒ සඳහා ඔහු මෙහෙයවනු ලැබීය. ඒ හේතුවෙන්ම ඔහුට සිරුර වෙහෙසන කිසිම ව්‍යායාමයක යෙදීමට අවසර නොලැබුණි. අවශ්‍ය සියලු දේ ඔහු වෙත සැපයිණි. ඔවුන් ඔහුගෙන් ඉල්ලා සිටියේ, එකම දෙයක් පමණි. ඔහු තමා වෙත

පැමිණෙන දනන් පිළිගෙන, ඔවුන්ට ආශ්‍රීවාද කළ යුතුය. එපමණි. ඔහුට වඩාත් පහසුකම් සලසනු උදෙසා, අමුත්තන් පැමිණිය යුතු දවස්ද විධිමත් ක්‍රමයකට යොදන ලද්දේ විය. පිරිමි සඳහා පිළිගැනීමේ කාමරයක් ඉදි විණි. වැටකින් කොටු කරන ලද කොටසක් ඔහු උදෙසා විය. එවිට ඔහුට ළඟා වීමට පොදි කන ගැහැනුන්ගේ දෙපාවලින් ඔහු නොපෑගෙනු ඇත. ඔහුට එතැන සිට සිය ආශ්‍රීවාදය ලබාදිය හැකිය. ඔහුට මේ කිසිවකට අනුකූලතාවක් නොදක්වා සිටිනු නොහැකි විය. මන්ද යත්, ඔවුන් තර්ක කෙළේ, මිනිසුන්ට අවශ්‍ය නම්, ඔහු එයට ඉඩ දිය යුතු බවය. ඒ වනාහි ප්‍රේම කිරීමේ - මෛත්‍රිය දක්වීමේ - ක්‍රිස්තුස්තුමන්ගේ නීතියට කීකරු වීමය. එය ප්‍රතික්ෂේප කරන්ට ඔහුට අයිතියක් ඇත්තේ නැත. මේ මිනිසුන්ගේ ඉල්ලීම් ඉටු නොකර සිටීම කෘෘරකමකි. ආශ්‍රමයේ බලධාරීන් තර්ක කෙළේ එපරිද්දෙනි.

මෙම දිනචර්යාව වෙතට වඩ වඩාත් ඇදී යෙත්ම, ඔහු පසක් කෙළේ, තමාගේ අභ්‍යන්තර ලෝකය බරපතළ වෙනසකට පාත්‍ර වෙමින් තිබෙන වගය; එය වඩාත්ම බාහිර ලෝකයකට පරිවර්තනය වෙමින් පවත්නා වගය. තමා තුළ වූ ප්‍රාණයේ ජලය සිඳී යෙමින් ඇත්තේය. තමා වඩ වඩාත් කවරම දේ කළ මුත්, එය කර ඇත්තේ මිනිසා වෙනුවෙනි; දෙවියන් වෙනුවෙන් නොවෙයි.

අනුශාසනා හෝ හුදෙක් ආශ්‍රීවාද කිරීමේදීවත්, රෝගීන් උදෙසා යාච්ඤා කිරීම හෝ යහපත් දිවිමග සඳහා ඔවුන්ට උපදෙස් දීමේදීවත්, තමන් විසින් සුවපත් කරනු ලැබූවන්ගේ කෘතඥතාව පිළිගැනීමේදී හෝ බැතිමතුන් ශික්ෂණයේදීවත්, ඔහු තුළ සංතෘප්තියක් ඇති වූයේ නැත. තම ව්‍යායාමයන්ගේ ප්‍රතිඵල ගැනවත්, මේ ජනතාව කෙරෙහි වූ තමාගේ බලපෑම ගැනවත් ඔහු තුළ පැහැදීමක් - සතුටක් - හටගත්තේ නැත. තමා දල්වෙමින් පවතින විලක්කුවක් පමණක් නොවේදැයි ඔහුට සිතුණි. මේ හැඟීම වඩ වඩාත් ගැඹුරට දැනෙත්ම, තමා තුළ දල්වෙමින් පැවති දෙවියන්වහන්සේගේ සත්‍යයේ ආලෝකය නිවී යෙමින් පවතිතැයි ඔහුට දැනෙන්ට විය. ඔහු දෙවියන් වෙනුවෙන් ඉටු කළ මෙහෙවර, කවර නම් මට්ටමක වීද? මිනිසුන් වෙනුවෙන් කළ මෙහෙවර, කවර මට්ටමක වීද? මේ ප්‍රශ්නය අනවරතයෙන්ම ඔහුට පීඩා ගෙන දුන්නේය. ඒ ප්‍රශ්නයට පිළිතුරු දෙනු තබා, කෙළින් මුහුණ දෙන්ටවත් කිසි විටෙක ඔහු

සමත් වූයේ නැත. තම ආත්මය පත්ලෙහි දෙවියන් වෙනුවෙන් කළ යුතු වූ මෙහෙය පැවති තැන, මිනිසුන් වෙනුවෙන් කළ යුතු කාර්යයන් රැසක්, සාතන් විසින් ආදේශ කරනු ලැබ ඇති බවක් ඔහුට පසක් විණි. තමා හුදකලා වාසයෙන් ඈත් වී සිටින බැව් ඔහුට වැටහිණි. අමුත්තන් ඔහුට බරක් විය. ඔවුන් විසින් ඔහු වෙහෙසට පත් කරන ලද්දේද විය. එතෙකුදු, තමා වටා නද දුන් ප්‍රශංසා නාදයෙන්ද, ඔහු සතුටට පත් නොවුණා නොවේ.

මෙතැන - මේ ආශ්‍රමය - අතහැර මිදී යන්ට ඔහු සිත හදාගෙන සිටි අවධියක්ද විය. තමා විසින් කළ යුතු කාරියද, ඔහු සැලසුම් කර තිබුණි. ගොවි ඇඳුමක් - කමිසයක්, කලිසමක්, කබායක් සහ තොප්පියක් - සපයාගෙනද තිබුණි. තමාට ඒවා අවශ්‍ය වන්නේ, පිනට දීමට යයිද, ඔහු කියා සිටියේය. කුටියෙහි මේ ඇඳුම් තැන්පත් කර තැබූ ඔහු, කිසියම් දිනෙක ඒවා ඇඳ පැළඳ කොණ්ඩයද කොටට කපාගෙන පිටව යන අයුරුද සැලසුම් කෙළේය. මුලින්ම දුම්රියෙන් වර්ස්ට් තුන්සියයක් පමණ යා හැක. පසුව දුම්රියෙන් බැස ගමින් ගමට යමින්, පිටිසර පෙදෙස්වල ඇවිදිය හැකිය. එක් දිනෙක, වයසක සොල්දාදුවෙක් ඔහු වෙත පැමිණියේය. ඔහු දිවි ගැටගහගත් අයුරුද, ආහාර සහ රාත්‍රියට නවාතැන් ඉල්ලාගත් අයුරුද ගැන, සර්ජියස් පියතුමා විමසා සිටියේය. සොල්දාදුවා පැවසුවේ, එය ගැටලුවක් නොවන බවය. ආහාර සහ ඉඳුම් හිටුම් ලබාගත හැකි පහසු තැන්ද, ඔහු දැන්වීය. මහලු සොල්දාදුවා කරන දේම කරමැයි, සර්ජියස් පියතුමා සනිටුහන් කරගත්තේය. පිටව යන බලාපොරොත්තුවෙන් ඔහු එක් රැයෙක ගොවි ඇඳුම් ඇඳගත්තේය. යනවාද? නවතිනවාද? හොඳම දේ කුමක්දැයි ඔහු දැන සිටියේ නැත. තීරණයක් නැතිවම ඔහු කලක් ගත කෙළේය. පසුව, ඔහුගේ අතීරණය පහව ගියේය. පුරුදු ජීවිතයටම හුරු වී ඔහු සාතන්ට යටත් විය. අර ගොවි ඇඳුම්, ඔහුගේ සිතිවිල්ල පිළිබඳ සිහිවටනයක් බවට පත්ව, කුටියෙහිම තැන්පත්ව තිබුණි.

හැම දිනෙකම මිනිස්සු වැඩි වැඩියෙන් පැමිණියාහ. මිනිසුන් වැඩි වන පමණට, යාච්ඤාවටද ආධ්‍යාත්මික රැකවරණයටද ඇති කාලය අඩු වන්ට විය. සතුටු සිතින් සිටි ඇතැම් අවස්ථාවලදී ඔහුට සිතුණේ, තමා කිසියම් කලෙක පැවත්තාවූ දිය උල්පතකට සමාන බවය.

"උල්පතක් තිබුණි. සජීවී ජලය උනන මෘදු උල්පතක් තිබුණි. මා තුළ උනන්ට වූ ඒ සිහිල් ජලය මා වෙතින් ගලා ගියේය. ඒ නම්, සත්‍යයේ ජීවිතයයි. ඇය මා පොලඹවාගන්ට පැමිණි ඒ දවස ....." ඔහු එදවසත් ඇයත් සිහි කෙළේ ඉමහත් ප්‍රමෝදයකිනි. "ඇය මා පොලඹවාගන්ට පැමිණි විට, ඇය ඒ පවිත්‍ර ජලය බුක්ති වින්දාය. නමුත් දැන්, ඒ දිය දහර එක්රැස් වන්නට පෙරම, පිපාසිතයෝ පැමිණෙති. එකිනෙකා තෙරපාගෙන පොරකමින් පැමිණෙති. ඔවුන් විසින් මේ උල්පත පාගා දමා ඇත. දැන් එය මඩ ගොහොරුවක් පමණි."

තමාගේ ජීවිතයේ වඩාත්ම යහපත් දුර්ලභ අවස්ථාවන් ගැන, ඔහු කල්පනා කෙළේ එපරිද්දෙනි. එතෙකුදු වුවත්, ඔහුගේ ජීවිතයේ සුපුරුදු සාමාන්‍ය තත්වය වූයේ, බලවත් තෙහෙට්ටුවකි; ඒ තෙහෙට්ටුව තුළින් නිපන් ස්වයං ප්‍රශංසාවකි.

* * * * *

ප්‍රිපොලොවේනියේ උත්සවයට ඉතා ආසන්නව පැවති ඒ වසන්ත සමයේදී, සර්ජියස් පියතුමා තම ලෙන් පල්ලියේදී සන්ධ්‍යා පූජාව පවත්වමින් සිටියේය. පිරිස විසිදෙනෙක් පමණ පැමිණ සිටියහ. ඊට වඩා පිරිසකට, ඒ ලෙන තුළ ඉඩක් නැත. පැමිණ සිටි ඒ හැමදෙනාම ධනවත් වෙළඳුන්ගෙන් හා සෙසු මහත්තැන්ගෙන් සැදුණු පිරිසක් වූහ. සර්ජියස් පියතුමා, පැමිණෙන සියලුදෙනාම පිළිගත්හ. එහෙත් ඔහුගේ ආවතේව සඳහා සිටින පැවිද්දාත්, ආශ්‍රමයේ සිට දිනපතා එවන සහායකයාත් විසින් පැමිණෙන පිරිස අතරින් අවශ්‍ය අයවලුන් පමණක් තෝරා බේරාගෙන, ඔහු වෙත යොමු කරන ලදහ. එහි පිටත තවත් අසූවක් පමණ වන්දනාකරුවෝ - ඔවුනතරින් වැඩි දෙන කාන්තාවෝ වූහ - එළියට පැමිණෙන සර්ජියස් පියතුමාගේ දර්ශනයද, ඔහුගේ ආශිර්වාදයද අපේක්ෂාවෙන් රැඳී සිටියහ.

දේව පූජාව පැවැත්වෙමින් තිබුණි. ගීත ගායනා කෙරෙන අතර, සර්ජියස් පියතුමා තමාගේ පූර්වගාමී පූජකවරයාගේ මිනීවළ වෙතට ළඟා වෙමින් සිටියේය. හදිසියේම, ඔහුගේ සිරුර පසෙකට ඇල වුණි. ඔහු පිටුපස සිටි වෙළෙන්දකු සහ උපස්ථායක දේවගැතියා විසින් අල්ලා නොගන්ට, ඔහු බිම ඇද වැටෙන්ට ඉඩ තිබුණි.

''ඇයි මොකද, මොකද? සර්ජියස් පියතුමනි, අපේ දයාවන්ත පියතුමනි, මොකද වුණේ?'' ගැහැනු කටහඬ නැගුණි. ''ජේසු ස්වාමිදරුවන් අප රැක දෙන සේක්වා! ඔබවහන්සේගේ මූණ සුදුමැලි වෙලා. සුදු පාට කඩදාසියක් වාගෙ.''

එහෙත් ඉක්මණින් යථා තත්වයට පත් වූ සර්ජියස් පියතුමා, වෙළෙන්දාත් දේවගැතියාත් ඉවත් කර, සුදුමැලි මුහුණින් වුව, ගීතිකා ගායනය කරන්ට වන්නේය. දේවගැති සෙරපියොන් පියතුමාද, සෙසු පරිවාරකයෝද, සර්ජියස් පියතුමා ගැන සොයා කියා රැකබලාගැනීමෙහි නියුතු, නිතරම ඔහුගේ තාපස කුටිය අසලම ජීවත් වූ සොෆියා ඉවනොව්නාද යන මේ හැමදෙනම ඉල්ලා සිටියේ, දේව මෙහෙය නවත්වන ලෙසය.

''නෑ. ඒකට කමක් නෑ,'' උඩු රැවුළ යටින් මතු වන තොල්පෙති මත වූ සිනාවක සේයාවක්ද පළ කරමින් ඔහු කීය. ''පූජාවට බාධා කරන්ඩ එපා.''

''සාන්තුවරු කෙළේ එහෙමයි'', ඔහු තමාටම කියාගත්තේය.

ඒ සමගම ''සාන්තුවරයාණෙනි, දෙවියන්වහන්සේගේ ශුද්ධ වූ සුර දූතයාණනි,'' යන වදන් සොෆියා ඉවනොව්නාගේ මුවින් නිකුත් විණි. ඒ අතර, ඔහුට වාරු දුන් වෙළෙන්දාගේ කටහඬද නැගී ආවේය. එහෙත්, ඔවුන්ගේ ඉල්ලීමට සවන් නොදුන් ඔහු, සිය ගායනය දිගටම කරගෙන ගියේය. සියලු දෙනාම පොදිකමින් ඒ පුංචි පල්ලියේ ගෘහ තීරයට ආපසු පැමිණියහ. මඳක් සංක්ෂිප්තව මුත්, ඔහු දේව මෙහෙය පවත්වා අවසන් කෙළේය.

දේව මෙහෙය අවසන් කළ සැණින්ම, පැමිණ සිටි සියලු දෙනාටම ආශීර්වාද කළ සර්ජියස් පියතුමා, දොරටුවෙන් පිටව ගොස්, ලෙන් දොරටුව ඉදිරියෙහි වූ එල්ම් ගසක් යට තබා තිබුණු බංකුවක් මත හිඳගත්තේය. නැවුම් වාතාශ්‍රය ලබමින් මඳක් විවේක ගනිමැයි ඔහුට සිතුණි. මන්ද යත්, තමාට මඳ විවේකයක් අවශ්‍ය යයි ඔහුට දැනුණු බැවිනි. එහෙත් මොහොතකින් ඔහු, තමාගේ ආශීර්වාදයද උපදේශයද පිහිටද ඉල්ලා බලා සිටින පිරිස ඉදිරියෙහි පෙනී සිටියේය. එක ශුද්ධ භූමියකින් තවත් ශුද්ධ භූමියකටද, ආධ්‍යාත්මික ශාස්තෘවරුන් වෙතින් තවත් ආධ්‍යාත්මික ශාස්තෘන්

වෙතටද යමින්, එවන් ශාස්තෘවරයකු දුටු මතින් නෙත්වල කඳුළු පිසිමින් වන්දනාවේ යමින් සිටින කාන්තාවෝද ඔවුනතර වූහ. සර්ජියස් පියතුමා ඒ කාරණය දැන සිටියේය; ඉතාම සාමාන්‍ය, ශ්‍රද්ධාවෙන් ඉතාම හීන, සීතල හදැති, ඉතාම සාම්ප්‍රදායික වූ මේ පිරිස ගැන, සර්ජියස් පියතුමා දැන සිටියේය. මේ වන්දනාකරුවන් අතර බොහෝ විට සිටියේ, සේවාමුක්ත සොල්දාදුවන්ය. කවර හේතුවක් නිසා හෝ ඔවුන්ට සාමාන්‍ය ජීවිතය නැතිව ගොස් තිබුණි. දරිද්‍රතාවයෙන් පරිපීඩිත මහල්ලෝද ඒ අතර වූහ. ඔවුන්ගෙන් බේබද්දන් වූ වැඩි දෙනකු වන්දනා නඩ සමඟ ආශ්‍රමයෙන් ආශ්‍රමයට ගියේ, මග දිගට ලැබෙන දාන වේල බලාපොරොත්තුවෙනි. මේ වන්දනාකරුවන් අතර ගොවියෝද සිටියහ. සුවපත් කරනු ලැබීම සඳහා හෝ අවශ්‍යයෙන්ම ලෞකික දේවල් පිළිබඳව උපදෙස් පතා හෝ ඔහු වෙත පැමිණ ආත්මාර්ථකාමී ඉල්ලීම් ඉදිරිපත් කළ නූගත් ගැහැනු මිනිස්සුද කොතෙකුත් වූහ. මේ පිරිස උපදෙස්ද පිහිටද ඉල්ලා සිටියේ - දුවක විවාහ කරදීම, ගමේ සාප්පුවක් කුලියට දීම, ඉඩමක් මිලට ගැනීම, දරුවකු පාපයට යොමු වීම, කසාදයක් කැඩී යාම - ආදී වශයෙන් වූ ලෞකික කාරණා සඳහාය.

බොහෝ කලෙක සිට මේ සියල්ල තමාට ඉතා හුරු පුරුදු දේවල් බැවින්, සර්ජියස් පියතුමා ඒ පිළිබඳව එතරම් තැකීමක් නොකෙළේය. මේ මිනිසුන්ට තමන්ට කිසිම අලුත් දෙයක් කියන්ට ඇත්තේ නැති වග, ඔහු දැන සිටියේය. ඔවුන් කිසිවෙකුට ඔහුගේ හෘදාභ්‍යන්තරය තුළ හැඟීමක් ජනනය කළ නොහැක්කේය. එතෙකුදු වුවත්, තමාගේ දර්ශනයත් තමාගේ ආශීර්වාදාත්මක වදනත් පතා පැමිණෙන මේ මිනිසුන් හමු වන්ට ඔහු කැමති වූයේය. පොදිකන මේ පිරිස කෙරෙහි ඔහු තුළ වූයේ නොරිස්සුමකි. එහෙත් ඒ පමණටම ඒ පිරිස ඔහුට සොම්නස ගෙන දෙන උල්පතක්ද වූයේය. සර්ජියස් පියතුමා වෙහෙසට පත්ව ඇතැයි පවසමින් වන්දනාකරුවන් පිටුපසට තල්ලු කරන්ට, සෙරපියන් පියතුමා පටන්ගත්තේය. එහෙත් මේ ජනතාව පිළිගන්ට, තමා සූදානම් බව සර්ජියස් පියතුමා කියා සිටියේය. එසේ කියද්දී, ඔහුට සිහි වූයේ සුභාරංචියේ එන ''දුකට පත් වූ දරුවෙනි, මා වෙතට වරෙල්ලා'' යන වදන්ය. ඒ වැකිය සිහි කළ ඔහුට, ආත්මතෘප්තිය පිළිබඳ දීප්තිමත් උණුසුම් හැඟීමක් දැනෙන්නට විය.

නැඟී සිටි ඔහු, සෙනග පොදිකමින් සිටි වැට ළඟට ගොස්, ඔවුන්ට ආශිර්වාද කරන අතරම, ඔවුන්ගේ ප්‍රශ්නවලටද පිළිතුරු දුන්නේය. ඔහුගේ කටහඬ කොතරම් දුර්වල වීද යත්, ඔහුටද තමා ගැනම දුක හිතුණි. ඔහු කොතරම් කැමැත්තේ වුවද, ඒ සියලු දෙනාම මුණ ගැහෙන්ට ඔහුට අවකාශ ලැබුණේ නැත. යළිත්, ඔහුට අඳුරක් වැටෙනු දැනෙන්ට විය. ඔහුගේ සිරුර වැනෙන්ට වූයෙන්, ඔහු සිය අතින් වැට අල්ලාගත්තේය. යළිත් වරක් තම හිසට ලේ එකතු වනු ඔහුට දැනුණි. මුලින් සුදුමැලි වූ මුහුණ, සැණෙකින් රතු විය.

''මේ ඇත්තො, හෙට වෙනකන් නවතින්ඩ. මට හිතෙන්නෙ, අද මට මීට වැඩිය බැහැ කියල,'' සියලුදෙනා වෙනුවෙන් පොදු ආශිර්වාදයක් කරමින්, ඔහු පැවසීය. ආපසු හැරුණු ඔහු, බංකුව දෙසට යන්ට විය. යළිත් වරක් ඔහුගේ අතින් අල්ලාගත් වෙළෙන්දා, ඔහු බංකුව වෙත කැඳවාගෙන ගොස්, ඔහුට එහි හිඳගන්ට උදව් කෙළේය.

''පියතුමනි,'' පිරිසේ සිටි අය හඬන්ට වන්හ. ''පියතුමනි, පියතුමනි, අප අතහැරල යන්ඩ එපා. ඔබවහන්සේ නැත්නම්, අපි අනාථයි.''

සර්ජියස් පියතුමා එල්ම් ගස යට බංකුවේ හිඳුවීමෙන් ඉක්බිතිව, වෙළෙන්දා පොලිස් රාජකාරිය බාරගත්තේය. ඔහු මහත් උනන්දුවෙන් පිරිස විසුරුවා හරින්ට වන්නේය. එසේද වුව, සර්ජියස් පියතුමාට නොඇසෙන පරිද්දෙන් ඔහු කතා කෙළේ පහත් හඬිනි. එහෙත් ඔහුගේ වචන කෝපාවිෂ්ටද දැඩිද විය.

''ඉතින් යන්ඩ. ඉතින් යන්ඩකො. උන්වහන්සෙ සියලු දෙනාටම ආශිර්වාද කළානෙ. ඉතින් තව මොනවද, ඕනැ කරන්නෙ? ඉතින් යන්ඩ. නැත්නම් මම සේරම එළවල දානව. ඔව් ඒක ස්ථිරයි. දැන් ඉතින් යන්ඩ. යන්ඩ. අර අර අතන කළු පාට පාවහන් ආවරණයක් දමාගෙන ඉන්න වයසක ගෑනු කෙනා! කොහේ ඇවිල්ල කියලද හිතන්නෙ? ඔය කොහාටද තල්ලු වෙවී එන්නෙ? එක සැරයක් කිව්වනෙ. අදට මීට වැඩිය බෑ. ආයෙත් හෙට බලන්ඩ. අද උන්වහන්සෙ හොඳටම තෙහෙට්ටු වෙලයි ඉන්නෙ.''

''තව එක වතාවක් බලන්ඩ,'' මහලු ගැහැනිය අයැද සිටියාය. ''තව එකම එක සැරයක්, උන්වහන්සෙගෙ පින්වන්ත මූණ දිහා බලන්ඩ ඉඩ දෙන්ඩ.''

''මං ඔහේට උගන්නනව හොඳ බැලිල්ලක්. කොහාටද ඔය තල්ලු වෙවී එන්නෙ?''

වෙළෙන්දා රළු අයුරින් හැසිරෙනු දුටු සර්ජියස් පියතුමා, දුර්වල පහත් හඬින් සිය පරිවාරකයාට කතා කොට පිරිස පළවා නොහරින්නැයි පැවසීය. කෙසේවතුදු, වෙළෙන්දා මේ පිරිස එළවා දමන බැව්ද ඔහු දන්නේය. ඔහුට වඩාත්ම අවශ්‍ය වූයේ, තනි වීමටය. තනි වී, මඳක් විවේක ගැනීමටය. එහෙත් තම පරිවාරකයා අත ඔහු පණිවිඩ යැව්වේ, ඉන් කිසියම් හෝ බලපෑමක් සිදු වන්ට ඉඩ ඇති බැවිනි.

''හොඳයි, හොඳයි,'' වෙළෙන්දා පිළිතුරු දුනි. ''මම ඒ අය එළවා දමනවා නෙමෙයි. මං හදන්නෙ, ඒ ගොල්ලන්ට සිහිය ඇතිව කටයුතු කරන හැටි කියා දෙන්ට. ඒ ගොල්ලො ඔහේ හිටපුවාවෙ. මිනිහෙක් මැරෙන තුරු වුණත්, ඒ මිනිහා වෙහෙසට පත් කරන්ඩ ඒ අය සූදානම්. උන්ට හදවතක් නෑ. කවුරුවත් ගැන වගේවිත්තියක් නෑ. අහකට යන්ඩ. හෙට එන්ඩ පුළුවන්නෙ.''

අන්තිමේදී වෙළෙන්දා ඒ හැමදෙන එළවා දැම්මේය.

වෙළෙන්දාගේ උද්‍යෝගයට එක් හේතුවක් වූයේ, විධාන කරන්ට - මිනිසුන් එළවා දමන්ට - ඔහු තුළ පැවති අසාවයි. එහෙත් මූලික හේතුව වූයේ, ඔහුට සර්ජියස් පියතුමාගේ පිහිටාධාර අවශ්‍යව තිබීමයි. ඔහු දික්කසාද වූ තැනැත්තෙකි. විවාහ කරදිය නොහැකි එකම දුවක් ඔහු වෙත වූවාය. වර්ස්ට් එක්දහස් හාරසියයක් මග ගෙවාගෙන ඔහු විසින් සර්ජියස් පියතුමා වෙත සිය දියණිය ගෙනැවිත් ඇත්තේ, ඇය සුවපත් කරගනු උදෙසාය. ඇය අසනීපව සිටි අවුරුදු දෙකක මුළු කාලය පුරාම, ඔහු විසින් ඇයට විවිධාකාර ප්‍රතිකාර ලබා දී ඇත්තේය. මුලින්ම ප්‍රතිකාර කරවූයේ, විශ්ව විද්‍යාල නගරයක ගුබර්නියා මධ්‍යස්ථානයෙහි වූ සායනයකිනි. එයින් කිසිදු සෙතක් වී නැත. ඉනික්බිතිව, සමරා ගුබර්නියාහි ජීවත් වූ වෙදැදුරකුගෙන් ප්‍රතිකාර ලබා දී ඇත. ඉන් ඇයට මඳ අස්වැසිල්ලක් ලැබුණි. ඉන් පසුව, ඔහු මොස්කව්හි දොස්තරකු වෙත ඇය ගෙන ගොස් ඇත. මේ වෛද්‍යවරයා සීමාවක් නැතිව මුදල් අය කෙළේ වී නමුදු, ඇයට කිසිදු සුවයක් නොලැබුණි. කිසිවකු විසින් සර්ජියස් පියතුමාගේ ප්‍රතිකාර ගැන ඔහුට පවසා ඇත්තේ ඉන් පසුවය. ඒ

අනුව දූත් ඔහු විසින් සිය දියණිය මෙහි ගෙනැවිත් ඇත්තේය. සියලුම මිනිසුන් එළවා දැමීමෙන් පසුව, කිසිදු මූලික සූදානමකින් තොරව, සර්ජියස් පියතුමන් ඉදිරියේ වැඳ වැටුණු හෙතෙම, හඬ නඟමින් මෙසේ කියන්ට වන්නේය.

"සාන්තුවර පියතුමනි, රෝගීව වද වේදනා විඳින මගේ දුව සුවපත් කරන්ට ඔබවහන්සේගේ ආශ්‍රීර්වාදය ලබා දුන මැනව. මගේ මේ බැගෑපත් ඉල්ලීම ඔබවහන්සේගේ දෙපා මුල තබන්ට අවසරද?"

අනතුරුව ඔහු ආයාචනයක ස්වරූපය අඟවමින් ඇඳිලි බැඳගත්තේය.

ඔහු ඒ සියල්ල කීවේද, කෙළේද, කිසිදු ප්‍රශ්නයක් නොනැගෙන අයුරින්, නිශ්චය කරගන්නා ලද චාරිත්‍ර විධියක් ඉටු කරන ආකාරයෙනි. කෙනෙකුගේ දුවක සුවපත් කරනු උදෙසා ඉල්ලීමක් කළයුතු වූ එකම නිශ්චිත විධිය එය පමණකැයි පළ කෙරෙන ආකාරයෙනි, ඔහු එසේ කෙළේ. ඔහු සිය ආයාචනය කෙළේ කොතරම් විශ්වාසයකින්ද යත්, සර්ජියස් පියතුමාට පවා හැඟුණේ, නිසි චාරිත්‍ර විධිය එය වෙතැයි කියාය. එතෙකුදු, නැගී සිට තමාගේ කරදරය පවසන්නැයි ඔහු වෙළෙන්දාගෙන් ඉල්ලා සිටියේය. තම දියණිය අවුරුදු විසිදෙකක තරුණියක බවත්, ඉකුත් අවුරුදු දෙකක කාලය තුළ ඇය ඔත්පලව සිටි බවත්, සිය මවගේ හදිසි මරණයෙන් පසුව බෙරිහන් දී හඬන්ට වූ පසුව ඇයගේ සිහිබුද්ධිය පහව ගොස් ඇති බවත් වෙළෙන්දා පැවසීය. වර්ස්ට් එක්දහස් හාරසියයක් මග ගෙවාගෙන ඇය මෙහි ගෙනැවිත් ඇත්තේ එහෙයිනැයිද, සර්ජියස් පියතුමන්ගෙන් කැඳවීමක් ලැබෙන තුරු ඇය නේවාසිකාගාරයේ රැඳී සිටින බැව්ද ඔහු දැනුම් දුන්නේය. දිවා කාලය තුළදී ඇය කොහේවත් යන්නේ නැත. දිවා ආලෝකයට ඇය තුළ ඇති බිය නිසාය. ඇයට එළියට පැමිණිය හැක්කේ, හිරු බැස ගියායින් පසුව පමණි.

''එතකොට එයා හොඳටම දුර්වලද?'' සර්ජියස් පියතුමා විමසීය.

''නෑ. එයා දුර්වලයි කියා මම කියන්නෙ නෑ. ඇගේ ඇඟපත හොඳයි. දොස්තරවරු කියන හැටියට, ඇය පීඩා විඳින්නේ ස්නායු

ආබාධයකින්. සර්ජියස් පියතුමා වචනයක් දෙනවා නම්, ඇය මේ මොහොතේම කැඳවාගෙන එන්ට පුළුවනි. සාන්තුවර පියතුමනි, තාත්තා කෙනකුගේ හදවත ප්‍රකෘතිමත් කළ මැනව. ඔහුට සැනසීම ලබා දුන මැනව. ඔබවහන්සේගේ යාච්ඤාවලින්, ඔහුගේ දියණියගේ රෝගය සමනය කළ මැනව.''

යළිත් වරක් දණින් වැටුණු වෙළෙන්දා, ඇඳිලි බැඳගත්වනම ඒ දෑත දෙපසට වනමින් සිය හිස පාත් කෙළේය. නැගී සිටින්නැයි, යළිත් වරක් සර්ජියස් පියතුමා ඔහුගෙන් ඉල්ලා සිටියේය. තමාගේ කාර්යය කොතරම් නම් අසීරුද, තමා එය කොතරම් නම් යටහත් පහත්ව ඉටු කරන්නේද, යන කරුණු සිහියට නගාගත් ඔහු, ඒ සිතිවිල්ලෙන් හූල්ලමින් මොහොතක් නිහැඬියාවේ ගැලී සිට මෙසේ කීවේය:

''බොහොම හොඳයි. මේ හැන්දෑවේ එයා එක්කන් එන්ඩ. මම එයා වෙනුවෙන් යාච්ඤා කරන්නම්. නමුත් දැන් මට වෙහෙසයි.'' ඔහුගේ දෙබැම නමා වැටුණි. ''මම ඔය ඇත්තන්ට දන්වන්නම්.''

පයේ ඇඟිලි කෙළවරින් වැල්ලෙහි ඇවිදිමින්, වෙළෙන්දා පිටව ගියේය. එසේ කිරීමෙන් ශබ්ද නොනගන්ට කොතරම් වෑයම් කළද, එපරිදි ඇවිදීමෙන් සිදු වූයේ, ඔහුගේ බූට්ස් සපත්තුවලින් වැඩි ශබ්දයක් නිකුත් වීමය. සර්ජියස් පියතුමා හුදකලාවේ ගැලුණි.

සර්ජියස් පියතුමාගේ ජීවිතයේ හැම දවසක්ම දේව මෙහෙයයන්ගෙන්ද, අමුත්තන්ගෙන්ද පිරී පැවැත්තේය. එහෙත් මේ වූකලී විශේෂයෙන්ම අමාරු - අසීරු - දවසකි. උදේ කාලයේ ඉහළ පදවියක් හොබවන පූජකවරයෙක්, කටයුතු සොයා බැලීම සඳහා පැමිණ, තොරතෝංචියක් නැතිව කතා කරන්ට වන්නේය. අනතුරුව සිය පුතුද කැටුව කුලවතියක් පැමිණියාය. තරුණ මහාචාර්යවරයකු වූ මේ පුතා අදේවවාදියෙකි. ඒ අතර, මේ මව අතිශයින්ම භක්තිමත් වූ තැනැත්තී, සර්ජියස් පියතුමන් වෙනුවෙන් කැපව සිටියාය. සිය පුතුට කතා කරන්නැයි, ඕ සර්ජියස් පියතුමාට බැගෑපත් වූවාය. එය ඔහුට අතිශයින්ම දුෂ්කර කාරියක් විය. පෙනී ගිය ආකාරයට, පැවිද්දකු සමඟ වාද කරන්ට රිසි නොවුණු තරුණයා, සර්ජියස් පියතුමා කී හැම දෙයකටම එකඟ වූයේ, දුර්වල තැනැත්තකු හා එකඟතාවට පැමිණෙන ප්‍රබලයෙකුගේ පියොවිනි. තමා පැවසූ

කිසිවක්ම තරුණයා විශ්වාස නොකරන බැව්, සර්ජියස් පියතුමාට පැහැදිලිව පෙනී ගියේය. කෙසේවතුදු, තරුණයා සිටියේ සතුටිනි. පහසුවෙනි. ඒ කතාබහ නැවත සිහියට නගාගැනීම අප්‍රසන්න සේ සර්ජියස් පියතුමාට හැඟුණි.

''පියතුමනි, මොකවත් වළඳනවද?'' පරිවාරකයා ඇසීය.

''ඔව්, මොනව හරි ගේන්ඩ.''

මේ ලෙනෙහි දොරටුවට පියවර කිහිපයක් දුරින් තනා තිබුණු කුටිය වෙත පරිවාරකයා ගිය පසුව, යළිත් වරක් සර්ජියස් පියතුමා තනි වූයේය.

හුදකලාවේ ගැලී, සියලු කිස තමාම කරගනිමින්, සත්ප්‍රසාද පාන් ගෙඩියත්, නිකම්ම කළු පානුත් බුදිමින්, සර්ජියස් පියතුමා ගත කළ ඒ ජීවිතය අවසන් වී, දැන් බොහෝ කලක් ගතව ඇත්තේය. මේ වන විට තමාගේ සෞඛ්‍යය නොසලකා සිටීමට අයිතියක් නැති බැව්, ඔහුට බලවත් ආකාරයෙන් අවධාරණය කොට තිබුණි. උපවාස සමයේදීද, ඔහු වෙත ප්‍රණීත ආහාර පාන සපයන ලද්දේ විය. ඔහු බුදින්නේ ටිකක් වුවද, ඒ වූකලී ඔහු සාමාන්‍යයෙන් ගත් අහර පමණට වඩා බොහෝ සෙයින් වැඩි ප්‍රමාණයක් විය. කලින් ඔහු අහර ගත්තේ, ජුගුප්සිත චින්තාවෙන් යුතුව පාපය පිළිබඳ සවිඥානක හැඟීමෙනි. එහෙත් දැන් ඔහු අහාර අනුභවයෙන් විශාල තෘප්තියක් ලබන්නේය. අද වුව එසේය. ඔහු තලප ටිකක් අහරට ගත්තේය. තමා වෙත ගෙනෙන ලද සුදු පාන් ගෙඩියෙන් අඩක්ම බුදිමින්, තේ පානය කෙළේය.

සේවකයා ගිය පසුව, ඔහු එල්ම් ගස යට වූ බංකුවෙහි හුදකලා වී සිටියේය.

එය මැයි මාසයේ සුන්දර සැඳෑවක් විය. බර්ච්, එල්ම්, ඇස්පෙන්, බර්ඩ් චෙරි සහ ඕක් ගස්වල කොළ දිග හැරෙන්ට පටන්ගත්තා පමණි. එල්ම් ගස්වලට දුරින් වූ බර්ඩ් චෙරි පඳුරු මලින් බර වී තිබුණි. එතෙකුදු, පිපුණු මල් තවම වැටෙන්ට පටන්ගෙන නැත. ළඟ ළඟම රෑ කොවුලෝ ගී ගයන්ට වන්හ. උන්ගෙන් දෙතුන් දෙනකු පහළ ඉවුරේ සිට නද දෙනුද ඇසෙන්ට වනි. ගඟට බොහෝ

ඇතින් ගී හඬක් නැඟී එයි. ඇතැම් විට එය, දවසේ වැඩ නිමා කොට නිවෙස් බලා යන කම්කරුවන් ගයන ගීතයක් විය හැක. වනගහණට ඔබ්බෙන් බැස යන හිරු මඬලෙන් එන රැස් දහරා අතු පතර මත වැටී ඇත. ලොවෙහි මේ මුළු පදාසය පුරාම, රන් පැහැ මුසු කොළ පැහැය තැවරීගති. සෙසු පෙදෙස කළුවරින් වැසිලාය. මැයි කුරුමිණියෝ ඉගිලෙති. හැපෙති. බිම වැටෙති.

සැඳෑ අහර කිසෙන් පසුව, සර්ජියස් පියතුමා තම යාච්ඤා සිතින් කියවන්ට වන්නේය. ''ජේසු කිතු සමිඳාණනි, දේව පුත්‍රයාණනි, අප කෙරේ අනුකම්පා කළ මැනව.'' ඉක්බිතිව ඔහු පසන් ගීයක් මතුරන්ට වන්නේය. එමොහොත, හදිසියෙන්ම සමීපයෙහි වූ පඳුරක සිට පැමිණි ගේ කුරුල්ලෙක් සතුටින් කිචි බිචි ගාමින් ඔහු හාත්පස පැන පැන යන්ට වූයේය. පසුව, කිසිවකට බිය වූ කුරුල්ලා ආපසු පියඹා ගියේය. පසන් ගී ගායනයෙන්, සර්ජියස් පියතුමා මාරු වූයේ යාච්ඤාවක් වෙතය. ඒ යාච්ඤාවෙන් පැවසුණේ, ඔහු විසින් ලෝකය අභිනිෂ්ක්‍රමණය කිරීම පිළිබඳ අදහසකි. වෙළෙන්දාත් ඔහුගේ රෝගාතුර දූවත් පැමිණෙන බැවින්, ඔහු යාච්ඤාව ඉක්මනට කියා අවසන් කෙළේය. මන්ද යත්, ඇය කෙරෙහි ඔහු තුළ සැලකිල්ලක් වූ බැවිනි. ඇය වූකලී වෙනත් අරමුණකි. අලුත් කෙනෙකි. එහෙයින් ඇය කෙරෙහි ඔහු තුළ උනන්දුවක් ඇති විය. එසේම මේ වෙළෙන්දාද ඔහු තුළ උද්යෝගී හැඟීමක් ජනිත කෙළේය. මන්ද යත්, ඇයත් ඇයගේ පියාත් යන මේ දෙදෙනාම, සිතා සිටින්නේ තමා දෙවියන්වහන්සේගේ වරමින් යාච්ඤා කරන්නකු බවය. තමා සාන්තුවරයකු සේ සලකා කතා කළවුන්ට ඔහු තරවටු කෙළේ වී නමුදු, තම හදේ ගැඹුරින්ම ඔහුට සිතුණේද, තමා සැබැවින්ම සාන්තුවරයකු බවය.

ස්තෙෆාන් කසාත්ස්කි නම් වන තමා, අතිවිශේෂ ආකාරයෙන් සාන්තුවර වූයේ ඇයිද, සැබැවටම ප්‍රාතිහාර්ය දක්වන්නකු වූයේ ඇයිද යන කාරණය ගැන ඔහු නිතර නිතරම සිතන්ට වන්නේය. තමා එවැනි තත්වයකට පත්ව සිටියි. ඒ ගැන නම්, සැකයක් ඇත්තේ නැත. තමාගේ යාච්ඤාව හේතුවෙන්, මුලින්ම සුවපත් වූ රෝගී පිරිමි ළමයාගේ සිට අන්තිමට නැවත ඇස් පෙනීම ලබාගත් මහලු කාන්තාව දක්වා වන අයවලුන් කෙරෙහි බලපෑ තම ප්‍රාතිහාර්යය, ඔහු සියැසින්ම දුක ඇත්තේය. ඔහුට එය කිසිසේත්ම ප්‍රතික්ෂේප කරනුද බැරිය.

බැලූ බැල්මට අපූර්ව වුවද, එය සැබෑය. වෙලෙන්දාගේ දියණිය කෙරෙහි ඔහු තුළ උනන්දුවක් ඇති වූයේ, ඇය අලුත් කෙනකු නිසාය. ඇය තමා කෙරේ විශ්වාසය තබාගෙන සිටින නිසාය. එසේම ඇය සුවපත් කිරීමෙන්, තමාගේ ශක්ති මහිමයත්, තම කීර්තියත් යළිත් වරක් තමාටම ඒත්තු ගැන්විය හැකි වන නිසාය. ''වර්ස්ට් දහස් ගණනක දුර සිටත් මිනිසුන් පැමිණෙනවා නොවේද''යි ඔහු තමාටම කියාගත්තේය. ''පුවත්පත් ඒ ගැන ලියයි. රජ්ජුරුවෝත් ඒ ගැන දනිති. යුරෝපයේත් - අදේවවාදී ලෝකයේත් - ඒ කාරණය පතළය.'' එහෙත් සැණෙකින් ඔහු තුළ ලජ්ජාවක් හටගති. යළිත් ඔහු, දෙවියන්ට යාච්ඤා කරන්ට වන්නේය.

''ස්වාමිදරුවනි, දෙව්රජිඳාණනි, ශාන්තිදායකයාණනි, සත්‍යයේ ආත්මයාණනි, අප හදවත් තුළට වැඩම කළ මැනව. වැඩම කර, අපගේ පාපස්කන්ධය ධෝවනය කර, අපගේ ආත්මය ගලවා දුන මැනව. උත්කර්ෂයට පත් කළ මැනව. මා වෙලාගෙන ඇති හිස් කීර්තිය නමැති පාපයෙන් මා මුදා, මා පිරිසිදු කළ මැනව.'' ඔහු යාච්ඤා කරන්ට විය. මේ ආකාරයටම, තමා කොතෙක් නම් යාච්ඤා කර ඇද්ද? ඒත් දූන් වගේම, ඒ යාච්ඤා සියල්ල නිෂ්ඵල වූයේ නොවේදැයි ඔහු මෙනෙහි කරන්ට වන්නේය. අනෙක් අයවලුන්ට නම්, ඔහුගේ යාච්ඤාවලින් සුවපත් වීමේ ප්‍රාතිහාර්ය සිදුව ඇත්තේය. එහෙත් ඔහුට නම්, මේ වැනි තුච්ඡ ආශාවන්ගෙන් ගැලවෙන දේව විමුක්තිය පිළිබඳ ප්‍රතිලාභය ලැබී නැත්තේය.

පැවිදි ජීවිතයේ මුල් අවුරුදුවලදී කරන ලද යාච්ඤා සියල්ල ඔහු සිහි කරන්ට විය. එකල්හි නිර්මලභාවය, නිහතමානය, මෛත්‍රිය තමා වෙත ප්‍රදානය කරන මෙන්, ඔහු දෙවියන්ට ආයාචනය කෙළේය. ඒ අවුරුදුවලදී, දෙවියන්වහන්සේ තමාගේ කන්නලව්වලට සවන් දුන් බැව්ද ඔහු සිහි කෙළේය. තමා නිර්මලව පතිවෘතාවෙහි පැවති අයුරුද, ඇඟිල්ලක් කපා දැමූ අයුරුද, ඔහුගේ මතකයට නැඟී ආවේය. ඔහු අත ඔසවා, රැළි ගැහුණු ඇඟිලි කොටය සිපගත්තේය. තමාගේ පාපකාරී ආශාවන් කෙරෙහි පිළිකුල දැක්වූ ඒ අවුරුදු කිහිපය තුළ, තමා සැබැවින්ම නිහතමානව සිටි බැව් ඔහුට පෙනී ගියේය. ඒ අවුරුදුවලදී ඔහුගේ හදවත තුළ මෛත්‍රිය තිබුණි. තමාගෙන් බලෙන් මුදල් ලබාගන්ට පැමිණි වයසක බේබදු

සොල්දාදුවා ගැනත්, එසේම ඇය ගැනත් සිහි කළ ඔහු, එකල්හි තමාගේ හදවත තුළ වූ ප්‍රේමය - මෛත්‍රිය - ගැන මෙනෙහි කරන්ට වන්නේය. නමුත් දැන්? තමා කිසිවෙකුට මෛත්‍රිය දක්වන්නේද? ඔහු තමාගෙන්ම විමසීය. සොෆියා ඉවනොව්නාට හෝ සෙරපියොන් පියතුමාට, ප්‍රේම කරන්නේද? මෛත්‍රිය දක්වන්නේද? අද තමා මුණගැහෙන්ට පැමිණි ඒ සියලුදෙනා කෙරෙහි, තමා තුළ මෛත්‍රීසහගත හැඟීමක් වීද? අද තමා හමුවට ගෙනෙනු ලැබූ උගත් තරුණයාට තමා දැනමුතුකම් දෙමින් කතා කළා නොවේද? තමාගේ මානසික ශක්තීන්ද, තවමත් අමතක නොවී ඇති තමාගේ අධ්‍යාපනයද ඔහු ඉදිරියේ ගෙනහැර පෑවා මිස, තමා ඔහුට මෛත්‍රිය දැක්වීද? ජනතාවගේ ආදරය ඉතා ප්‍රසන්නය. එය ඔහුට අවශ්‍යද වන්නේය. එහෙත් තමා ඔවුන්ට පෙරළා ආදරය දැක්වීද? තමාට ඒ සම්බන්ධයෙන් පිළිතුරක් නැතැයි ඔහු සිතන්ට වන්නේය. දැන් ඔහුගේ හදවත තුළ මෛත්‍රිය නැත. නිහතමානය නැත. පතිව්‍රතා ධර්මය නැත.

වෙළෙන්දාගේ දුව අවුරුදු විසිදෙකක තරුණියක යන කාරණය ඔහු තුළ සතුටක් දැනවීය. ඇය දකින්ට ප්‍රියමනාප තැනැත්තියකදැයි දැනගැනීමට ඔහුට අවශ්‍ය විය. ඇය ඉතා දුර්වලදැයි විමසීමේදී, ඔහුගේ සැබෑ අභිප්‍රාය වූයේ, ඇය කෙරෙහි ස්ත්‍රීත්වයේ කාන්තිමත්බව - මනරම්බව - වීදැයි දැනගැනීමය.

"මට ඇත්ත වශයෙන්ම, ඒ තරම්ම පහළට වැටෙන්ට හැකි විණිද?" ඔහු සිතන්ට වන්නේය. "සාමිදරුවනි, මට පිහිට වුව මැනව. මා ප්‍රකෘතිමත් කළ මැනව. මගේ සාමිදරුවනි, මගේ දෙව්සමිඳාණනි." ඔහු ඇඳිලි බැඳගෙන යාච්ඤා කරන්ට වන්නේය.

රෑ කොවුල්ලු ගී මතින් උදම්ව සිටියහ. මැයි කුරුමිණියෙක් ඔහුගේ කන ළඟින් ඇදී ගොස්, ඔහුගේ ගෙල මත බඩගාගෙන යන්ට වනි. ඔහු කුරුමිණියා පිස දැමීය. "නමුත් - උන්වහන්සේ විරාජමාන වන්නේද? මම තට්ටු කරන්නේ වැසූ දොරවල්වලට නොවේද? වසා ඇත්තේ පිටතිනි. මට එහි අගුළ පහසුවෙන් දැකගත හැකි නොවේද? රෑ කොවුලන්, මැයි කුරුමිණියන්, ස්වභාව ධර්මය - මේ සියල්ල ඒ අගුළ නොවේද? අර ඉලන්දාරියා නිවැරදි වන්ට බැරි නැද්ද?" මෙවර ඔහු හඬ නගමින් යාච්ඤා කරන්ට වන්නේය. ඒ සිතිවිලි සියල්ල පහව යන තුරු, පහව ගොස් තම සිත සන්සුන්

වන තුරු, තමා තුළ යළිත් විශ්වාසය පහළ වන තුරු, ඔහු දිගු වේලාවක් යාච්ඤා කෙළේය. ඉනික්බිතිව, ඔහු සීනුව හැඬවීය. පරිවාරකයා ඔහු ඉදිරියේ දර්ශනය වූ පසුව, වෙළෙන්දාත් ඔහුගේ දුවත් දූන් පැමිණෙතැයි ඔහුට පැවසීය.

දුවගේ අතක් අල්ලාගෙන, ඇය පෙරටු කරගෙන, වෙළෙන්දා පැමිණියේය. කුටිය තුළට ඇය ඇතුළු කළ සැණින්, ඔහු ඉවත්ව ගියේය.

වෙළෙන්දාගේ දියණිය මනහර කෙස් කළඹකින් යුතු ඉතා පැහැපත් තරුණියක වූවාය. ඇය සුදුමැලිය. මහතය. අතිශයින්ම යටහත් පහත්ය. මුහුණ බියපත් දරුවකුගේ වැනි වුවද, සිරුර මේරූ කාන්තාවකගේ වැනිය. සර්ජියස් පියතුමා කුටියේ දොරටුව ළඟ බංකුවේ වාඩි වී සිටියේය. තමා පසු කර පැමිණි තරුණිය නැවතුණු පසුව, ඔහු ඇයට ආශීර්වාද කෙළේය. තමාගේ දෑස ඇගේ සිරුර සෝදිසි කළ ආකාරය ගැන ඔහු භීතියෙන් තැතිගත්තේය. ඇය ඇතුළට ගියාය. කිසිවක් ඇනුණු කලෙක මෙන්, ඔහු වේදනාභරිතව සිටිතැයි ඇයට හැඟුණි. ඇය සරාගික බැව්ද, දුර්වල හදැති බැව්ද ඇගේ මුහුණින් පළ විණි. එබැව් ඔහුටද වැටහුණි. නැඟී සිටි ඕ කුටිය තුළට පිවිසියාය. මිටි බංකුවක හිඳගත් ඇය, ඔහු පැමිණෙන තුරු බලා සිටින්ට වන්නීය.

ඔහු පැමිණෙන විට ඇය නැඟී සිටියාය.

"මට ගෙදර යන්ඩ ඕනෑ," ඇය කීවාය.

"බය වෙන්ඩ එපා," ඔහු පිළිතුරු දිණි. "මට කියන්ඩ, වේදනාව මොකක්ද කියලා."

"හැම දෙයක්ම මට වේදනාවක්," ඇය කීවාය. සැණෙකින් ඇගේ මුහුණ සිනහවකින් එළිය විය.

"ඔබට සනීප වෙනවා," ඔහු ඇයට කීය. "යාච්ඤා කරන්ඩ."

"යාච්ඤා කිරීමෙන් ඇති පලේ මොකක්ද? මම යාච්ඤා කළා. යාච්ඤා කළා. නමුත් ඒකෙන් සෙතක් වුණේ නෑ." ඇය තාමත් සිනාසෙමිනි. "ඔබ යාච්ඤා කරන්ඩ. යාච්ඤා කරල, ඔබේ අත් මගේ ඇඟේ තියන්ඩ. මම ඔබ හීනෙන් දැක්කා."



"ඔබ මොකක්ද හීනෙන් දැක්කෙ?"

"මම දැක්කා, ඔබ මගේ පපුව උඩ, මේ විදිහට ඔබේ අත් දෙක තියනවා." එසේ පවසමින් ඇය ඔහුගේ අත ගෙන, සිය ළයමඬල තෙරපාගත්තාය. "හරියටම මෙතන."

ඔහු සිය දකුණු අත ඇයට දුන්නාය.

"ඔබේ නම මොකක්ද?" හිසේ සිට දෙපතුල දක්වා වෙවුලමින් ඔහු ඇසීය. තමා පරාජය වී ඇත්තේය. ඔහුට එය පසක් විණි. දමනය කරන ලද සියල්ල මැඬගෙන, ආශාව වැඩී නැඟී ආයේය.

"මාර්යා. ඇයි!"

ඇය ඔහුගේ අත ගෙන සිපගත්තාය. අනතුරුව ඔහු වැළඳගත් ඇය, ඔහු සිය සිරුරට තද කරගත්තාය.

"මොකක්ද, ඔබ මේ කරන්නෙ?" ඔහු කීය. "මාර්යා, ඔයා සාතන්."

"අපොයි, ඒකෙන් ලොකු හානියක් වෙන්නෙ නෑ."

ඇය තාමත් ඔහු වැළඳගෙනය. ඔහු වැළඳගත්වනම, ඇය ඇඳ මත හිඳගත්තාය. සැණෙකින්, ඇය ඔහු තුරුළට ගෙන ඇඳෙහි වැතිරගත්තීය.

* * * *

හිරු නැඟුණු කල, ඔහු කුටියෙන් එළියට විත් ද්වාර මණ්ඩපය වෙත ගියේය.

සැබැවින්ම, ඒ හැම දේම සිදු විණිද? නොපමාව ඇගේ පියා පැමිණෙනු ඇත්තේය. ඇය ඒ ගැන කියනු ඇත. ඇය සාතන්ය. ඉතින් මොකද කරන්නෙ? මොකද කරන්නෙ? ආහ් ! ඒක තියෙන්නෙ - තමන්ගෙ ඇඟිල්ල කපා දැමූ කෙටේරිය - ඒක තියෙනව නේන්නම්. කෙටේරිය අතට ගත් ඔහු, කුටිය වෙත යන්ට ආපසු හැරුණේය.

ඔහුගේ පරිවාරකයා සැණින් පැමිණියේය.

"ඔබවහන්සෙට දර ඕනැද? මට කෙටේරිය දෙන්ඩ."

කෙටේරිය අතහැරිය ඔහු, ආපසු කුටිය තුළට වැදුණේය. ඇය එහි වැතිරගත්වනම, නිදාගෙන සිටින්නීය. ඔහු භීතියෙන් යුතුව



ඇය දෙස මෙහොතක් බැලීය. ඉනික්බිතිව කුටිය පිටුපසට ගිය ඔහු, එහි එල්ලා තිබුණු ගොවි ඇඳුම අතට ගත්තේය. ඒ ඇඳුම ඇඳගෙන, කතුරද සොයාගත් ඔහු, සිය හිසකේ කපා දැමීය. ඔහු කුටියෙන් නිකුත්ව පිටතට පැමිණ, නදිය දෙසට ඇදී යන පාර දිගේ ගමන් කරන්ට වන්නේය. ඔහු ගඟ දිසාවට ගොස් තිබුණේ, මීට වසර හතරකට පෙරය.

ගං ඉවුර දිගේම දිවෙන පාරක් විය. ඒ පාරට බට හෙතෙම, මද්දහන් වන තුරුම, ඒ දිගේ ගමන් කෙළේය. මද්දහනේ රයි කුඹුරක් වෙත හැරුණු ඔහු, ඒ වගාව මැද වැතිරුණේය. සවස් කල ඔහු ගම්මානයක් සමීපයට පැමිණියේය. ගමට ඇතුළු නොවූ හෙතෙම, යළිත් නදී ඉවුරේ නැග්ම දෙසට හැරුණි.

දැන් උදේ පාන්දරය. ඇතැම් විට, හිරු නැගෙන්ට හෝරාවක් පමණ වන්නට ඇත. හැම දෙයක්ම අළු පැහැ ගෙන ඇත්තේය. පරිසරය තවමත් අන්ධකාරයෙහි ගැලී සිටියි. පැළදිග සිට සීතල සුළඟක් හමා ආවේය. ඇත්තය. එය අවසන් විය යුතුව ඇත්තේය. දෙවියන් ඇත්තේ නැත. ඉතින් එය අවසන් කරන්නේ කොහොමද? වතුරට පනිනවාද? නමුත් ඔහුට පීනන්ට පුළුවන. ඔහු දියෙහි ගිලෙන්නේ නැත. ගෙල වැලලා ගන්නවාද? ඔව්. තමාගේ පටියෙන් ගෙල වැලලා ගත හැක. ගහක එල්ලෙන්ට පුළුවන්ය. මරණය, ඒ තරම්ම පහසුවෙන්, උදා කරගත හැකි යැයි ඔහුට පෙනී ගියේය. ඔහු මරණය ආසන්නයටම පැමිණ සිටින්නේය. අර භීතිය යළිත් වරක් ඔහුගේ සර්වාංගයම වෙලාගති. බලාපොරොත්තු සුන් වුණු අන් හැම අවස්ථාවක වගේම, ඔහුට අවශ්‍ය වූයේ, යාච්ඤා කරන්ටය. දෙවියෙක් ඇත්තේ නැත. දෑත මත හිස රුවාගෙන, ඔහු එහි වැදහොත්තේය. හදිසියේම, නිදාගැනීමේ අවශ්‍යතාවක් ඔහුට දැනිණි. තවදුරටත් දෑත මත හිස රුවාගෙන සිටිය නොහැක. දෑත වැටෙන්ට හැරිය ඔහු, එක් අතක් යට කරගෙන නිදන්ට වන්නේය. එමොහොත, ඔහුට නින්ද ගියේය. එහෙත් ඒ නින්ද පැවැත්තේ ඉතා සුළු වේලාවක් පමණි. හදිසියේම ඔහුට ඇහැරුණි. මතක වැල් නැගි නැගී අවුත්, ඔහුගේ සිත පුරාගති. ඇතැම් විට, ඔහු ඒ සියල්ල සිහිනයෙන් දකිනවා වන්නට ඇත.

ඔහුට සිය ළමා කාලය සිහි විය. කුඩා දරුවකු හැටියට මවගේ ගම්බද නිවසේ සිටි කාලය, ඔහු සිහි කෙළේය. අස්රියක් නිවසට පැමිණියේය. එයින් බැස්සේ කළු ඉස්කෝප්පයක හැඩය ගත් රැවුළෙන් යුතු නිකොලායි සර්ගයේවිච් මාමාය. ඔහු සමඟම පශෙන්කා රියෙන් පිටතට බැස්සාය. බියගුලු, අනුකම්පාව දනවන කුඩා මුහුණක් මත සෞම්‍ය දෙනෙතින් යුතු ඕ, ඉතා කෙට්ටු දූරියක වූවාය. පශෙන්කා පිරිමි ළමයින් සිටි කාමරයට කැඳවාගෙන එනු ලැබුවාය. ඇය ඔවුන් හා එක්ව සෙල්ලම් කරතැයි බලාපොරොත්තු වුවද, එසේ නොවීය. එය හරිම නීරසය. ඇය මෝඩ කෙල්ලකි. අන්තිමේදී ඔවුන් හැමදෙනාම ඇයට විහිළු කරන්ට වන්හ. ඔවුන් කීවේ, ඇයට පිහිනන්ට බැරි බවය. පිහිනන්ට හැකි නම්, එසේ කර පෙන්වන්නැයි පිරිමි ළමයි ඇගෙන් ඉල්ලා සිටියහ. ඕ බිම දිගා වී, පිහිනන අයුරු පෙන්වූවාය. සියලුදෙනාම මහ හඬින් සිනාසුණහ. ඇය නම් හරිම මෝඩියකි. ඇයද එය වටහාගත්තීය. ඇගේ මුහුණේ තැන තැන රතු ලප මතු විණි. ඇය කොතරම් නම් අනුකම්පාසහගත වීද යත්, ඔහුට ලජ්ජාවක් දැනුණි. ඒ තරමටම සෞම්‍ය, ඒ තරමටම යටහත් පහත්, ඇගේ ඒ ඇඹරුණු මුහුණ, ඔහුට කිසි විටෙකත් අමතක නොවීය.

ඉනික්බිතිව, තමා පසුකාලීනව ඇය දුටු අවස්ථාද ඔහු සිහිපත් කෙළේය. ඔහු ඇය දුටුවේ, ඊට වසර ගණනාවකට පසුවය. ඒ, ඔහු ආශ්‍රමයට ඇතුළු වන්නට ඔන්න මෙන්න කියා තිබියදීය. ඒ වන විට, ඕ විවාහක ගැහැනියකි. ගම්බද ඉඩම් හිමියකු වූ සැමියා, ඇගේ වස්තුව නිකරුණේ නැති හංග කළා පමණක් නොව, නිතිපතා ඇයට ඔහුගෙන් තැලුම් කන්ටද සිදු විය. ඇයට පිරිමි දරුවෙක් හා ගැහැනු දරුවෙක් වූහ. පිරිමි දරුවා කුඩා වියේදීම මිය ගියේය.

එකල්හි තමාට ඇය දකින්ට ලැබුණේ, ඇය හොඳටම අවාසනාවන්ත තත්වයට පත්ව සිටියදී බැව්ද ඔහුට සිහි විය. ඉන් පසුව, ඔහු ඇය දුටුවේ ආශ්‍රමයේදීය. ඒ වන විට ඇය වැන්දඹුවක වූවාය. ඒ වන විටද, ඇය හිටියා වගේමය. මෝඩ යයි, හරියටම කිව නොහැක. එහෙත් උද්යෝගහීන, එතරම් කැපී නොපෙනෙන, අනුකම්පා කටයුතු තැනැත්තියක වූවාය. ඇය ආශ්‍රමයට පැමිණ සිටියේ, සිය දියණියත්, දියණියගේ විවාහ ගිවිසගත් පෙම්වතාත්



කැටුවය. ඔවුහු ඉතා දුගී දුප්පත් තත්ත්වයේ පසු වූහ. පසුව ඔහුට දැනගන්ට ලැබුණේ, ඇය කිසියම් කුඩා නගරයක ඉතා දිළිඳුව වෙසෙන බවකි.

ඇය ගැන මෙනෙහි කරමින් ඉන්නේ මොන එහෙකටද? ඔහු සිතන්ට වන්නේය. එහෙත් ඔහුට ඇය ගැන නොසිතා සිටිය නොහැකි විය. දැන් ඇය කොහේ සිටිනවා විය හැකිද? ඇයට සිදුව ඇත්තේ කුමක්ද? බිමට බැස තමාට පිහිනන්ට පුළුවනැයි කියා සිටි අසරණ අවසනාවන්ත තත්වයේම, ඇය තවමත් සිටින්නීද? ආහ්! මොනවද ඇය ගැන ඔය තරම් හිතන්නෙ? මේ සියල්ල අමතක කර දමා අවසානයක් කළ යුතුය.

යළිත් ඔහුට භීතියක් දැනුණි. සිදු විය යුතු දේ පිළිබඳ මේ සිතිවිල්ලෙන් මිදී පළා යනු සඳහා, ඔහු යළිත් වරක් පශෙන්කා ගැන සිතන්ට පටන්ගති.

මෙසේ, වරෙක අවසානයක් කරගත යුතු ආකාරයද, තවත් වරෙක පශෙන්කා ගැනද සිතමින්, ඔහු තව වේලාවක් වැතිරගෙන සිටියේය. පශෙන්කා පිළිබඳ සිතිවිල්ල, තමා විමුක්තිය දෙසට කැඳවාගෙන යන සිතිවිල්ලකැයි ඔහුට හැඟිණි. අන්තිමේදී ඔහු නින්දට වැටුණි. නින්දේදී ඔහුට සුරදූතිකාවක දර්ශනය වූවාය. ඇය ඔහු අමතා මෙසේ පැවසුවාය. "යුෂ්මතා පශෙන්කා වෙත යන්න. ඇය වෙත ගොස්, යුෂ්මතා, කළ යුත්තේ කුමක්ද, පාපය ඇත්තේ කොතැනකද, විමුක්තිය ඇත්තේ කොතැනකදැයි ඇගෙන් ඉගෙනගන්න."

නින්දෙන් අවදි වුණු ඔහු, ඒ නම්, දේව දර්ශනයකැයි තීරණය කෙළේය. සතුටට පත් ඔහු, ඒ දර්ශනයේදී තමාගෙන් ඉල්ලා සිටි අයුරින් කටයුතු කරන්නට තීරණය කෙළේය. ඇය ජීවත් වුණු කුඩා නගරය ඔහු දන්නේය. එයට වර්ස්ට් තුන්සීයක් දුරය. ඔහු, ඒ නගරය බලා යන්ට පිටත් වුණේය.

# VIII

පශෙන්කා, දූන් පුංචි පශෙන්කා නොවෙයි. දූන් ඇය ප්‍රස්කෝවියා මිඛායිලොව්නාය. හම රැළි වැටුණු කෙට්ටු මහලු කාන්තාවක වූ ඕ, බීමට ඇබ්බැහි වුණු කිසිදු වාසනාවක් හිමි නැති ආණ්ඩුවේ ලිපිකරුවකුගේ නැන්දම්මාය. තම බෑනා අන්තිමට සේවය කළ කුඩා නගරයෙහි ඇය ජීවත් වූවාය. සිය දියණියත්, නහර දුර්වලතාවෙන් පෙළුණු අසනීපකාරයකු වූ බෑනාත්, මුනුබුරු මිනිබිරියන් පස්දෙනාත් යන මුළු පවුලම රැකුණේ ඇයගෙනි. ඇය ඔවුන් පෝෂණය කෙළේ, ප්‍රදේශයේ වෙළඳුන්ගේ දූවරුන්ට, පැයට කොපෙක් පනහේ කුලියට, සංගීත පාඩම් කියා දීමෙනි. එයින් ඇයට මසකට රූබල් හැටක පමණ මුදලක් ලැබුණි. ඒ කාලසීමාවේදී තම බෑනාට අලුත් රැකියාවක් ලැබෙන තුරු, ඔවුන් ජීවත් වූයේ එසේය.

ප්‍රස්කෝවියා මිඛායිලොව්නා තමාගේ සියලුම නෑදෑයින්ටත් දන්නා හඳුනන සියලු දෙනාටත් ලියුම් ලියමින් ඉල්ලා සිටියේ, බෑනාට කිසියම් රැකියා තනතුරක් සොයා දෙන ලෙසය. ඇය ඒ සම්බන්ධයෙන් සර්ජියස්ටද ලියුවාය. එහෙත් ඒ වන විට ඔහු තාපසාරාමය අතහැර ගොස් සිටි හෙයින්, ඔහුට ලියුම ලැබුණේ නැත.

එදින සෙනසුරාදාවක් විය. ප්‍රස්කෝව්යා මිඛායිලොව්නා පිටි අනමින් සිටියේ පැණි රසැති විශේෂ පාන් වර්ගයක් සාදනු සඳහාය. අවුරුදු බොහෝ ගණනාවකට පෙර, තම පියාගේ කුස්සියේ වැඩ කළ වහල් කෝකියාගෙන් ඒ පාන් සාදන හැටි ඇය උගෙන තිබුණි. මුනුබුරු මිනිබිරියන්ට ඉරිදා දවසේ විශේෂ කෑමක් හැටියට, ඇය එය පිළියෙළ කරන්ට වූවාය.

දියණිය මාෂා, කිරි දරුවාගේ කටයුතුවල යෙදී සිටියාය. ළමයින්ගෙන් වැඩිමල් පුතා සහ දුව පාසල් ගොසිනි. මුළු රැයම නිදිවරා සිටි බෑනා, නිදි කිරා වැටෙමින් සිටියේය. ප්‍රස්කෝව්යා මිඛායිලොව්නාටද නිදාගන්ට ලැබුණේ මඳ වේලාවකි. ඇය රාත්‍රියෙන් වැඩි කලක් ගත කෙළේ, සිය සැමියා කෙරෙහි කෝප වී සිටි මාෂාට, දෙගොඩහරිය වන තුරුම සැනසිලි වදන් කියමිනි.

ඔහු දුර්වල තැනැත්තකු බැව්, ප්‍රස්කෝව්යා මිඛායිලොව්නා වටහාගෙන සිටියාය. ඔහුට තම කතා විලාසයවත්, ජීවිතයේ පුරුදුවත් කිසිවක් වෙනස් කරන්ට බැරිය. ඔහුගේ බිරිඳගේ ඇනුම් බැණුම්වලින්ද කිසි පලක් නොවන බැව්, ඇය පසක් කරගෙන තිබුණි. ඇය හැමවිටම කටයුතු කෙළේ, අඬ දබර ආරවුල් සමනය කරන්නටය. ඔවුන් අතර ඇනුම් බැණුම් වළක්වන්නටය. ඔවුන් අතර නොපහන් හැඟීම් ඇති වනු නවතාලන්නටය. සියලුම මානුෂික සම්බන්ධතාවලින් ඇයට හිමි වූයේ, අකාරුණිකත්වය පමණි. එහි විපාකය, තම සිරුර රිදුම් දෙන තරමටම, ඇයට දැනී තිබුණි. කිසිම දෙයක් හොඳ අතට හැරෙන්නේ නැති වග, ඇයට ඉඳුරාම පෙනී ගියේය. මේ කිසිවකට විසඳුමක් දෙන්ට ඇය සිතුවාද නොවෙයි. කාගේ මුත් දුෂ්ටකමක් - කුඩුකේඩුකමත් - ඇයට දැනුණේ දුර්ගන්ධයක් මෙනි. දරුණු ශබ්දයක් මෙනි. බරපතළ ප්‍රහාරයක් මෙනි.

තමාගේ නිපුණත්වය ගැන ආඩම්බර වෙමින්, ඇය පිටි මිශ්‍ර කරන ආකාරය ලූකරියාට පහදාදෙමින් සිටියාය. සිය මුනුබුරා වන සය වියැති පුංචි මීෂා ඇය වෙත දිවගෙන ආවේ, එවෙලේය. කොලුවාගේ ඇට කෝටු වැනි දෙපා වැසී තිබුණේ, කිහිප වරක් අණ්ඩ දමන ලද මේස්වලිනි. ඔහු බියට පත්ව සිටියාක් වැන්න.

''අත්තම්මෙ, මහ බයානක නාකි මිනිහෙක් ඇවිල්ල, අත්තම්මා ඉන්නවද කියල අහනව.''

ලුකරියා දොරෙන් එළියට ගියාය.

''ඇත්ත තමයි ලොකු නෝනා, කවුද වන්දනාකාරයෙක් වාගෙ කෙනෙක්.''

ඇට පැදුණු වැලමිටි දෙකේ තැවරී තිබුණු පිටි ටික සූරා දමා, ඇඟ සිටි ඒප්‍රනයෙන් අත් දෙක පිසදාගත් ඕ, කුස්සියෙන් එළියට යන්ට සූදානම් වූයේ, වන්දනාකාරයාට දෙන්ට සිය හැඹිලියෙන් කොපෙක් පහක කාසියක් සොයනු සඳහාය. එහෙත් එහි කොපෙක් දහයට අඩු කාසියක් නැති බැව් ඇයට මතක් වූයෙන්, මේ තැනැත්තාට ඒ වෙනුවට පාන් ටිකක් දෙන්ට ඇය තීරණය කළාය. එහෙත් අල්මාරිය දෙසට හැරෙත්ම, තමා දන් දෙන්ට අදිමදි කළ අවස්ථා කිහිපයක් සිහිපත් වූයෙන්, මෙවර ලොකු පාන් පෙත්තක් කපන්නැයි ලුකරියාට පවසමින්ම, ඇය කොපෙක් දහයක කාසියක් ගේන්නට ගියාය. තමාගේ කුම්මැහිකම යන්ටත් එක්කම, මෙවර දන් දෙකක්ම දෙන්ට ඇය කල්පනා කළාය.

පාන් කැබැල්ලත් කාසියත් දෙන අතර, ඇය වන්දනාකාරයාගෙන් සමාව ඉල්ලා සිටියාය. තම ත්‍යාගශීලය ගැන ආඩම්බර වනවාට වඩා, ඇයට දැනුණේ ලජ්ජාවකි. ඒ තරම් සිත් ගන්නා පෙනුමක් ඇති තැනැත්තෙකුට, දනක් හැටියට, ඒ තරම් සුළු දෙයක් දෙන්ට සිදුවීම ගැන, ඇය ලජ්ජාවට පත් වූවාය.

වර්ස්ට් තුන්සියයක දුර ගෙවා පැමිණි මේ ගමනේදී, ඔහු ක්‍රිස්තුස්වහන්සේගේ නාමයෙන් සිඟමන් ඉල්ලාගෙන ඇත. කෘෂ වූ ඔහුගේ සිරුර, කටුක කාලගුණයට හසු වූ බවක් පළ කෙළේය. ඔහු හිසකෙස් කොටට කපා සිටියේය. රළු ගොවි තොප්පියක්ද පැළඳගෙන සිටි මගියා, රළු බූට්ස් සපත්තු යුවළක් පය ලාගෙන සිටියේය. ඒ සියල්ල එසේ වුවද, දොරකඩ අබියසදී ඉතා නිහතමානීව හිස පහත් කෙළේ වී නමුදු, තමා වෙත මිනිසුන් ආකර්ෂණය කරගැනීමේ හැකියාව, සර්ජියස් කෙරෙහි තවමත් පිහිටා තිබුණි. එහෙත් ඔහු හඳුනාගැනීමට ප්‍රස්කෝව්යා මිඛායිලොව්නා සමත් නොවූවාය. ඇය

ඔහු අවසන් වතාවට දුක ඇත්තේ, මීට වසර තිහකටවත් පෙර විය යුතුය. එහෙයින්, කෙසේවත් ඔහු හඳුනාගැනීමට ඇයට හැකියාවක් නොතිබිණි.

''සමාවෙන්ඩ පියතුමනි, බාගෙවිට ඔබ බඩගින්නෙ වෙන්ඩ ඇති.''

ඔහු පාන් සහ මුදල් අතට ගත්තේය. මේ අමුත්තා තමා දෙස බලාගත්වනම, එතැන සිටගෙන සිටිනු දුටු ප්‍රස්කෝව්යා මිඛායිලොව්නා, ඔහු පිටත්ව නොයන්නේ මන්දැයි සිතන්ට වූවාය.

''පශෙන්කා, මම ඇවිත් ඉන්නෙ නුඹ ළඟටයි. මාව එළවා දමන්ඩ එපා.''

ඇයගේ දෑස දෙස ආයාචනාත්මකව බලා සිටි ඔහුගේ දීප්තිමත් කළු දෑසෙහි කඳුළු පිරී තිබුණි. සුදු පැහැ ගැන්වෙමින් පැවති ඔහුගේ උඩු රැවුළ යටින්, ඔහුගේ තොල් සඟල අනුකම්පාසහගත ලෙස වෙව්ලනු පෙනිණි.

ප්‍රස්කෝව්යා මිඛායිලොව්නාගේ තොල් පෙති ඇරුණි. ඇගේ අත මලානික ළය මතට එසවිණි. ඇගේ දෑස වන්දනාකාරයාගේ මුහුණ සෝදිසි කරන්ට වන්නේය.

''වෙන්ඩ බෑ. ස්තෙෆාන්! සර්ජියස්! සර්ජියස් පියතුමා! ''

''ඔව්,'' සර්ජියස් පිළිතුරු දුන්නේ පහත් හඬිනි. ''හැබැයි - සර්ජියස් නෙමෙයි. සර්ජියස් පියතුමාත් නෙමෙයි. ස්තෙෆාන් කසාත්ස්කි කියන කාලකණ්ණි පව්කාරයා. අනාථ වුණු කාලකණ්ණි පව්කාරයා. මාව එළවගන්ඩ එපා.''

''ඒක වෙන්ඩ බෑ! වෙලා තියෙන දේක හැටි! ආහ්, ඇතුළට එන්ඩ. ඇතුළට එන්ඩ.''

ඇය අත දිගු කළාය. එහෙත් ඔහු ඇයගේ අත ගත්තේ නැත. ඔහු ඇය පිටුපසින් ගෙතුළට ඇතුළු වූයේය.

එහෙත් ඔහු ඉන්දවන්නේ කොහිද? ඔවුන්ට තිබුණේ ඉතා සුළු ඉඩ ප්‍රමාණයකි. එහි වූයේ, එකම පුංචි කාමරයක් පමණි. එද,

පුංචි කුටියකි. මුලින් ඇය සිටියේ එහි වුවද, දැන් ඒ කාමරය මාෂාට දී ඇත්තේය. මේ දැනුත්, දරු පැටියා නිදි කරවමින් මාෂා හිඳින්නී එහිය.

''ටිකකට මෙතන ඉඳගන්ඩ,'' යයි පැවසූ ප්‍රස්කෝවියා මිඛායිලොව්නා, කුස්සියේ වූ බංකුවක් පෙන්නුවාය.

සැණෙකින් එහි හිඳගත් සර්ජියස්, සුපුරුදු පරිදි පළමුව එක උරපත්තකින්ද, අනතුරුව අනෙකෙන්ද පටි දෙක රූරා වැටෙන්ට හැර, පිට මත වූ පොදිය ගලවා දැමීය.

''අනේ දෙවියනේ, අනේ දෙවියනේ, ඔබටත් මේ වගේ අවමානයකට පත් වෙන්ඩ වුණු හැටි. ඒ තරම් මහ විසාල තේජසක් තිබිලත්. මෙහෙම වුණු හැටි..... ගහෙන් ගෙඩිය එන්නා වාගෙ. මෙහෙම වුණු හැටි......''

සර්ජියස් උත්තර දුන්නේ නැත. සිය පොදිය බංකුව මත තබන අතර, ඔහු මෘදු සිනාවක් පෑවා පමණි.

තමන්ගේ අමුත්තා කවරකුදැයි ප්‍රස්කෝවියා මිඛායිලොව්නා සිය දියණියගේ කනට කොඳුරා කීවාය. දෙදෙනාම එකතුව, මාෂාගේ ඇඳ ඇතිරිලි ඉවත් කළ ඔවුහු, සර්ජියස්ට කාමරය හිස් කර දෙනු සඳහා තොටිල්ල පිටින්ම දරුවාද පිටතට ගෙන ගියහ.

ප්‍රස්කෝවියා මිඛායිලොව්නා විසින් සර්ජියස් කාමරයට කැඳවාගෙන යනු ලැබීය.

''ඔබට මෙතන විවේක ගන්ඩ පුළුවනි. මට කණගාටු ඒක හොඳටම කුඩා වීම ගැන. දැන් මම යන්ඩ ඕනෑ.''

''කොහාටද?''

''මේ, මං කියාදෙන පාඩම්වලට. මට ඔබට කියන්ඩත් ලැජ්ජයි. මම සංගීතය උගන්නනවා.''

''සංගීතය? ඒක හරිම කදිමයි. ඔබට පේනවනෙ ප්‍රස්කෝවියා මිඛායිලොව්නා, මම ඔබ සොයාගෙන මෙහාට ආවෙ බරපතළ කාරණයකට. මට ඉඩ ලැබුණු වෙලාවට, මම ඒක කියන්නම්කො.''

''මට ඒක ලොකු සතුටක්. මේ හැන්දෑවෙ හොඳයිද?''

''ඔව්, හොඳටම හොඳයි. තව එක දෙයක් - කාටවත් එහෙම කියන්ඩ එපා - මම කවුද කියල. මට විශ්වාස කරන්ඩ පුළුවන් ඔබ විතරයි. මම ගියේ කොහෙද කියල, කවුරුවත්ම දන්නෙ නෑ. මා ගැන කියන්ඩ එපා. ඒක හරිම අවශ්‍යයි.''

''ඕ! මම දුවට කිව්වනෙ!''

''ඉතින් වෙන කාටවත් කියන්ඩ එපා කියල, එයාට කියන්ඩ.''

සපත්තු ගලවා දැමූ සර්ජියස්, ඇඳෙහි දිගා වුණේය. සැණෙකින් ඔහුට නින්ද ගියේය. ඔහු මුළු රැයක්ම නිදිවරා තිබුණි. වර්ට්ස් හතළිහක්ම පයින් ඇවිත් තිබුණි.

* * * *

ප්‍රස්කෝව්යා මිඛායිලොව්නා ආපසු එන විට, සර්ජියස් අවදිව ඇය එන තුරු ඒ පුංචි කාමරයේ බලා සිටියේය. රාත්‍රි ආහාර සඳහා ඔහු කාමරයෙන් එළියට නොපැමිණි අතර, ලුකරියා විසින් ගෙනෙන ලද සුප් සහ තලප ටිකක් ආහාරයට ගෙන තිබුණි.

''ඔබ පොරොන්දු වුණාට කලින් ඇවිදින්,'' සර්ජියස් කීය. ''ඒ කොහොමද? දැන් අපේ කතාව පටන්ගන්ඩ පුළුවනිද?''

''ඒ වාගෙ සන්තෝසයක් මට ලැබෙනවා කියන්නෙ, ලොකු දෙයක්. ඒ වාගෙ අමුත්තකුගෙන්. එහෙම ගෞරවයක් ලබන්ට මං කරල තියෙන්නෙ මොකක්ද? ඔව් ඉතින්, මම එක පන්තියක් අත ඇරල දැම්ම. ඒක පස්සෙ කරන්ඩ පුළුවනි....... මම බලාපොරොත්තුවෙන් හිටියෙත්, සැලසුම් කරමින් හිටියෙත්, ඔබ හමු වන්ට එන්ඩයි. මම ඔබට ලියුමකුත් ලිව්වා. ඉතින් දැන් - මේ බලාපොරොත්තු නූන සතුට!''

''පශෙන්කා! මම ඔබට දැන් කියන්ඩ යන දේට, මගෙ මරණ මොහොතෙදි දෙවියන්ට කරන ශුද්ධ පාපෝච්චාරණයකට වාගෙ, සවන් දෙන්ඩ. පශෙන්කා, මම ශුද්ධ වූ මිනිහෙක් නෙමෙයි. සරල සාමාන්‍ය මිනිහෙක්වත් නෙමෙයි. මම පව්කාරයෙක්. අධම දුෂ්ඨ අන්ධකාරයෙන් පීඩිත, සැක බිය නැති පව්කාරයෙක්. ඇතැම් විට,

සාමාන්‍ය මිනිසුන්ටත් වඩා මම නරකයි. ඒක හරියටම කියන්ඩ බෑ. මම නරකම මිනිහාටත් වඩා නරක මිනිහෙක්.''

මුලදීම, පශෙන්කා දෑස විදහාගෙන ඔහු දෙස බලා සිටියාය. ඔහු කියන දේ ඇය විශ්වාස කරන්නේ කෙසේද? ඔහු කියන දේ සැබෑවටම විශ්වාස කරන්ඩ පටන්ගත් පසුව, සියතින් ඔහුගේ අත අල්ලාගත් ඇය, වේදනාභරිතව සිනාසෙමින් මෙසේ කීවාය:

''බාගෙවිට, ඔබ කතා කරන්නෙ අතිශයෝක්තියෙන් වෙන්ඩැති, ස්තෙෆාන්.''

''නෑ, පශෙන්කා. මම ස්ත්‍රී දූෂකයෙක්. මිනීමරුවෙක්. දෙවියන්ට අවමන් කරන්නෙක්. වංචනිකයෙක්.''

''අනේ ස්වාමිදරුවනේ, කොහොමද එහෙම වෙන්නෙ?'' ප්‍රස්කෝවියා මිඛායිලොව්නා කොඳුරා කීවාය.

''නමුත් ජීවිතය ජීවත් කරවන්ඩ ඕනෑ. ඉතින් මම - දැනගත යුතු සියල්ල දැනගෙන හිටියාය කියා, අනිත් අය කල්පනා කළ මම - තමන්ගෙ ජීවිතය හොඳට ගත කරන්නැයි අනුන්ට උපදෙස් දුන්නු මම - කිසිම දෙයක් දන්නෙ නෑ. මං ආවෙ ඔබෙන් ඉගෙනගන්ඩ.''

''ඔබ මොනවද මේ කියන්නෙ, ස්තෙෆාන්? ඔබ මාව විහිළුවට ලක් කරනවා. ඇයි, මිනිස්සු හැම වෙලාවෙම මාව විහිළුවට ගන්නෙ?''

''හොඳයි, මං කරන්නෙ විහිළුවක් කියල කියන්ඩකො, ඔබ කැමති නම්. නමුත් මට, මේක විතරක් කියන්ඩ. ඔබ මෙතුවක් කල් ඔබේ ජීවිතය ගත කරල තියෙන්නෙ කොහොමද?''

''මම? ඇයි, මං ජීවිතේ ගත කරල තියෙන්නෙ නරකම ආකාරයට. නීච ආකාරයට. දැන් ඉතින් දෙවියන්වහන්සෙ මට දඬුවම් කරනවා. ඒකත් හරි. ජීවිතේ ඒ තරම්ම නරකයි. හොඳටෝම නරකයි.''

''ඔබේ විවාහෙ සිද්ද වුණේ කොහොමද? කසාද බැඳල ඔබ ජීවත් වුණේ කොයි ආකාරෙටද?''

''ඒක හොඳටම නරකයි. හොඳටෝම නරකයි. මම ප්‍රේම කරන්ඩ වුණා. නපුරුම විදියට. තාත්තා ඒකට විරුද්ධ වුණා. නමුත් මම කිසිම දේකට ඇහුම්කන් දුන්නෙ නෑ. ඉතින් අපි කසාද බැන්දා. කසාද බැන්දට පස්සෙ, මම ස්වාමිපුරුෂයාට උදව් කරනවා වෙනුවට, මම එයාට වද දෙන්ඩ පටන්ගත්තා. වේදනා දෙන්ට පටන්ගත්තා. මගේ ඊර්සියාව නිසා. ඒ ඊර්සියාව මට පාලනය කරගන්ඩම බැරි වුණා.''

''මට දැනගන්ඩ ලැබුණෙ, එයා බිව්ව කියලා.''

''ඔව්. නමුත් මම. එයාගෙ හැඟීම් වටහාගන්ඩ මම ඉගෙනගත්තෙ නෑ, මම දිගටම එයාට අවලාද කියන්ඩ වුණා. අන්තිමට ගියාම, ඒක රෝගයක්. ඒත්, එයාටත් කරන්ඩ දෙයක් තිබුණෙ නෑ. අප අතර මහ බයානක ආකාරයට අඬදබර ඇති වුණා.''

කසාත්ස්කි දෙසට හැරවී තිබුණු ඇගේ ලස්සන ඇස්, ස්මරණයේ වේදනාවෙන් අඳුරු වන්නට විය.

පශෙන්කාගේ සැමියා ඇයට තැලූ බැව්, කසාත්ස්කිට අසන්ට ලැබී තිබුණි. දැන් ඔහුට එය සිහිපත් වෙයි. දැන් ඇයගේ කෘශ ශරීරයත්, ගෙලත්, ඇගේ දෙකන් පිටුපස මස් ගොබයත්, මඳක් දුඹුරු මඳක් අළු පැහැ තුනී වුණු හිසකේ බැදි කොණ්ඩ ගැටයත් තුළින්, ඒ සියල්ල ඔහු ඉදිරියේ මැවී පෙනුණි.

''ඊට පස්සෙ, ළමයි දෙන්නත් එක්ක, මම තනි වුණා. ජීවත් වෙන්ඩ කිසිම හව්හරණයක් ඉතිරි වෙලා තිබුණෙ නෑ.''

''නමුත් ඔබට ඉඩකඩම් තිබුණනෙ.''

''අපි ඒව වික්කෙ, වස්යා ජීවත් වෙලා ඉන්නැද්දීමයි....... ඒ සල්ලි සේරම දිය වෙලා ගියා. ඉතින් අපට කොහොම කොහොම හරි, ජීවත් වෙන්ඩ සිද්ද වුණා. ජීවිකාව ගැට ගහගන්ඩ කියල, කරන්ඩ කිසිම දෙයක් මම දැනගෙන හිටියෙ නෑ. ඉහළ පැලැන්තියෙ අයගෙ දූල හැමෝම වාගෙ, මාත් දැනගෙන හිටියෙ නෑ. හැබැයි, මගේ තත්වෙ වැඩියත්ම නරක් වුණා. ඉතිරි වෙලා තිබුණු දේවලින් අපි කොහොම හරි ජීවිතේ ගැට ගහගත්ත. මම ළමයි ඉස්කෝලෙ

යැව්ව. මාත් ටිකක් ඉගෙනගත්ත. මිත්‍යා අසනීප වෙන කොට හිටියෙ, ඉස්කෝලෙ හතරවෙනි අවුරුද්දෙ. දෙවියන්වහන්සේ අපෙන් එයාව ගත්ත. මාෂා, වාන්‍යා එක්ක ආදරේක පැටලුණා. වාන්‍යා - ඒ මගෙ බෑනා - එයා හොඳ කෙනෙක් තමයි. නමුත් අවාසනාවන්තයි. එයාට සනීපයක් නෑ.''

''අම්මෙ,'' දුවගේ කටහඬ නැගී ආවේය. ''පොඩි එකාව ගන්ඩ. මට මේ සේරම කරන්ඩ බෑ.''

ප්‍රස්කෝව්යා මිඛායිලොව්නා සැණින් නැගී සිටියාය. සැණෙකින් කාමරයෙන් ඉවතට ගිය ඕ, ආපසු කාමරයට පැමිණියේ දෑ හැව්රිදි කොලු පැටියෙකු වඩාගෙනය. හිස පිටුපසට ගසමින් දඟලන්ට වූ කොලු පැටියා, ඇගේ හිසේ බැඳි රෙදි කඩෙන් අදින්ට විය.

''මම කොයි හරියෙද හිටියෙ? ආහ්, ඔව්. වන්‍යාට මෙහෙදි තනතුරක් තිබුණා. හොඳ තනතුරක්. එයාගෙ ලොක්කා හරිම හොඳ කෙනෙක්. නමුත් දිගටම රස්සාව කරගෙන යන්ඩ බැරි වුණා. එයාට ඉල්ලා අස් වෙන්ඩ වුණා.''

''ඇයි මොකද, එයාට තිබුණු කරදරේ?''

''නියුරාස්තේනියා. ඒක භයානක අසනීපයක්. අපි ඒ ගැන වෛද්‍ය උපදෙස් ලබාගත්ත. නමුත් එයාට යන්ඩ වෙනව. අපට ඉතින් වියපැහැදම් නෑ. ඒක සනීප වෙයි කියල, මම බලාපොරොත්තුවෙන් ඉන්නව. එයාට විශේෂ වේදනාවකුත් නෑ. නමුත්.....''

''ලුකරියා!'' අසනීප මිනිහාගේ දුර්වල දබරකාරී කටහඬ ඇසුණි. ''ඒකිව කොහේ හරි යවන්නෙ, හරියටම ඕනෑ වෙන වෙලාවට. අම්මෙ.....''

''එනවා,'' සිය කතාන්තරය තවත් වතාවකට නවත්වමින්, ප්‍රස්කෝව්යා මිඛායිලොව්නා කීවාය. ''එයා තවම රෑට කෑම කාලා, නෑ. අපි සේරම එක්ක ඉඳගෙන එයාට කෑම කන්ඩ බෑ.''

ඇය කාමරයෙන් එළියට ගියාය. නිවස තුළ ඇය එහාට මෙහාට වනු ඇසුණි. ඉනික්බිතිව ඇය ආපසු පැමිණියේ, ඇගේ දුඹුරුවන් සිහින් අත් දෙකේ තෙතමාත්තු කරගනිමිනි.

''හොඳයි. අපි දැන් ඉදිරියට යමු. හැම වෙලේම අඩුපාඩු කියනව. හැම වෙලේම අසන්තෝසෙන්. ඒ වුණාට දෙවියන්වහන්සේට ප්‍රශංසා වේවා! ළමයි ඔක්කෝම හොඳයි. ජීවිතේ ඇත්ත වශයෙන්ම ඉවසගෙන, විඳ දරාගෙන ඉන්න පුළුවනි. ආහ්, නමුත් මං ගැන කතා කරන්නෙ මොකටද?''

''ඔයා ජීවත් වන්නෙ මොනව කරලද?''

''ඇයි, මම ටිකක් උපයනව. සංගීතය, හැමදාම මට නීරස දෙයක් වෙලයි තිබුණෙ. නමුත් දැන් ඒකෙන් මට යහපතක් වෙනවා."

පසෙකින් වූ ලාච්චු රාක්කය මත ඇය සිය අත රැඳවූවාය. පුංචි සිහින් අතක්. කිසියම් වාද්‍ය අභ්‍යාසයක් කරන්නාක් මෙන්, ඇය සිය ඇඟිලි ගමන් කරවන්නට වූවාය.

"ඔය පාඩම්වලට ඔබට කීයක් ගෙවනවද?"

"රූබල් එකක්, නැතිනම් කොපෙක් පනහක්. සමහරු ගෙවන්නෙ තිහයි. ඒ හැමදෙනාම, මට බොහොම කරුණාවයි."

"හොඳයි, ඒ ගොල්ලො ප්‍රගතියක් පෙන්නනවද?" තම දෑසේ ගැඹුර තුළින් සිනාවක ඡායාවක් පාමින්, කසාත්ස්කි ඇසුවේය.

ඔහු මේ සියල්ල විමසන්නේ සැබෑම වුවමනාවකින්දැයි, මුලදී ප්‍රස්කෝව්යා මිඛායිලොව්නා විශ්වාස නොකළාය. ඇය ඔහුගේ දෑස කෙරෙහි ප්‍රශ්නාර්ථ බැල්මක් හෙළුවාය.

"ඔව්. ඒ ළමයි හොඳට ඉගෙනගන්නවා. අපූරු පුංචි දැරියක් ඉන්නවා. මස් වෙළෙන්දෙකුගෙ දුවක්. කරුණාවන්ත හොඳ දැරිවියක්. ඇත්ත වශයෙන්ම, මා යම්කිසි දෙයකට දක්ෂ වෙලා හිටිය නම්, තාත්තගෙ සම්බන්ධකම් පාවිච්චි කරලා, වන්යාට මොකක් හරි රස්සාවක් හොයල දෙන්ඩ තිබුණා. නමුත් මං කිසි කමකට නෑ. ඒ සියලුදෙනාම මේ අඩියට වැටිලා තියෙන්නෙ, මං නිසයි."

"ඉතින්, ඉතින්," හිස පාත් කරමින් කසාත්ස්කි මිමිණීය. "හොඳයි, පල්ලියේ කටයුතුවලදී පශෙන්කා, ඔයත් යම්කිසි කාර්යභාරයක් ඉටු කරනවද?"

"අපොයි, ඒ ගැන කතා නොකළ තරමට හොඳයි. ඒක හොඳටම නරකයි. ඒ කටයුත්ත මා අතින් අතපසු වෙනවා. අපි කොරෝස්ම කාලෙදි උපවාස කරනවා. කරලා, අපි පල්ලි යනවා. නමුත් මා නම් මාස ගණනකට පල්ලි යන්නෙ නෑ. මම ළමයින්ව අරිනවා."

"ඇයි ඉතින්, ඔබ යන්නෙ නැත්තෙ?"

"ඇත්තම කියනව නම්," ඇගේ මුහුණ රතු විණි. "මේ වැරහැලි ඇඳුම් ඇඳගෙන ගිහිල්ල, මගෙ දුවටයි, එයාගෙ ළමයින්ටයි ලැජ්ජ කරන්ඩ මං කැමති නෑ. අලුතින් කියන්ඩ කියල, තව යමක් මට ඇත්තෙ නෑ. මං හිතන්නෙ, මං අලසයි කියලා."

"එතකොට ඔයා ගෙදරදිවත් යාච්ඤා කරනවද?"

"ඔව්. නමුත් ඒක නියම යාච්ඤාවක් නෙමෙයි. ඒක යාන්ත්‍රිකයි. ඒක නෙමෙයි, පිළිවෙල. මම ඒක දන්නවා. ඇත්ත වශයෙන්ම, මා තුළ සැබෑ හැඟීමක් නැහැ. ඒකෙන් වෙන්නෙ, මගේම දුෂ්ටකම මා අවබෝධ කරගැනීම පමණයි........"

"ඉතින්, ඉතින්, මට පේනවා," අනුමත කරන්නාක් මෙන් කසාත්ස්කි පිළිවදන් දුන්නේය.

බෑනා නැවත වරක් කතා කෙළේය.

"එනවා, එනවා," යයි පිළිතුරු දුන් ඇය, හිස්වැසුම්කඩද හරිගස්සාගෙන නැවත වරක් කාමරයෙන් එළියට ගියාය.

මෙවර ඇය වැඩි වේලාවක් රැඳී සිටියාය. ආපසු පැමිණි විට ඇය දුටුවේ, කසාත්ස්කි හුන් තැනම ඒ ඉරියව්වෙන්ම සිටි බවකි. ඔහු වැලමිට දෙදණ මත රුවාගෙනම, ඉදිරියට හිස පාත් කෙළේය. එහෙත් ඒ වන විට, ඔහු තම පොදිය පිටෙහි එල්ලාගෙන සිටියේය.

කුඩා බෙලෙක් ලාම්පුවක්ද අතැතිව ඇය කාමරයට ඇතුළු වුණු පසුව, වෙහෙස පත් සිය දෑස ඔසොවා ඇගේ දෑසට යොමු කළ ඔහු, ඉතාම ගැඹුරු සුසුමක් හෙළුවේය.

"ඔබ කවුද කියලා, මම ඒ ගොල්ලන්ට කිව්වෙ නෑ"යි ඈ යටහත් පහත් ලෙස කීවාය. "මං කිව්වෙ, රදල පැලැන්තියට අයිති වන්දනාකාරයෙක් කියලා. එක වතාවක් මං දැනගෙන හිටිය කෙනෙක් කියලා. ඔයා තේ බොන්ඩ, කෑම කාමරයට එන්නෙ නැද්ද?"

"නෑ."

"එහෙනම් මම තේ එකක් ගේන්නම්."

"එපා. අවශ්‍යතාවක් නෑ. දෙවියන්වහන්සෙ ඔබ ආරක්ෂා කරන සේක්වා, පශෙන්කා! දැන් මම යන්ඩ ඕනැ. ඔබ තුළ මා ගැන හැඟීමක් තියෙනවා නම්, මාව දැක්කා කියලා කාටවත්ම කියන්ඩ එපා. ජීවමාන දෙවියන්වහන්සෙ නාමයෙන් මම ඔබෙන් ඉල්ලා සිටින්නෙ, ඒ ගැන කිසිම කෙනෙකුට කියන්ඩ එපා කියල. ඉතින් බොහොම ස්තුතියි. මම ඔබ ඉදිරියේ පොළව මත වැඳ වැටෙන්ඩ කැමතියි. නමුත්, ඒක ඔබට අපහසුවක්. මම ඒක දන්නවා. බොහොම ස්තුතියි. ක්‍රිස්තුස්වහන්සේගෙ නාමයෙන් මට සමා වෙන්ඩ."

"මට ඔබේ ආශිර්වාදය දෙන්ඩ."

"දෙවියන්වහන්සෙ ඔබට ආශිර්වාද කරනවා ඇති. ක්‍රිස්තුස් නාමයෙන් මට සමා වෙන්ඩ."

ඔහු පිටත්ව යා යුතුව තිබුණි. එහෙත් ඕ, ඔහු නවතාගත්තීය. ඇය පාන්ද විස්කෝතුද බටර්ද ගෙනැවිත්, ඔහුට දුන්නාය. ඔහු ඒවා අතට ගෙන පිටත්ව ගියේය.

රෑ බෝ වී අඳුර වැටී තිබුණි. ඔහු ගෙවල් දෙකක් පසු කළායින් පසුව, ඇයට ඔහු නොපෙනී ගියේය. ඒ ඉසව්වේදී පාදිලිතුමාගේ බල්ලා ඔහුට බුරනුද, ඇයට ඇසුණි.

* * * *

"එහෙනම් ඒක තමයි, මගෙ හීනෙ තේරුම. පශෙන්කා ඉන්නේ, මා සිටිය යුතු තැනය. මා නොඉන්නේද, එතැනය. මම දෙවියන්වහන්සේ වෙනුවෙන් ජීවත් වෙන බව අඟවාගෙන, මිනිසුන් වෙනුවෙන් ජීවත් වුණා. ඇය තමා ජීවත් වෙන්නෙ මිනිසුන්

වෙනුවෙන්ය කියා හිතාගෙන, දෙවියන්වහන්සේ වෙනුවෙන් ජීවත් වෙනවා. ඔව්, පෙරළා කිසිම දෙයක් බලාපොරොත්තු වන්නේ නැතිව, එකම හොඳ ක්‍රියාවක් - එක වතුර කෝප්පයක් - මා මිනිසුන්ගේ අනුමැතිය පතා කළ හැමදේකටම වඩා වටිනවා. නමුත් -" ඔහු තමාගෙන්ම විමසීය. "නමුත්, දෙවියන්ට සේවය කිරීමේ ආශාවෙන් බිඳක්වත් ඉතිරිව නැත්තේද?" ඔහු එයට පිළිතුරු දිය යුතුය. "ඔව්, නමුත් ඒ සියල්ල කිලිටි වෙලා. මිනිසුන් අතර කීර්තිය - යසස - පතා කටයුතු කිරීම නිසා, ඒක වැහිල ගිහිල්ලා. මිනිසුන් අතර කීර්තිය උදෙසා ජීවත් වූ මා වැන්නකු ළඟ, දෙවියන්වහන්සේ නෑ. උන්වහන්සේ හොයාගෙන මං යන්ඩ ඕනෑ."

ඔහු යන්ට ගියේය. පශෙන්කා වෙත පැමිණි අයුරින්ම, ගමින් ගමට ඇවිදිමින්, සෙසු වන්දනාකාරයන්, මිනිසුන් හා ගැහැනුන් හා එක් වෙමින්ද, වරින් වර ඔවුන්ගෙන් වෙන් වෙමින්ද, ක්‍රිස්තුස් නාමයෙන් අහර සහ ලැඟුම් ඉල්ලාගෙන, ඔහු ගමන් කරන්ට වන්නේය. ඇතැම් විට, කේන්ති යන ගෙහිමි කාන්තාවක් ඔහුට බැණවැදුණාය. තමා වැනිම ඇඳුම් ඇඳගෙන සිටින ගොවියෙක්, ඔහුට දෝෂාරෝපණය කෙළේය. ඒ, ඉතා කලාතුරකිනි. නිතරෝම කවරකු හෝ ඔහුට ආහාර පාන දුන්නේය. ඇතැම් විට, මග වියදම්ද දුන්නේය. වංසවත් ප්‍රවේණිය පළ කළ ඔහුගේ පෙනුමට, ඇතැම් අය වඩාත් ප්‍රිය කළහ. තවත් රදලයකු හිඟමනට වැටී සිටීම ගැන, තවත් අය සතුට පළ කළහ. එහෙත් ඔහුගේ සෞම්‍ය පිළිවෙල, ඔහු මුණ ගැහුණු කාගේත් සිත්ගත්තේය.

ඇතැම් නිවසකදී සුභාරංචියේ පොතක් සොයාගෙන, ඔහු එය හඬ නඟා කියවීය. හැම වෙලාවේදීම, හැම තැනකදීම, මිනිස්සු ඊට සවන් දුන්හ. තමන්ට කොතරම් සුපුරුදු මුත්, අලුත් දෙයකට සවන් දෙන විලාසයෙන්, ඔවුහු මවිතයටද මෝහනයටද පත්ව සවන් දුන්හ.

මිනිසුන්ට අවවාද දෙන්ට, නූගත් අයගේ ලියුම් කියුම් ලියා දෙන්ට, රණ්ඩු සරුවල් කරන අය සමාදාන කරවන්ට ලැබුණු හැම අවස්ථාවකදීම, ඔහු එසේ කෙළේය. එහෙත් ඔවුන් සිය කෘතඥතාව පළ කරන්ට පෙරම, ඔහු පිටව ගියේය. ඔහු බිඳෙන් බිඳ, තමන්ගේ දෙවියන් සොයා යන්නට වන්නේය.

එක් දිනෙක ඔහු, මහලු ගැහැනු දෙදෙනෙකුගේ සහ සේවාමුක්ත භටයෙකුගේ සමාගමයෙහි, මහ මග ගමන් කරමින් සිටියේය. කුලවතුන් කිහිපදෙනකු විසින් ඔවුහු නවත්වනු ලැබූහ. එක් වංසවතකු සහ කුලවතියක් සිටියේ, අශ්ව නාම්බකු බඳින ලද රේස් කරත්තයකය. තවත් වංසවතෙක් සහ තවත් කුලවතියක් අශ්වයකු පිට නැඟී සිටියහ. අසු පිට සිටින දෙදෙනා, රේස් කරත්තයේ නැඟුණු කුලවතියගේ සැමියාත් දුවත් වූහ. රේස් කරත්තයේ සිටි අනෙකා ප්‍රංස ජාතික අමුත්තකු විය යුතුය.

ඔවුන් නැවතී ඇත්තේ, ඒ අමුත්තාට වන්දනාකරුවන්* පෙන්වන්ටය; රුසියානු ජනතාව අතර පවත්නා කිසියම් අන්ධ විශ්වාසයකට අනුව, වැඩ කරනු වෙනුවට, තැනින් තැන ඇවිදිමින් සිටින වන්දනාකරුවන් අමුත්තාට පෙන්වා දෙන්ටය.

වන්දනාකරුවන්ට තමන් තේරුම්ගන්ට නොහැකි වෙතැයි සිතූ ඔවුන්, කතා කෙළේ ප්‍රංස බසිනි.

"ඔවුන්ගේ වන්දනාවෙන් දෙවියන්වහන්සේ සතුටට පත් වෙනවාද කියලා අහන්ඩ."**

ප්‍රශ්නය ඉදිරිපත් කරන ලදින්, මහලු කාන්තාව මෙසේ පිළිතුරු දුන්නාය.

"ඒක දෙවියන්වහන්සෙ සොයාගන්නවා ඇති. අපේ පාද සිද්ධස්ථානයට ගිහින් තියෙනවා. බාගෙවිට, අපේ හදවත් එහේ වෙන්ඩ පුළුවනි."

සොල්දාදුවාගෙන්ද ඒ ප්‍රශ්නයම අසන ලදී. ඔහු පැවසුවේ, තමා මේ ලෝකයේ තනිව සිටින බවත්, තමාට ලැගුම් ගන්ට තැනක් නැති බවත්ය.

අනතුරුව ඔවුන් කසාත්ස්කිගෙන් ඇසුවේ, ඔහු කවරකුද කියාය.

---

* les pelerins

** "S'ils sont bein surs de ce que leur pelerinage est agreable a dieu."

"දෙවියන්වහන්සේගෙ සේවකයෙක්."

"එයා කියන්නෙ මොකක්ද? එයා උත්තර දෙන්නෙ නෑ."***

"එයා කියනවා, එයා දෙවියන්ගෙ සේවකයෙක්ය කියලා."****

"පූජකයකුගෙ පුතෙක් වෙන්ඩ ඇති. එයා හොඳ පෙළපතක කෙනෙක් බව පේනවා. ඔබ ළඟ මාරු කාසි තියෙනවද?"*****

ප්‍රංස මිනිහාගේ කමිස සාක්කුවේ රිදී කාසි කිහිපයක් විය. ඔහු එකිනෙක වන්දනාකාරයාට, කොපෙක් විස්ස බැගින් දුන්නේය.

"ඒ ගොල්ලන්ට කියන්ඩ, මේ සල්ලි, ඉටිපන්දම් ගන්ඩ නෙමෙයි කියලා. ඒ සල්ලි දුන්නෙ, තේ ටිකක් බොන්ඩය කියලා."******

"සීයෙ, මේක ඔහේට."******* එසේ පැවසූ ප්‍රංස මිනිහා, අත්වැසුම් පැළඳ තිබුණු සියතින් කසාත්ස්කිගේ උරහිසට තට්ටු කෙළේය.

"ක්‍රිස්තුස්වහන්සේ ඔබ රකිත්වා!" හිස්වැසුම ගලවා අතට ගෙන, තට්ටය පෑදුණු හිස පහත් කරමින්, කසාත්ස්කි පිළිවදන් දුන්නේය.

මේ හමුව කසාත්ස්කිට විශේෂ සංතෘප්තියක් ගෙන දුන්නේය. මෙරමා තමා ගැන සිතන දේ නොසැලකීමත්, ඉතාම පුංචි සරල පහසු දේවල් ඉෂ්ට කිරීමත්, කොපෙක් විස්ස නිහතමානීව පිළිගැනීමත්, එය අන්ධ වූ තවත් සගයෙකුට පිරිනැමීමත් - යන මේ කාරණා සියල්ලෙන්ම, ඔහු සතුටට පත් විය. මිනිසුනගේ මතය ගැන නොතකන පමණටම, දෙවියන් ගැන වඩ වඩාත් ප්‍රබල ලෙස හඟින්නට හැකි වෙතැයි, ඔහුට සිතුණි.

---

*** "Qu'est ce qu'il dit? Il ne repond pas."

**** "Il dit qu'il est un serviteur de dieu."

***** "Cela doit etre un fila de pretre. Il a de la race. Avez vous de la petite monnaie?"

****** "Mais dites leur que ce n'est pas pour des cierges que je leur donne, mais.

******* Pour vous, mon vieux.

එපරිදි මාස අටක් ගෙවී ගියේය. නවවැනි මාසයේදී, ගුබර්නියා මධ්‍යස්ථානය පසු කරමින් ගමන් කරද්දී, සෙසු ගමන් සගයින්ද සමඟ ලැගුම්ගත් තැනකදී, ඔහු ප්‍රශ්න කිරීමට භාජනය වූයේය. අනන්‍යතා කඩදාසියක් ඉදිරිපත් කරන්නට අසමත් වූයෙන්, තවදුරටත් පරික්ෂා කරනු සඳහා, ඔහු පොලිස් භාරයට ගැනිණි.

ඔහුගේ නමද, අවසර පත්‍රයට වුණේ කිමෙක්ද යන වගද, විමසන ලදී. තමාට ඉදිරිපත් කරන්නට අනන්‍යතා පත්‍රයක් නැතැයි පිළිතුරු දුන් ඔහු, තමා දෙවියන්වහන්සේගේ සේවකයෙකැයි කියා සිටියේය. පාදඩයකු හැටියට ඔහුට චෝදනා නගා, වරදකරු බවට තීරණය කරන ලදුව, කසාත්ස්කි සයිබීරියාවට පිටුවහල් කරන ලද්දේය.

සයිබීරියාවේදී පොහොසත් ගොවියකුගේ ගොවිපළක පදිංචි වූ ඔහු, මේ දක්වා එහි ජීවත් වන්නේය. ගමේ දරුවන්ට උගන්වමින්ද, ලෙඩුන්ට සාත්තු සප්පායම් කරමින්ද, ඔහු මේ ගොවියාගේ වත්තෙහි වැඩ කරමින් සිටින්නේ, ඉමහත් සංතෘප්තියෙනි.

* * *

**"සර්ජියස් පියතුමා ආරම්භ කොට, ඒ ගැන බෙහෙවින් කල්පනා කෙළෙමි. මුළු කතාවේම අවධානය කේන්ද්‍රගත වන්නේ, ඔහුගේ මනෝවිද්‍යාත්මක වර්ධනයටය; සිය ජීවිතයේ ඔහු පසු කරන අවධීන්ටය."**

(තොල්ස්තෝයිගේ දින පොතේ 1890 ජූනි 06 දින සටහන)

**"රාගය ජයගැනීමට කරන ලද අරගලය එක සිදුවීමක්, නැතිනම්, එක අවධියක් පමණි. ප්‍රධාන අරගලය, අනෙක් පාපයකට - මිනිසුන් අතර වන කීර්තිය පිළිබඳ තෘෂ්ණාවට - විරුද්ධවය."**

(තොල්ස්තෝයි 1891 පෙබරවාරි 16 වැනි දින, චර්ට්කෝව් වෙත යැවූ ලියුමෙනි.)

# විරාග සංග්‍රාම

පරිවර්තනය
**ඩබ්ලියු. ඒ. අබේසිංහ**

රුසියානු ජාතික මහා ලේඛක ලියෝ තොල්ස්තෝයි විසින් විරචිත කෙටි නවකතා කිහිපය අතරින්, වඩාත්ම ප්‍රබල නිර්මාණය හැටියට සැලකෙනුයේ, Father Sergius යන හිසින් ඉංගිරිසි බසට නැඟුණු නවකතාවය.

මෙම අපූරු කෙටි නවකතාවේ කතානායකයා වන සර්ජියස් පියතුමා ගැන සඳහන් කරමින්, මක්සිම් ගෝර්කි මෙසේ කියා සිටියේය.

"මේ මිනිහාගේ මහිමය, ඔහුගේ අධ්‍යාත්ම ශක්තිය, විස්මයජනකය. තවත් එවැනි කෙනකු නම් සිටිය නොහැක්කේය."

මහා ලේඛකයාගේ එකී කෙටි නවකතාව, ඩබ්ලියු. ඒ. අබේසිංහ විසින් අප බසට නඟා ඇත්තේ, ඔහුටම ආවේණික වූ වියත් සුගම ශෛලියෙනි.

බෙදාහැරීම: දුයිෂෙන්ගේ පොත්හල, නුගේගොඩ. 076 900 5931

රුසියාව
ප්‍රකාශකයෝ

මිල රු. 680.00
Layout, Cover Design | PRAMUDITHA GRAPHICS
Print | NEO GRAPHICS

9 786245 578436